# නාට්‍ය හා රංග කලාව

## ගුරු මාර්ගෝපදේශය

## 9 ශ්‍රේණිය

(2018 සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
info@ni.lk

**නාට්‍ය හා රංග කලාව**

**9 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2018**

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

*මුද්‍රණය* : ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද, සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව, ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## පටුන


| | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය | **iii** |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය | **iv** |
| විෂයමාලා කමිටුව | **vi** |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | **vii** |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | **viii-xiv** |
| ක්‍රියාකාරකම් වාරවලට බෙදා දැක්වීම | **xxi** |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-104 |

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | **ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය**<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | : | **කේ. ජී. අජිත් රූපසේන,**<br>**ව්‍යාපෘති කණ්ඩායම් නායක - නාට්‍ය හා රංග කලාව**<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය විශේෂඥ උපදෙස්** | : | |
| **මහාචාර්ය වෝල්ටර් මාරසිංහ** | - | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (විශ්‍රාමික) |
| **මහාචාර්ය රෝලන්ඩ් අබේපාල** | - | කොළඹ විශ්ව විද්‍යාලය |
| **මහාචාර්ය එස්. මෞනගුරු** | - | මඩකළපුව විශ්ව විද්‍යාලය |
| **මහාචාර්ය මංගලිකා ජයතුංග** | - | කැලණිය විශ්ව විද්‍යාලය (විශ්‍රාමික) |
| **ලේඛක මණ්ඩලය** | | |
| **අභ්‍යන්තර** | : | |
| **කේ. ජී. අජිත් රූපසේන** | - | **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **බාහිර** | : | |
| **එම්.ජේ. ක්ලයිව් ශාන්ත** | - | ගුරු සේවය, ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල |
| **රණසිංහ අධිකාරි** | - | ගුරු සේවය - මහින්ද විද්‍යාලය, ගාල්ල |
| **සෙනෙවිරත්න රුද්‍රිගෝ** | - | ගුරු උපදේශක - කොළඹ කලාපය |
| **ලලිතා ජයරත්න** | - | ගුරු උපදේශක - ඇඹිලිපිටිය කලාපය |
| **ඩී.පී. ස්වර්ණලතා** | - | ගුරු උපදේශක - ඇල්පිටිය කලාපය |
| **සමන් කස්තුරිරත්න** | - | ගුරු සේවය (විශ්‍රාමික) |
| **ජී. කරුණාවතී** | - | අධ්‍යාපන පරිපාලන සේවය<br>ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය, කොළඹ |
| **ටෙනිසන් දසනායක** | - | ගුරු සේවය - ඇල්පිටිය ආනන්ද විද්‍යාලය |
| **රසික ප්‍රසංග බණ්ඩාර** | - | විදුහල්පති සේවය<br>වලගම්බා විද්‍යාලය, කැගල්ල |
| **නයෝමි සමුද්‍රිකා ගුණසිරි** | - | ගුරු සේවය - කරුණාරත්න බෞද්ධ ම. විද්‍යාලය, රාගම |
| **භාෂා සංස්කරණය** | - | ශ්‍රීනාත් ගණේවත්ත |
| **පිටකවර නිර්මාණය** | - | රවීන්ද්‍ර තේනුවර,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සෞන්දර්ය විෂයයන් අතර නාට්‍ය හා රංග කලාව විෂයයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. නිපුණතා ගොඩනැංවීම අරමුණු කරගත් අධ්‍යාපන ක්‍රමයේ දී වඩාත් ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ ක්‍රියාකාරකම්වලින් මෙම විෂය ක්ෂේත්‍රය සකස් වී තිබීම එයට හේතුව යි. 12 ශ්‍රේණියේ නාට්‍ය හා රංග කලාව විෂය නිර්දේශය යටතේ උක්ත අරමුණ කෙරෙහි වඩාත් අවධානය යොමු කරමින් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට තිබේ.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් කොට ඇති ක්‍රියාකාරකම්වලින් දැනුම, කුශලතා හා ආවේදන ක්ෂේත්‍රයන්හි පුළුල් සංවර්ධනයක් සිදු කිරීම අපේක්ෂා කෙරේ. නාට්‍ය සිද්ධාන්ත, න්‍යායාත්මක පදනම, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංස්කෘතික හා සාමාජික පසුබිම, රසාස්වාදය හා විචාරය, නිර්මාණාත්මක චින්තනය යන ක්‍රියාකාරකම්වලින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සංගෘහිත වේ. මීට අමතර වෘත්තීය කුශලතා සංවර්ධනය අරමුණු කරගත් නව නිපුණතාවක් ඇතුළත් කිරීම මඟින් නාට්‍ය හා රංග කලාව විෂයය සමාජගත කිරීමේ මූලික පදනම සැලසුම් කොට ඇති බව ද මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

මෙහි ඇති ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කරගැනීම සඳහා මානව සම්පත් මෙන් ම භෞතික සම්පත් සම්පාදනය කරදීම අත්‍යවශ්‍ය වේ. නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ ව අතිරේක දැනුම උපයා ගැනීම සඳහා විෂයානුබද්ධ ග්‍රන්ථ පරිශීලනයට සිසුන් යොමුකිරීම ඉතා වැදගත් වන අතර ඒ සඳහා අවශ්‍ය පුස්තකාල පහසුකම් සලසා දීම කෙරෙහි ගුරු භවතාගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

එමෙන් ම ක්ෂේත්‍ර චාරිකා මඟින් සම්පත් පුද්ගලයන් හමුවීම හා පර්යේෂණාත්මක අධ්‍යයනයකට සිසුන් යොමු කිරීම ද වැදගත් වේ.''නාට්‍යය'' යනු කුමක්දැයි සැබෑ අවබෝධයක් ලබා ගැනීම සඳහා ජාතික තලයේ නාට්‍ය නැරඹීම සඳහා අවස්ථාව සලසා දීම ද ඉතා වැදගත් වේ. එමෙන් නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා රංගපීඨ භාවිත කිරීම, ක්‍රියාකාරි පන්ති කාමරයක් සැලසුම් කිරීම හා පවත්වා ගෙනයාම, නාට්‍ය තරග සංවිධානය කිරීම, රංග කලාව හා සම්බන්ධ ප්‍රදර්ශන, විවාද ආදි විවිධාංග සංවිධානය කිරීම ආදිය මඟින් නාට්‍ය විෂයය ශිෂ්‍යයාට වඩාත් සමීප කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිහරණය කිරීමේ දී අවධානයට ගත යුතු විශේෂ කරුණක් ඇත. එනම්, මෙහි අතුළත් කොට ඇති ක්‍රියාකාරකම්ඃ විශේෂයෙන් ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් කිසිදු වෙනසක් නොකර, මෙහි සඳහන් ආකාරයෙන් ම ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. සමස්ත වශයෙන් මුළු රට පුරා සෑම පාලසක ම එක ම රාමුවක් තුළ, එකම ආකාරයෙන් ක්‍රියාකාරකම් පල ගැන්වීමේ ඒකමිතික අවශ්‍යතාව මෙහිලා විශේෂයෙන් අවධාරණය කෙරේ. ඉගැනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව මෙයින් පැහැදිලි වනු ඇත.

උක්ත සියලු ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී ශිෂ්‍යයාට වඩාත් ප්‍රියජනක වන අයුරින් මෙන් ම නාට්‍ය හා රංග කලාව විෂයයට ශිෂ්‍යයා ආකර්ෂණය වන අයුරින් ද සංවිධානය කිරීම විෂය භාර ගුරු භවතාගේ වගකීම බව ද මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුත්තේ ය.

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## 1.0 හැඳින්වීම

නාට්‍ය හා රංග කලාව යනු අතිශයින් නිර්මාණශීලී වූත්, ප්‍රායෝගික වූත්, වින්දනීය වූත්, විෂය ක්ෂේත්‍රයකි. පාසල් පද්ධතියේ වර්තමානයේ ක්‍රියාත්මක වන නිපුණතා පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමය හා අනුගත විෂය නිර්දේශයක් ලෙස නාට්‍ය හා රංගකලාව විෂය නිර්දේශය හැඳින්විය හැකි ය.

මුල් කාලයේ දී අ.පො.ස. උසස් පෙළ ශ්‍රේණි සඳහා පමණක් සීමා වී තිබුණු මෙම විෂයය, 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව පසුව 10,11 ශ්‍රේණි දක්වා ද ව්‍යාප්ත විය. එය වඩාත් පුළුල් පරාසයක විකාශය වෙමින් 2007 වසරේ දී 6 වැනි ශ්‍රේණියෙන් ඇරැඹෙන විෂය නිර්දේශය, නිපුණතාපාදක අධ්‍යාපන ක්‍රමය හා මැනවින් බද්ධ වී ඇත. මෙම විෂයය ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ, නිශ්චිත නිපුණතා ළඟා කරගත හැකි ක්‍රියාකාරකම් පාදක කොටගත් විෂයයක් වන බැවින්. සමාජ ගැටලු නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනා ගෙන වින්දනාත්මක ව ග්‍රහණය කරගැනීමේ හැකියාව වර්ධනය කිරීම මෙමගින් අපේක්ෂිත ය.

නිර්මාණාත්මක හැකියාවන් හා ප්‍රායෝගික කුශලතාවන් වර්ධනය කිරීමත්, විචාරශීලී රසාස්වාදයට හුරු කිරීමත් අරමුණු කොට ගෙන ඇති මෙම විෂයය මගින් නාට්‍ය සිද්ධාන්ත, නිර්මාණාත්මක හැකියාව, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, දේශීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම, හා වින්දනීය මානව හිතවාදියකු බිහිකිරීම යන පංචවිධ නිපුණතා සාධනය කරගැනීම අපේක්ෂා කෙරේ.

ළමා මනසට ගෝචර වන විචිත්‍ර ලෝකය හා වීරක්‍රියා වැනි සංකල්ප ගොඩ නැගීමට නාට්‍ය හා රංගකලාව විෂයය යොදාගැනීම බෙහෙවින් සාර්ථක ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී ප්‍රියජනක ඉගැනුම් අත්දැකීම් සමීප කරමින්, නිර්මාණශීලී පරපුරක් ගොඩ නැගීම හා එමගින් සමස්ත පුද්ගල පෞරුෂය ගොඩ නැගීමේ කාර්යය සඳහා ද මෙම විෂයය ඉවහල් වේ. නව ලෝකයේ සංකීර්ණ වූත්, වේගවත් වූත්, වැඩ පරිසරයට අවශ්‍ය වන ශ්‍රමදායකයා ද, විචාරශීලී නිර්මාණකරුවා ද, වින්දනය හා ස්වාභිමානය/ආත්මාභිමානය පුරුදු පුහුණු කළ මානව හිතවාදියා ද ගොඩ නැගීමට අවශ්‍ය දේශීය අනන්‍යතාව හා සංස්කෘතික උරුමය, ප්‍රායෝගිකත්වය හා නිර්මාණශීලීත්වය ගැබ් වූ ක්‍රමවේදයක් නාට්‍ය හා රංගකලාව විෂයය තුළ අන්තර්ගත වේ.

සමාජ ජීවිතයේ මුහුණ දෙන ගැටලුවලට යථාර්ථවාදී හා ශුභවාදී විසඳුම් ලබාගැනීමට අවශ්‍ය පෙර සූදානම මෙමගින් ලබාදෙන අතර, වින්දනීය මානව හිතවාදියකු මෙන් ම ශ්‍රී ලාංකේය අනන්‍යතාවකින් හෙබි අභිමානවත් පුරවැසියකු ගොඩනැගීමේ අභියෝගය නාට්‍ය හා රංගකලාව විෂය භාර ගුරුභවතුන් හමුවේ පවතින භාරදූර වගකීමක් බව අවසන් වශයෙන් සඳහන් කළ යුතු ය.

## 2.0 ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා පෝෂණය කිරීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

## 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කරගනී.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කරගැනීම |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම |

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදිතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් |

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුශලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ.

**(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

**(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීකරණය

**(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII) "ඉගැනීමට ඉගැනුම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

## 4.0 නාට්‍ය හා රංග කලා විෂය අරමුණු

පරිසරයේ ඇති සියලුම වස්තූන් ඇසුරෙන් වින්දනයක් ලබා ගැනීමේ ශක්තිය ඇති එකම සත්ත්වයා, මිනිසා ය. මිනිසා හා මිනිසා අතර ඇති වන විවිධ ගැටීම් නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනාගෙන, ඒවා වින්දනාත්මක ව ග්‍රහණය කර ගැනීමේ හැකියාව ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

**නිර්මාණාත්මක ශක්ති වර්ධනය**

නාට්‍යමය සංසිද්ධි වින්දනයේ දී මෙන් ම නිර්මාණයේ දී ද ප්‍රබල අනුභූතියක් ලබාදෙයි. එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් හා මිනිස් ඇසුර මගින් ලබන අත්දැකීම් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමට හැකි අනුභූතීන් ගොඩ නගා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම මෙහි එක් අරමුණෙකි.

**ප්‍රායෝගික කුශලතා වර්ධනය**

නාට්‍යානුසාරී අභ්‍යාස මගින් නිර්මාණය වූත්, එසේ ම එදිනෙදා ජීවිතයේ කාර්යයන් සඵල කර ගැනීමට සරිලන්නා වූත්, ස්වකීය චාලක හැකියාවන් පෝෂණය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රායෝගික අවස්ථා මෙහි දී සැලසුම් කෙරේ.

**විචාර ශක්ති වර්ධනය**

සාහිත්‍යමය හා නාට්‍යමය වශයෙන් ද ජනසන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය වශයෙන් ද ඉදිරිපත් කෙරෙන සංසිද්ධි විමර්ශනාත්මක ව තර්කානුකූල ව විචාරයට ලක් කිරීමේ හැකියාව වර්ධනය කිරීම ද මෙහි මූලික අපේක්ෂාවකි.

**විෂයානුබද්ධ දේශීය හා විදේශීය අනන්‍යතාවන් හඳුනාගැනීම**

ඉගැනුම් කාර්යයේ දී මෙන් ම, ඵලදායී දෛනික ජීවිතයට වැදගත් වන ඒ ඒ විෂයානුබද්ධ දේශීය අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංස්කෘතික උරුමයන් පිළිබඳ වත්, එම දැනුම පෝෂණය කෙරෙන වෙනත් විදේශීය උරුමයන් පිළිබඳ වත් නිවැරදි චින්තනයකින් යුත් චරිතායනයක් සිසුන් තුළ ජනිත කිරීම අවශ්‍ය කරුණකි. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක විඳගැනීම මගින් සමාජයට අවශ්‍ය කරන මානව හිතවාදියකු ගොඩනැගීම ද මෙම විෂයයේ මුඛ්‍ය අරමුණක් වේ. නාට්‍ය හා රංග කලා විෂයානුබද්ධ දැනුම හා එමගින් මනා ආකල්ප ඇති කිරීම ද මෙම විෂය නිර්දේශයේ අපේක්ෂාව වන්නේ ය.

## නාට්‍ය හා රංග කලාව

### 5.0 ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව

| | ජාතික අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **නාට්‍ය හා රංග කලාව විෂයයේ අරමුණු** | **I** | **II** | **III** | **IV** | **V** | **VI** | **VII** | **VIII** |
| 1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය. | √ | √ | √ | √ | √ | | | √ |
| 2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුශලතා වර්ධනය. | | √ | | | √ | √ | √ | √ |
| 3. ඵලදායී දිවි පැවැත්මකට අවශ්‍ය කුශලතා හා ආකල්ප වර්ධනය. | √ | √ | √ | √ | | | | √ |
| 4. දේශීය හා විදේශීය සංස්කෘතික අංගයන්ගේ අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම. | √ | | √ | | √ | | | √ |
| 5. විචාර ශක්තිය වර්ධනය. | √ | | √ | | √ | √ | √ | √ |
| 6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ශක්‍යතාවෙන් සමන්විත සමබර පෞරුෂ වර්ධනය. | √ | √ | | | √ | √ | √ | √ |

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.1** : නාට්‍ය පෙළක් යනු කුමක් දැයි අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍යය පෙළ හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- නාට්‍ය පෙළක් යනු කුමක් දැයි අර්ථ නිරූපණය කරයි.
- නාට්‍ය පෙළක තිබෙන ලක්ෂණ හඳුනා ගනියි.
- සාහිත්‍යමය ලේඛනයක් ලෙස නාට්‍ය පෙළ අගයයි.
- නාට්‍ය පෙළක් පරිකල්පනය සහ නිර්මාණශීලීත්වය මත සාර්ථකත්වයට පත් වන අයුරු අනාවරණය කරයි.
- තොරතුරු මූලාශ්‍රයයක් ලෙස නාට්‍ය පෙළක ඇති සන්නිවේදන හැකියාව සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදැවුම්** : කෙටි නාට්‍ය පෙළ කිහිපයක්
සොඳුරු ආඥාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදක - සුගතපාල ද සිල්වා

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** සිසුන් පස් දෙනකු පමණක් අයත් වන සේ පන්තිය කණ්ඩායම් කර නාට්‍ය පිටපතක් හෝ කිහිපයක් හෝ බැගින් සිසුන් වෙත ලබාදෙන්න. එම පිටපත්හි අන්තර්ගත මූලිකාංග මොනවා ද යි ඒ (රංග විධාන, සංවාද, දෙබස් ආදි වශයෙන් විමසන්න. ඔවුන් ලබාදෙන පිළිතුරු ඔවුනට පෙනෙන සේ සටහන් කරන්න.

**පියවර 02** පහත දැක්වෙන වගුව සිසුන් වෙත ලබාදී තම කණ්ඩායම සතු පිටපතක් /පෙළක් ඇසුරින් එහි තොරතුරු සටහන් කරන ලෙස පවසන්න.

| | |
|---|---|
| නාට්‍ය පෙළෙහි නම | |
| චරිත | |
| ස්ථානය (Place, Dramatic Location | උදා: ගම ගෙදර ඉදිරිපිට |
| කතා සාරාංශය | |
| මූලබීජය | උදා: තොප්පි වෙළෙන්දා නාට්‍යයේ දී වෙළෙන්දා ගේ තොප්පි නැතිවීම. |
| තේමාව | |
| දිගු නාට්‍යයක් ද ?<br>කෙටි නාට්‍යයක් ද ? | |

**පියවර 03** • එක් එක් කණ්ඩායම විසින් ගවේෂණය කරන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට සලස්වන්න.

**පියවර 04** පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- නාට්‍ය පෙළ යනු සාහිත්‍යමය ලියවිල්ලකි.
- නාට්‍යයේ කථා වස්තුව ප්‍රේක්ෂකයන් වෙත ගෙන යාමේ දී සංවාද සහ ප්‍රේක්ෂාව ගොඩනැඟීමට අවශ්‍ය තොරතුරු ඇතුළත් සාහිත්‍යමය ලේඛනය නාට්‍ය පෙළ නම් වේ.
- රචකයා මුලින් ම නාට්‍යයේ තේමාව හා ශෛලිය තීරණය කළ යුතු ය.
- නාට්‍ය පෙළ මඟින් රචකයා ගේ ජීවන දෘෂ්ටිය හෙළි වේ.
- පෙළක චරිත, සිදුවීම්, අවස්ථා ගොඩනඟා ඇති ආකාරය අනුව රචකයා ගේ නිර්මාණශීලිත්වය සහ පරිකල්පන හැකියාව තේරුම් ගත හැකි ය.
- නාට්‍ය පෙළක සංවාදවලට අමතර ව රංග විධාන, ආනුෂංගික අංග සහ චරිත පිළිබඳ විස්තර දක්නට ලැබේ.
- නාට්‍ය පෙළ මඟින් කියැවෙන කිසියම් හෝ දෙයක් ඉන් ඉවත් කළ හොත් එහි සමස්ත අදහසට කිසි දු බාධාවක් නොවේ නම් එම කොටස් පෙළට අනවශ්‍ය දෙයක් ලෙස සැලකේ.
- ව්‍යාපාරික, සමාජීය, අධ්‍යාපනික හෝ ඓතිහාසික තොරතුරු සන්නිවේදනය කිරීම නාට්‍ය පෙළකින් කළ හැකි බැවින් එම නාට්‍ය පෙළ යම් කාලයක අනුමාන තොරතුරු මූලාශ්‍රයයක් ලෙස ද වැදගත් වේ. එහෙත් තොරතුරු සන්නිවේදනය නාට්‍යයට අත්‍යවශ්‍ය අංගයක් ලෙස නොසැලකිය යුතු ය.
- ළමා නාට්‍ය පෙළක මුල, මැද, අග වශයෙන් කතාව සරල ව හඳුනාගත හැකි අතර, වෙනත් නාට්‍යයන්හි සැම විට ම එසේ නො වේ.
- නාට්‍යයක පෙළෙහි අනිවාර්යයෙන් ම අන්තර්ගත විය යුතු දෙයක් ලෙස සට්ටනය හෙවත් ගැටීම හඳුනාගත හැකි ය. නාට්‍යයෙන් නාට්‍යයට එම ගැටීම විවිධාකාර වේ.
- රචකයා ගේ අවශ්‍යතාව සහ කතාවේ ස්වභාවය අනුව නාට්‍ය පෙළ දිගු හෝ කෙටි හෝ නාට්‍ය පෙළක් ලෙස රචනා කළ හැකි ය.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍ය පෙළ අර්ථකථනය කිරීම.
- පෙළක අන්තර්ගත ලක්ෂණ උදාහරණ දක්වමින් විස්තර කිරීම.
- නාට්‍ය පෙළ කිහිපයක තේමාව ඉදිරිපත් කිරීම
- සන්නිවේදන මාධ්‍යයක් ලෙස නාට්‍ය පෙළ භාවිත වේ නම් තොරතුරු සන්නිවේදනය වන අයුරු උදාහරණ ඇසුරින් පැහැදිලි කිරීම.
- නාට්‍ය පෙළක ඇති සාහිත්‍යමය වැදගත්කම පැහැදිලි කිරීම.

**පැවරුම** : ළමා නාට්‍යයකට උචිත තේමාවක් තෝරා ගනිමින් කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.2** : නාට්‍යයක ආනුෂංගික අංග විමසයි.

**ක්‍රියාකාරකම** : නාට්‍යක භාවිත ආනුෂංගික අංග විමැසීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :

- නාට්‍යය සඳහා ආනුෂංගික අංග අවශ්‍ය බව පිළිගනියි.
- වේශ - භූෂණ මගින් චරිතයේ ස්වභාවය හඳුනාගනියි.
- නාට්‍යෝපකරණ රූපණ කාර්යය වඩා තීව්‍ර කරන බව පිළිගනියි.
- රූපණය පහසු කිරීම සඳහා ආලෝකකරණය සහාය වන බව පැහැදිලි කරයි.
- ප්‍රාසංගික බව උත්කර්ෂවත් කිරීම සඳහා නාට්‍ය සංගීතය මහඟු දායකත්වයක් සපයන බව පිළිගනියි.

**ගුණාත්මක යෙදැවුම්** :

- කදා වළලු නාට්‍ය පෙළ
- නාට්‍ය කිහිපයක ඡායාරූප
- කදා වළලු හා වෙනත් නාට්‍ය සහිත සංයුක්ත තැටි.

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

විවිධ නාට්‍යවල ඡායාරූප පෙන්වීමෙන්, එම නාට්‍යවල භාවිත කර ඇති ආනුෂංගික අංග පිළිබඳ අවධානය යොමු කරවමින් පාඩම කෙරෙහි සිසු අවධානය යොමු කරගත හැකි ය.

නාට්‍යය හා බැඳුණු ආනුෂංගික අංග හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන කරුණු ආශ්‍රිත ව සාකච්ඡාවක් ගොඩනඟන්න.

නාට්‍යයක රඟපාන නළු - නිළියන් හැරුණු විට ඔවුන් ගේ වේශභූෂණ, අංග රචනය, නාට්‍යෝපකරණ, පසුතල, රංගාලෝකකරණය හා සංගීතය ආදි අංග දැකිය හැකි ය.

නළුවා ගේ රංගය වඩාත් තීව්‍ර කරලීම උදෙසා ඉහත කී අංග වැදගත් මෙහෙයක් ඉටු කරයි.

නාට්‍යයේ ශෛලිය අනුව ආනුෂංගික කලාවන් ගේ ස්වභාවය ද වෙනස් වේ.

නිදසුන් වශයෙන් නාට්‍යධර්මී හා ලෝකධර්මී වශයෙනි.

**පියවර 02**

වේදිකා නාට්‍යයක් සජීව ව හෝ සංයුක්ත තැටියක් මගින් හෝ නැරඹීමට සැලැස්වීම.

**පියවර 03**

නාට්‍යය නැරඹීමට පෙර, සිසුන් කණ්ඩායම් කර ඒ ඒ ආනුෂංගික අංග භාවිත කර ඇති ආකාරය කෙරෙහි අවධානය යොමු කරවන්න.

**1 කණ්ඩායම**

වේශ භූෂණ මාර්ගයෙන් චරිත ලක්ෂණ ඉස්මතු කර ඇති ආකාරය

**2 කණ්ඩායම**

යොදාගෙන ඇති නාට්‍යෝපකරණ, නාට්‍යයේ සාර්ථකත්වය උදෙසා යොදාගෙන ඇති ආකාරය

**3 කණ්ඩායම**

නාට්‍යයේ ඒ ඒ අවස්ථා තීව්‍ර වන ආකාරයට භාවිත කර ඇති රංගාලෝකය

**4 කණ්ඩායම**

ප්‍රාසංගිකත්වය මතු කරලීම උදෙසා යොදාගෙන ඇති සංගීතය හා නර්තනමය චලනයේ ස්වභාවය

**පියවර 04** ඒ ඒ කණ්ඩායම්වල නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙමින් ඌන පූරණය සපයමින් සිසුන් අගය කරන්න.

ආනුෂංගික අංග යොදාගැනීම මඟින් නැරඹූ නාට්‍ය දර්ශනය, අලංකාර සහ අර්ථවත් ව ඇති ආකාරය සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

1. චරිත ලක්ෂණ ඉස්මතු කිරීඹ උදෙසා වේශෂ භූෂණවල ඇති වැදගත්කම පෙන්වා දීම
2. භාවිත නාට්‍යෝපකරණ මඟින් නාට්‍යමය ක්‍රියාවේ වර්ධනය සඳහා ලද සහාය සාකච්ඡා කිරීම.
3. රංගාලෝකය මඟින් නාට්‍යය අර්ථවත් වීමට ලැබුණු පිටිවහල හඳුනාගැනීම.
4. නාට්‍යය සඳහා යොදාගෙන ඇති සංගීතය හා නර්තන චලන මඟින් නාට්‍යයේ ප්‍රාසංගිකත්වය උදෙසා ලැබුණු දායකත්වය හඳුනාගැනීම.

**පැවරුම** : සියලු කණ්ඩායම් මඟින් ඉදිරිපත් කරන ලද කරුණු සෑම දෙනා ම සටහන් කරගන්න.

**අතිරේක උදවු** :

- කදා වළලු නාට්‍යය සමඟ වෙනත් වේදිකා නාට්‍ය සජීව ව නැරඹීම හෝ සංයුක්ත තැටි මඟින් නාට්‍යය නැරඹීම.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිලි කරයි.
**නිපුණතා මට්ටම 1.3** : නාට්‍ය ශෛලිය හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** : ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ශෛලි හඳුනා ගැනීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- නාට්‍යයක ශෛලිය හඳුනාගනියි.
- විවිධ ශෛලියේ නාට්‍ය නරඹයි.
- නාට්‍ය පිටපත් කියවා ශෛලිය හඳුනාගනියි.
- 'කදා වළලු' නාට්‍යය නරඹමින්, එහි ශෛලිය හඳුනාගනියි.
- නිර්දිෂ්ට පෙළට අදාළ නාට්‍ය ශෛලියෙහි ලක්ෂණ ලේඛනගත කරයි.

**ගුණාත්මක යෙදැවුම්** :
- නිර්දිෂ්ට නාට්‍ය පිටපත
- නාට්‍යයේ සංයුක්ත තැටියක්

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** සිසුන් කණ්ඩායම් කර, නාට්‍ය පිටපත් ඒ ඒ කණ්ඩායම් අතර බෙදා දෙමින් පැවරුම් ඉදිරිපත් කළ යුතු ව ඇති බව පවසමින් සිසුන් පාඩම වෙත යොමු කරගන්න.

**පියවර 02** පිටපතට අදාළ ව එහි දැකිය හැකි ලෝකධර්මී හා නාට්‍යධර්මී ලක්ෂණ නිරීක්ෂණය කරමින් උදාහරණ සහිත ව කරුණු ඉදිරිපත් කළ යුතු බව පවසන්න. ශෛලිය හඳුනාගැනීම උදෙසා පහත දැක්වෙන කරුණු සහාය කරගත යුතු බව අවධාරණය කරන්න.

- නාට්‍ය පෙළෙහි ලෝකයේ ස්වභාවයට බෙහෙවින් සමීප වන පරිදි භාවිත වන අභිනය ලෝකධර්මී ශෛලියේ ලක්ෂණයකි.
- ලෝක ස්වභාවය අනුගත නොවන අයුරින් සතර අභිනය භාවිත කිරීම නාට්‍යධර්මී ලක්ෂණයකි.
- ඒ අනුව පෙළ අධ්‍යයනයේ දී සංවාද භාවිතය, අංග රචනය, වේශභූෂණ, පසුතල නිර්මාණ, නාට්‍යෝපකරණ භාවිතය, සංගීතය හා නර්තන චලන ආදි අංග හොඳින් නිරීක්ෂණය කිරීමෙන් නාට්‍ය ශෛලිය හඳුනාගත හැකි වේ.
- බොහෝ නාට්‍යවල ලෝකධර්මී හා නාට්‍යධර්මී ලක්ෂණ මිශ්‍ර ව පවතින ආකාරය දැකිය හැකි වේ.

**පියවර 03**
- නාට්‍යය සජීව ව නැරඹීම , සංයුක්ත තැටියක අනුසාරයෙන් නැරඹීමට හෝ පිටපත අධ්‍යයනය සඳහා අවස්ථාව ලබාදී ක්‍රියාකාරකමෙහි නියැළෙන්නට හෝ ඉඩ හරින්න.

**පියවර 04**
- ඒ ඒ කණ්ඩායම් මඟින් නාට්‍යයෙහි දැකිය හැකි ලෝකධර්මී ලක්ෂණ හා නාට්‍යධර්මී ලක්ෂණ නිදසුන් සහිත ව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

**පියවර 05**
- ඉදිරිපත් කරන ලද කරුණු අගය කරමින් පහත දැක්වෙන අදහස් මඟින් ද සිසුන්ට විෂයය කරුණු අවබෝධ කරවන්න.

- කදා වළලු නාට්‍යයෙහි සංවාද හා ඒවා ඉදිරිපත් කිරීම ශෛලි දෙක ම අනුව සිදු ව ඇත.
- රංග භූමි අලංකරණ ද බහුල වශයෙන් භාවිත කර නැත.
- වළලු කද, රන් තලිය ආදි වූ නාට්‍යෝපකරණ යොදාගෙන ඇත.
- ''පසුබිම් අලංකරණ නොමැති ව වුව ද මෙම නාට්‍යය රඟ දැක්විය හැකි ය'' යන්න මෙම නාට්‍ය පෙළෙහි ''නිෂ්පාදනය ගැන වචනයක්'' යන සටහනෙහි දැකිය හැකි ය.
- ජාතක කථාවක් පාදක කොටගත් නාට්‍යයක් බැවින් ඉන් හැඟවෙන යුගයට ගැළපෙන ආකාරයෙන් කාල්පනික ව වේශභූෂණ නිර්මාණය කොට ඇත.
- අංග රචනය සිදු කර ඇත්තේ ද නාට්‍යධර්මී ශෛලියට අනුගත ව ය.
- මෙම නාට්‍යයෙහි බහුල වශයෙන් දැකිය හැක්කේ නාට්‍යධර්මී ලක්ෂණ ය. ලෝකධර්මී ලක්ෂණ ද දැකිය හැකි ය. එබැවින් 'කදා වළලු' නාට්‍යය නාට්‍යධර්මී ශෛලියට අයත් බව සැලැකීම වඩාත් නිවැරදි ය.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ලෝකධර්මී ලක්ෂණ හඳුනාගැනීම.
- ලෝකධර්මී ලක්ෂණවලට නිදසුන් ඉදිරිපත් කිරීම.
- නාට්‍යධර්මී ලක්ෂණ හඳුනාගැනීම.
- නාට්‍යධර්මී ලක්ෂණවලට නිදසුන් ඉදිරිපත් කිරීම.
- කාර්යක්ෂම ලෙස පැවරුම් කාර්යයෙහි නිරත වීම.

පැවරුම : සියලු කණ්ඩායම් මඟින් ඉදිරිපත් කරන ලද නිවැරදි කරුණු සැම දෙනා ම සටහන් පොත්වල ලියා ගන්න.

**අතිරේක උදවු :**

- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ රත්තරං, එලොව ගිහිං මෙලොව ආවා.
- දයානන්ද ගුණවර්ධනයන් ගේ නරිබෑණා වැනි නාට්‍ය සජීව ව හෝ පිටපත් මඟින් හෝ නැරඹීමට හා නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව ලබාදීම.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.4** : නාට්‍යයක ගැටුම යනු කුමක් දැ යි හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** : ''ගැටුම'' හඳුනාගැනීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- 'ගැටුම' නාට්‍යයක තිබිය යුතු ප්‍රබල ලක්ෂණයක් බව හඳුනාගනියි.
- 'ගැටුම' විවිධ ප්‍රභේද සහිත බව තේරුම් ගනියි.
- නිර්දිෂ්ට නාට්‍ය පිටපත ඇසුරෙන් ගැටුම් අවස්ථා නිරීක්ෂණය කරයි.
- වෙනත් නාට්‍ය පිටපත් කියවමින් ගැටුම් අවස්ථා හඳුනාගනියි.
- නාට්‍ය පිටපත් රචනය සඳහා සුදුසු නාට්‍යෝචිත අවස්ථා තෝරාගනියි.

**ගුණාත්මක යෙදැවුම්** : 'කදා වළලු' නාට්‍ය පිටපත
වෙනත් නාට්‍ය පිටපත්

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- නාට්‍යයක තිබිය යුතු විශේෂ ලක්ෂණ පිළිබඳ ව සිසුන් ගෙන් විමසමින් පාඩමට ප්‍රවේශ විය හැකි ය.
- පෙළ රචකයා, නාට්‍ය පෙළ ගොඩනංවනු ලබන්නේ ගැටුම් අවස්ථා සමඟිනි. අනතුරු ව 'ගැටුම' නාට්‍යය හා බද්ධ වන අයුරු සාකච්ඡා කරන්න.
- බොහෝ විට 'ගැටුම' ඇති වන්නේ චරිත අතර ප්‍රතිවිරෝධ අදහස් මතු වීමෙනි.

ගැටුම පුද්ගල, සමාජ, සංස්කෘතික, දේශපාලනික හා මානසික වශයෙන් ද සිදු විය හැකි ය. සතුන්, දේශගුණික බලපෑම් මෙන් ම අදෘශ්‍යමාන බලවේගයන් ද දෛවය, ඉරණම වැනි තත්ත්වයන් ද හේතුවෙන් ගැටුම් ඇති විය හැකි ය.

ගැටුම තුළ ආතතියත් (Tension) කුමකින් කුමක් වේ දැ යි යන බිය සමඟ මුසු වූ අවිනිශ්චිත ස්වභාවයත් පවතී.

ගැටුම නිසා පවතින තත්ත්වය කුමන පැති කරා පැතිරේ ද ? විරුද්ධ බලවේග ඊට එක් වේ ද ? ගැටුම සමථයකට පත් වී කුමන ආකාරයෙන් විසඳෙයි ද ? විසඳුම පිළිගත හැකි වේ ද ? යන කුතුහලය නිරන්තරයෙන් ප්‍රේක්ෂකයා තුළ ඇති වන ස්වභාවයකි.

නාට්‍යයකට උචිත වනුයේ ද ගැටුම් සහිත කතාන්දරයක් නොහොත් අවස්ථාවකි. ප්‍රේක්ෂකයා නාට්‍යය කෙරෙහි බැඳ තබන්නේ ද ගැටුමයි.

නාට්‍යයක ආරම්භයේ සිට සිදු වන චරිතවල ක්‍රියාකාරිත්වය අතරින් ක්‍රමයෙන් ගැටුම මතු වන ආකාරය බොහෝ නාට්‍යවල දැකිය හැකි ය.

**පියවර 02**

- නාට්‍ය පෙළ අධ්‍යයනයෙන් ගැටුම් අවස්ථා නිරීක්ෂණය සඳහා අවස්ථාව ලබාදෙන්න.

**පියවර 03**

- නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි දක්නට ලැබෙන පහත සඳහන් අවස්ථා අධ්‍යයනය කරන්න.

- සිටු දියණියන් වළලු මිලදී ගැනීමට කැමැත්තක් ඇති මුත් මුදල් නොමැතිකමින් පසුබෑම.
- සේරිවාණිජ වෙළෙන්දා සිටු දියණියන් වළලු ගැනීමට පෙලඹවීම.
- දුෂ්ට ගති ඇති සේරි ගේ චරිතය දුෂ්ටත්වය මතු කෙරෙන සේ ගොඩනැඟී ඇත. එම නිසා සිටු දියණියෝ දැඩි සේ කම්පනයට පත්වෙති.
- වළලු ගැනීමට පොලඹවා ගැනීමෙන් අනතුරුව ඇය ගැටලුවට විසඳුමක් ඉදිරිපත් කරයි. (දුම් බැඳුණු තලිය ගෙන ඒම)
- එම ප්‍රයත්නය ද අසාර්ථක වෙයි. සිටු දියණියන්ගේ ආශාව ඉටු නොවෙයි. සේරි වෙළෙන්දා කෝපයෙන් බැහැර යයි.
- කච්ඡපුට වෙළෙන්දා පැමිණෙයි. මිනිපිරිය ගේ ආශාව ඉටු කිරීමට මිත්තණියෝ ඉදිරිපත් වෙති.
- රන්තලියක් බව හඳුනාගැනීමෙන් කච්ඡපුට වෙළෙන්දා ගැටලුවකට මුහුණපායි. ඒ තලියෙහි වටිනාකමට සරිලන සේ ඔහු වෙත මුදල් හෝ භාණ්ඩ හෝ නොමැතිකම ය.
- තලියෙහි වටිනාකමට කච්ඡපුට වෙළෙන්දාට දිය හැකි වන්නේ කහවණු දහසක් සහ වළලු කද පමණයි. ඔහු මිත්තණිය ගෙන් ඉල්ලා සිටින්නේ පලම් දණ්ඩ හා තොටියාට දිය යුතු මිල වන කහවණු අට පමණකි.
- සේරි වෙළෙන්දා නැවත පැමිණෙන්නේ සිටු දියණියන් රවටා වළලු දෙකක් පමණක් දී තලිය ලබා ගැනීමට ය.
- මිත්තණියෝ ඔහුට බැණ වදිති. සිදු වූ සියල්ල දැන ගන්නා සේරි ගේ චිත්තය මහා ගැටලුවකට මැදි වේ. එය ඔහු අභ්‍යන්තර ව ගැටලුවකට මුහුණ දීමකි. ඔහු ගේ චිත්තය වික්ෂිප්ත වේ. වළලු කද හා මුදල් ද එතැන ම වීසි කර දමන සේරි පලම් දණ්ඩ අමෝරා කච්ඡපුට පසුපස හඹා යයි. මෙම අවස්ථාවේ දී චිත්ත අභ්‍යන්තර ගැටුමක් හා බාහිර වශයෙන් ගැටුම් අවස්ථා දැකිය හැකි ය.
- ඔරුවේ නැඟී යන කච්චපුට දකින සේරි, තොටියා ආපසු කැඳවයි. කච්ඡපුට එය වළකයි. එහි ඵලය වනුයේ සේරිවාණිජ ගේ ළය පැළී මිය යාම යි.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- 'ගැටුම' යනු කුමක් දැ යි පැහැදිලි කිරීම.
- ගැටුම ප්‍රභේද කර දැක්වීම
- නිර්දිෂ්ට පෙළෙහි ගැටුම් අවස්ථා හෙළිදරවු කිරීම
- ගැටුම් අවස්ථා පැහැදිලි කිරීම සඳහා නිදසුන් සැපයීම.
- වෙනත් නාට්‍ය පෙළකින් ගැටුම් අවස්ථා ගෙනහැර දැක්වීම.

පැවරුම : නිර්දිෂ්ට පෙළ ඇසුරෙන් ගැටුම් ප්‍රභේද අවස්ථා නිදසුන් සහිත ව ලියා දක්වන්න.

අතිරේක උදවු :

- වෙනත් නාට්‍ය පිටපත්
- වේදිකා නාට්‍ය නැරඹීම.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.5** : සමාරෝපය යනු කුමක් ද යි හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** : සමාරෝපය යන්න හඳුනාගෙන චරිතවලට පිවිසෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- සමාරෝපය යන්න හඳුනාගනියි.
- සමාරෝපයෙහි ප්‍රභේද විමර්ශනය කරයි.
- චරිත නිරූපණය සඳහා සමාරෝපය අවශ්‍ය බව පිළිගනියි.
- අදාළ අභ්‍යාසවල නිරත වෙයි.
- බාහිර සමාරෝපය සඳහා භාවිත ආනුෂංගික අංග නිරීක්ෂණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : විවිධ වේශයන් ගෙන් සැරසුණු නළු - නිළියන් ගේ (වේදිකා නාට්‍ය) පින්තූර

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- පාසලට පැමිණෙන විට මුණගැසුණු පුද්ගලයන් පිළිබඳ ව සිසුන් ගෙන් විමසීම.
- විවිධ වෘත්ති සඳහා යොමු වූ පුද්ගලයන් පිළිබඳ ව විමසීම. ඔවුහු හඳුනා ගැනීම සඳහා සහාය වූ ඇඳුම් - පැලඳුම් උපකරණ පිළිබඳ ව අවධානය යොමු කරවමින් පාඩමට ප්‍රවේශ විය හැකි ය.
- අනතුරුව 'සමාරෝපය' යන්න හඳුනාගැනීමට පහත දැක්වෙන කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
- සමාරෝපය වෙස් වෙළා ගැනීම, ආවේශ වීම, ආරූඪ වීම වැනි වචනවලින් ද හඳුන්වයි.
- නළුවන් වෙනත් චරිතයකට ආරෝපණය වීම සමාරෝපය යනුවෙන් හඳුන්වයි.
- ගුණාත්මක යෙදවුම් වශයෙන් රැස් කරගත් නාට්‍ය පාත්‍රයන්ගෙන් පින්තූර පෙන්වමින් චරිත හඳුනාගන්නට සිසුන්ට සහාය වන්න.
- චරිත හඳුනාගැනීමට ඇඳුම්-පැලඳුම් හා ඔවුනොවුන් භාවිත කරන උපකරණ සහාය වන බව පහදාදෙන්න. මඟතොටේ දී දින පතා මුණගැසෙන පිරිස්, විවිධ වෘත්තිවල නිරත වන්නන් බව හඳුනා ගැනීමට ඔවුන් ඇඳ පැලඳගත් දෑ මෙන් ම අතේ ගෙන යන උපකරණ ද සහාය වන බව පැහැදිලි කරන්න.
- නිදසුන් වශයෙන් පොලිස් නිලධරයකු , හෙදියක, වෛද්‍යවරයකු , ගුරු භවතුන් , ලියුම් බෙදන්නා, ගොවියන්, විවිධ පාසල්වලට අයත් සිසු දරුවන් යනාදි චරිත වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට ඇඳුම් - පැලඳුම් හේතු වන බව නිදසුන් සහිත ව පහදා දෙන්න.

  චරිතයක වයස, ජාතිකත්වය, සමාජ තරාතිරම, ආධ්‍යාත්මික ස්වභාවය, වැනි කරුණු වේශභූෂණ මඟින් හඳුනාගත හැකි ය. මෙම තත්ත්ව් වඩාත් තහවුරු වන්නේ අංග රචනය නිසා ය.

  වේශ - භූෂණ, නාට්‍යෝපකරණ හා අංග රචනය මඟින් රූපණය කරන චරිතය හඳුනාගත හැකි ය. එය බාහිර සමාරෝපය යි.
- රූපණයේ දී බාහිර සමාරෝපය සේ ම අභ්‍යන්තර සමාරෝපය ද වැදගත් වේ. බාහිර වශයෙන් වෙස් වළාගන්නා පාත්‍රයා ආභ්‍යන්තරික වශයෙන් ද චරිතයට ප්‍රවිෂ්ට විය යුතු ය. චරිතයට අවශ්‍ය පරිදි කටහඬ, ශරීරාංග හසුරුවාගත යුතු ය. චරිතයේ හැඟීම් වටහාගැනීමට අභ්‍යන්තර ව

සමාරෝපගත විය යුතු ය. මේ සඳහා විවිධ උපක්‍රම භාවිත කළ යුතු ය. විවිධ රූපණවේදීන් නළු ප්‍රවේශය සඳහා අවශ්‍ය රංග අභ්‍යාස නිර්මාණය කර ඇත. සිත එක් අරමුණකට ගෙන ඒම හෙවත් චිත්ත ඒකාග්‍රතාව ඇති කරගැනීම පිණිස ආනාපානසති භාවනාව වැනි භාවනා ක්‍රම මෙන් ම චරිතය පිළිබඳ රචනා ලිවීම, ග්‍රන්ථ පරිශීලනය, අත්දැකීම ලැබීම, කටහඬ, ශාරීරික අභ්‍යාසයන්හි නිරත වීම වැනි ක්‍රියාකාරකම් මඟින් අභ්‍යන්තර සමාරෝපය සාක්ෂාත් කරගත හැකි ය. චරිතයක ඇති විවිධ භූමිකාවට ක්ෂණික ව ප්‍රවේශ වීම සඳහා චිත්ත ඒකාග්‍රතාව ඇති කර ගැනීම වැදගත් වේ. සංවාද මතක තබා ගැනීමත්, නියමිත වේලාවට නියමිත හඬ භාවිත කර උච්චාරණය කිරීමත්, අදාළ චලනවල නිරත වීමත්, අභ්‍යාසවල නිරත වීමෙන් ලබා ගන්නා ප්‍රයෝජනයකි.
නළු කාර්යය සාර්ථක වන්නේ පාත්‍රයා බාහිර ව මෙන් ම අභ්‍යන්තර ව ද සමාරෝපගත වීමෙනි.

**පියවර 02**

- සියලු ම සිසුන් රංග අභ්‍යාසයක යොදවන්න. සියලු ම දෙනා කවයක් සේ සිටුවා ශාරීරික අභ්‍යාසයක නිරත කරවන්න. එකිනෙකාට එක් චරිතය බැගින් ලබාදී ක්ෂණික නිරූපණයක යොදවන්න. විද්‍යාලය භූමියෙන් ලබාගත හැකි ද නාට්‍යෝපකරණ වශයෙන් යොදා ගැනීමට ද උපදෙස් සපයන්න, අගය කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

1. සමාරෝපය යන්න පැහැදිලි කිරීම.
2. සමාරෝපය හඳුන්වන වෙනත් වචන ඉදිරිපත් කිරීම.
3. සමාරෝප ප්‍රභේද කර පැහැදිලි කිරීම.
4. බාහිර සමාරෝපගත වීම සඳහා භාවිත නම් කිරීම.
5. අභ්‍යන්තර ව සමාරෝපගත ව චරිත නිරූපණය කිරීම.

පැවරුම :

- වේදිකා නාට්‍ය නරඹමින් චරිත හඳුනාගැනීමට, චරිත අභ්‍යන්තර ගති ලක්ෂණ හෙළිදරවු වන ආකාරය නිරීක්ෂණය කරන්න.

අතිරේක උදවු :

- එදිනෙදා හමුවන පුද්ගල හා සත්ත්ව චරිත අධ්‍යයනය කිරීම.
- චරිතාපදාන ග්‍රන්ථ කියැවීම.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.1** : චරිත ලක්ෂණ හඳුනාගනිමින් රූපණය පිළිබඳ අවබෝධය ලබයි.

**ක්‍රියාකාරකම** : රඟන චරිත හඳුනාගනිමු.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- විවිධ චරිත නම් කරයි.
- චරිත අධ්‍යයනය කරයි.
- චරිතයක විවිධ භූමිකා හඳුනාගනියි.
- චරිතයක ආවේණික ලක්ෂණ හඳුනාගනී.

**ගුණාත්මක යෙදැවුම්** : විවිධ චරිතවල පින්තූර, චරිත රංගන ජවනිකා ඇතුළත් වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සිසුන් ගෙන්, තමා දකින, තමා ආශ්‍රය කරන තමාට හමු වන විවිධ චරිත පිළිබඳ ව විමසන්න.
- එවැනි චරිත විවිධ නාට්‍යවල රඟ දක්වන අවස්ථා පිළිබඳ ව සිසුන් දුටු නාට්‍ය ඇසුරෙන් විමසන්න.
- නාට්‍ය පෙළක් රංගයක් බවට පත් කිරීමේ දී චරිත රාශියක් යොදාගන්නා බවත්, බොහෝ විට එම චරිත ජීවිතයට වඩාත් සමීප චරිත බවත් පැහැදිලි කරන්න.
- සාර්ථක රංගනයක් කිරීම සඳහා චරිතමනාව හඳුනාගැනීම වැදගත් බව පහදන්න.

**පියවර 02**
- සිසුන් කණ්ඩායම් කීපයකට බෙදන්න. එක් එක් කණ්ඩායමට චරිත කීපයක් (සිසුන් ගණන අනුව) බෙදා දෙන්න.

  එක් එක් චරිතයන් ගේ දක්නට ලැබෙන විවිධ ගති ලක්ෂණ පිළිබඳ ව ගවේෂණය කොට, එම කරුණු සටහන් කරවන්න. සිසුන් විසින් පෙන්වා දෙන ලද කරුණු විමසා බලා පහත කරුණු ද උපයෝගී කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- යමකු ගේ චරිත ලක්ෂණ තීරණය වීමෙහි ලා ඔහු හෝ ඇය ජීවත්වන සමාජ පසුබිම බලපාන බව.
- පුද්ගල ආකල්ප හා හැසිරීම් රටාවන් නිරීක්ෂණය හා අධ්‍යයනය මගින් සාර්ථක රංගනයක් ගොඩනගාගත හැකි බව.
- සමාජයේ විවිධ චරිත විවිධ අවස්ථාවල දී විවිධ ස්ථානවල දී ගමන් කරන ආකාරය, කතා බහ කරන ආකාරය , අඳින පලඳින ආකාරය පිළිබඳ ව මනා ව අධ්‍යයනය කළ යුතු බව.
- චරිතයන්ට ආවේණික වූ චර්යා රටා හඳුනාගත යුතු බව.
- චරිතයේ අධ්‍යාපන, ආර්ථික මෙන් ම දේශපාලන තත්ත්වය ද නිරීක්ෂණය කළ යුතු බව.
- දේශීය මෙන් ම විදේශීය නළු - නිළියන් ද විවිධ මිනිස් - සත්ත්ව චරිත රංගනය සඳහා මෙවැනි අධ්‍යයනවල යෙදී ඇති බව.

උදා: සාලමන් ෆොන්සේකා නරියා ගේ චරිතය සඳහා සතුන් වත්තට ගොස් නරි ගතිපැවතුම් නිරීක්ෂණය කිරීම.

**පියවර 03**

- එක් එක් කණ්ඩායම් විසින් සටහන් කරන ලද විවිධ චරිත ලක්ෂණ පිළිබඳ කරුණු අනෙක් කණ්ඩායම්වලට ද ඇසෙන සේ ඉදිරිපත් කරවන්න. ඒ ඒ කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද කරුණුවලට තවත් එක් කිරීමට දෙයක් ඇත් නම් සාකච්ඡා කොට එම කරුණු සටහන් කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධ චරිත හඳුනාගැනීම.
- චරිතවල විවිධ ගති ලක්ෂණ හඳුනා ගැනීම.
- චරිතවලට ආවේණික ලක්ෂණ දැක්වීම.
- චරිතයන්හි විවිධ භූමිකා දැක්වීම.
- රංගනය සඳහා චරිතයක විවිධ පැතිකඩ හඳුනාගැනීම මනා පිටිවහලක් වන බව වටහාගැනීම.

පැවරුම :

- විවිධ චරිතවල විවිධ ලක්ෂණ ගවේෂණය කර එම චරිත ලක්ෂණ සටහන් කරන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.2** : අදාළ භූමිකාව පිළිබඳ අධ්‍යයනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** : චරිත තුළ භූමිකා සොයමු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- විවිධ චරිත හඳුනාගනී.
- චරිත තුළ විවිධ භූමිකා හඳුනාගනී.
- චරිතයක හා භූමිකාවක වෙනස දක්වයි.
- විවිධ භූමිකාවලට අනන්‍ය වූ ලක්ෂණ දක්වයි.


**ගුණාත්මක යෙදවුම්** : විවිධ චරිතවල පින්තූර
විවිධ රංගනයන් ඇතුළත් වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 1**

- ගුරුවරයා තමා ගේ හෝ වෙනත් අයකු ගේ චරිත දක්නට හෝ ලැබෙන වෙනත් භූමිකා හෙවත් චරිතවල විවිධ පැතිකඩ සඳහා උදාහරණයක් දක්වමින් පාඩමට පිවිසෙන්න.

  තමා පාසලේ දී සිසුන් ගේ ගුරුවරයා වන අතර නිවසේ දී තම මවුපියන් ගේ දරුවකු වන බවත්, දූ දරුවන් ගේ මව හෝ පියා හෝ වන බවත් පැහැදිලි කරන්න.




ඉහත උදාහරණය අනුව එක ම චරිතයෙහි දක්නට ලැබෙන භූමිකා විවිධාකාර බව පැහැදිලි කරන්න. මේ අනුව

- ඕනෑ ම චරිතයක විවිධ භූමිකා (Roles) ඇති බව.
- භූමිකා විවිධ වුව ද අදාළ චරිතයේ මූලික ලක්ෂණ කීපයක් හෝ ඒවායෙහි දැකිය හැකි බව.
- විවිධ භූමිකාවලට අනන්‍ය වූ ස්වාධීන ලක්ෂණ ඇති බව.
- එක් චරිතයක් වුව ද විවිධ භූමිකාවල දී ශාරීරික හා මානසික වෙනස්කම් පෙන්වන බව.

පියවර 2 • සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා එක් එක් කණ්ඩායම්වලට එක් එක් චරිතය තෝරා ගැනීමට සලස්වන්න. තෝරාගන්නා චරිතවල ඇති විවිධ භූමිකා හඳුනාගැනීමට ඉඩ දෙන්න.

පියවර 3 • සිසුන් විසින් චරිතවල ඇති විවිධ භූමිකා හඳුනාගැනීමෙන් අනතුරු ව සියලු ම කණ්ඩායම් තමන් සොයාගත් කරුණු සෙසු කණ්ඩායම් වෙත ද ඉදිරිපත් කරමින්, සාකච්ඡා කිරීමට සලස්වා පහත කරුණු ද සැලකිල්ලට ගෙන සමාලෝචනයක යෙදෙන්න.

- චරිතය හා භූමිකාව යන වචන සාමාන්‍ය ව්‍යවහාරයේ දී සමාන අර්ථයෙන් ද යෙදෙන බව.
- නාට්‍ය සන්දර්භයෙහි දී චරිතයක දැකිය හැකි විවිධ පැතිකඩ හැඳින්වීම සඳහා භූමිකාව (Role) යන්න භාවිත කැරෙන බව.
- ඕනෑ ම චරිතයක් පෞද්ගලික, සමාජීය, සංස්කෘතික, දේශපාලනික හා ආගමික ක්ෂේත්‍රවල කටයුතු කිරීමේ දී ඒ අනුව විවිධ භූමිකාවලට ඇතුළු වන බව.
- ඒ ඒ චරිතවල දක්නට ලැබෙන විවිධ භූමිකාවල විවිධ ලක්ෂණ ඇති බව.
- විවධ භූමිකාවල යෙදෙන විට චරිතයෙහි ඇති වන බාහිර හා අභ්‍යන්තර වෙනස්කම් හඳුනාගත හැකි බව. (ඉරියව්, හැඟීම්, භාෂාව)

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- චරිතයේ හා භූමිකාවේ වෙනස හඳුනාගැනීම.
- විවිධ භූමිකා හඳුනාගැනීම.
- ඒ ඒ භූමිකාවලට ආවේණික ලක්ෂණ දැක්වීම.
- එක් එක් භූමිකා බාහිර මෙන් ම අභ්‍යන්තර වශයෙන් ද වෙනස්කම් දක්වන අයුරු හඳුනාගැනීම.
- නිවැරදි ආකාරයට විවිධ භූමිකා පිළිබඳ ව සටහන් දැක්වීම.

උක්ත කරුණු ඇගයීමට ලක් කරන්න.

පැවරුම : • විවිධ චරිතවල දක්නට ලැබෙන විවිධ පැතිකඩ (භූමිකා) ප්‍රස්තාරයක් මඟින් දක්වන්න.

ඉදිරි පාඩම්වල දී එම භූමිකා රංගනය සඳහා අවශ්‍ය වන ඇඳුම් පැළඳුම්, වේශනිරූපණ ද්‍රව්‍ය සොයාගැනීමට උපදෙස් දෙන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.3** : භූමිකා රංගනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** : භූමිකා රඟමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- චරිතයක විවිධ භූමිකා හඳුනාගනී.
- හඳුනාගත් භූමිකාවල ආවේණික ලක්ෂණ දක්වයි.
- ඒ ඒ භූමිකාවට අදාළ හඬ පාලනය කරමින් රඟයි.
- ඒ ඒ භූමිකාවලට අනුව වේශභූෂණ තෝරාගනී.
- විවිධ භූමිකා රඟ දක්වයි.

**ගුණාත්මක යෙදැවුම්** :
- විවිධ වේශභූෂණ
- වේශ නිරූපණ ද්‍රව්‍යය
- විවිධ භූමිකාවන්හි ලක්ෂණ ඇතුළත් පත්‍රිකා
- රංග ක්‍රීඩා සම්බන්ධ දෘශ්‍ය පට

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- ඉහත පාඩමෙහි දී (2.2) බෙදන ලද කණ්ඩායම් විසින් චරිතවල විවිධ භූමිකා පිළිබඳ ව සකස් කරගන්නා ලද තොරතුරු උපයෝගි කරගෙන එම භූමිකා රඟ පෑමට සිසුන්ට උපදෙස් දෙන්න. එම රංගන ඉදිරිපත් කිරීමේ දී විශේෂයෙන් සැලැකිලිමත් විය යුතු කරුණු පහත සඳහන් කරුණු ද උපයෝගි කොටගෙන සාකච්ඡා කරන්න.
- විවිධ භූමිකාවලට බාහිර හා අභ්‍යන්තර වශයෙන් ස්වරූප දෙකක් ඇති බව.
- එක ම චරිතය නිවසේ දී, සමිතියක දී, රැකියා ස්ථානයක දී පන්සලේ දී බාහිර වශයෙන් වෙනස් වන අතර ඒ වෙනස වේශභූෂණ මඟින් ප්‍රධාන වශයෙන් කැපී පෙනෙන බව.

  උදාහරණ ලෙස පාල නමැත්තා නිවසේ දී පියා ලෙස බැනියමක්, සරමක් වැනි සැහැල්ලු ඇඳුමක්

  රැකියා ස්ථානයේ දී - කලිසම, කමිසය වැනි සුදුසු ඇඳුමක්, පන්සලේ දී සුදු පාටකමිසයක්, සරමක්, ජාතික ඇඳුම ආදි වශයෙන් භූමිකාවට සුදුසු ඇඳුම්වලින් සැරසීම.

  ඒ ඒ ස්ථානයේ දී හැසිරෙන ආකාරයට ගමන, කතාව, විවිධ ඉරියවු වෙනස් වන බව , හඬෙහි ස්වරය මෙන් ම වාග් විලාසය ද වෙනස් වන බව.

උදාහරණ ලෙස පාල නිවසේ දී දරුවන්ට පියකු ලෙස හැසිරෙන ආකාරයත්, බිරියට ස්වාමියක් ලෙස හැසිරෙන ආකාරයත් එකිනෙකට වෙනස් ස්වරූපයක් ගන්නා අතර පාසලේ දී සිසුන් ගේ ගුරුතුමා ලෙස හැසිරෙන්නේ වෙනත් ආකාරයකට යි. පන්සලේ දී හොඳ බැතිමතකු ලෙස තවත් විශේෂ ආකාරයකට හැසිරිය යුතු වේ.

**පියවර 02**
- සිසු කණ්ඩායම් විසින් තෝරාගන්නා ලද චරිතවල විවිධ භූමිකා රඟපෑමෙන් අනතුරු ව ඒවායේ සංවර්ධනය විය යුතු අවස්ථා පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- චරිතයක් නිරූපණය කිරීමේ දී ඒ ඒ අවස්ථාවට උචිත අයුරින් විවිධ භූමිකාවට සමාරෝප විය යුතු බව.
- මෙහි දී ස්මරණ ශක්තිය වඩාත් වැදගත් වන බව
- චිත්ත ඒකාග්‍රතාව ද ඉතා වැදගත් බව.
- එක ම චරිතය වුව ද ඒ ඒ භූමිකාවට උචිත ලෙසින් අවස්ථානුකූල ව විවිධ හැසිරීම් රටා අනුගමනය කළ යුතු බව.
- සමාජ අත්දැකීම් සහ චරිත පිළිබඳ ව ලබන අධ්‍යයන සාර්ථක භූමිකා නිරූපණයකට උපකාරී වන බව.

**පියවර 03**
- සෑම කණ්ඩායමකට ම අනෙක් කණ්ඩායම්වල භූමිකා නිරූපණයන් හි සාර්ථක - අසාර්ථක තැන් පිළිබඳ ව කරුණු දැක්වීමට අවස්ථාව දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- චරිතයෙහි විවිධ භූමිකා හඳුනාගැනීම.
- එම භූමිකාවලට සමාරෝප වීමේ කුශලතාව
- චරිතයේ භූමිකාවලට අනුකූල ව හඬ භාවිතය
- අවස්ථාවලට උචිත පරිදි වේෂභූෂණ යොදා ගැනීම.
- සමස්ත රංගනයේ සාර්ථකත්වය

පැවරුම :
- විවිධ චරිතවල විවිධ භූමිකා රඟපෑමට හුරු වන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.4** : තමා තෝරාගත් තේමාවක් අනුව නිර්මාණාත්මක ව කුශලතා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : තේමාවක් තෝරාගෙන පෙළ රචනය කරමු මෙලෙස

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නාට්‍යයකට සුදුසු කථා, සිදුවීම් හෝ අවස්ථා හෝ තෝරාගනියි.
- ඒවායින් ඉස්මතු වන තේමා පෙළගස්වයි.
- විවිධ නිර්මාණවලින් ඉස්මතුවන තේමාවල ඇති විවිධත්වය අධ්‍යයනය කරයි.
- විවිධ තේමා පදනම් කොට නාට්‍ය පෙළක් රචනා කරයි.
- තේමාව උද්දීපනය වන පරිදි නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු විමසා බලයි.
- නාට්‍ය පෙළ රචනය පිළිබඳ ව ප්‍රායෝගික ව අත්දැකීම් ලබයි.

**ගුණාත්මක යෙදවුම්** : විවිධ විෂය යටතේ ලියැවුණු පොත්පත් (ආගම, ඉතිහාසය, අභ්‍යවකාශය හා ග්‍රහවස්තු, භාෂාව හා සංස්කෘතිය)
- කතාන්දර පොත්
- චිත්‍රපට, රූපවාහිනී නාට්‍ය ආදියේ සංයුක්ත තැටි)
- විවිධ විෂය යටතේ වූ පෙළපොත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** සිසුන් හා එක් ව ඔවුන් දන්නා කතාන්දර , වේදිකා නාට්‍ය, රූපවාහිනී නාට්‍ය, චිත්‍රපට, විෂයානුබද්ධ පාඩම් ආදිය පිළිබඳ කතාබහක යෙදෙන්න. පූර්ව අත්දැකීම් ලෙස කතා කියවීමට හෝ දෘශ්‍ය සංයුක්ත නැරඹීමට හෝ අවස්ථාව ලබාදෙන්න.

උදාහරණ

1. හාවයි නරියයි ලබු කිරිබත් ඉව්ව හැටි - ජනකතාව
2. ආඬි හත්දෙනා ගේ කැඳහැලිය ජනකතාව
3. මනමේ නාට්‍යය - වේදිකා නාට්‍යය
4. සිංහබාහු නාට්‍යය - වේදිකා නාට්‍යය
5. සූරියඅරණ - චිත්‍රපටය
6. හෝගාන පොකුණ - චිත්‍රපටය
7. ඔෂීන් - රූපවාහිනී නාට්‍යය
8. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් - දුරකථනය නිපදවීම
9. පයිතගරස් චරිතය
10. නිව්ටන් ගේ - ගුරුත්වාකර්ෂණ නියමය සම්බන්ධ කතාව

ආදි නිර්මාණවලින් සමාජයට දෙන පණිවිඩ සහ තේමා සිසුන් හා සාකච්ඡා කරන්න. එමඟින් සමාජයේ යහපත සඳහා නව නිර්මාණ බිහි කිරීම සඳහාත් ඉදිරිපත් වන තේමාවේ වටිනාකම සිසුන්ට පැහැදිලි කරන්න.

විවිධ නිර්මාණවලින් විවිධ තේමා ඉස්මතු වන බව පෙන්වා දෙන්න.

උදා:
- උත්සාහවන්තයා ජයගනී.
- සිත ඇත්නම් පත කුඩා ද ?
- සිටියොත් හොඳට හැදී දෙවියොත් නමට වඳී
- දුප්පත්කම දියුණුවට බාධාවක් නො වේ.
- අභියෝග හමුවේ නොසැලී සිටීමෙන් ජීවිතය ජය ගත හැකි ය.
- මවුපිය සෙනෙහස අසීමිත ය.

**පියවර 02** පාසල් විෂය මාලාවට අයත් නිර්දේශිත පෙළ පොත් ඇසුරෙන් සොයාගත් කතාන්දර හෝ වෙනත් පොත පතේ දැක්වෙන කතා කිහිපයක් හෝ ඡායා පිටපත් කර සිසුන්ට ලබාදෙන්න.

1. කණ්ඩායම - විද්‍යාව විෂයය සම්බන්ධ ව
2. කණ්ඩායම - ආගම (බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම්) සම්බන්ධ ව
3. කණ්ඩායම - ඉතිහාසය සම්බන්ධ ව (ලංකා, ලෝක, ඉන්දීය)
4. අභ්‍යාවකාශය හා ග්‍රහලෝක ආශ්‍රිත ව
5. ගණිතය විෂය සම්බන්ධ ව

එක් එක් කණ්ඩායමට අදාළ විෂයයට සම්බන්ධ ව කතාවක් හෝ සිද්ධි මාලාවක් හෝ තෝරාගෙන යම් තේමාවක් උද්දීපනය වන පරිදි නාට්‍ය පෙළක් රචනා කිරීමට උපදෙස් ලබාදෙන්න.

කතාවක් හෝ සිද්ධි මාලාවක් හෝ නාට්‍ය පෙළක් බවට පත් කිරීමේ දී පහත දැක්වෙන කරුණු පිළිබඳ ව අවධානය යොමු විය යුතු බව සිසුන්ට පැහැදිලි කරන්න.

1. පිටපත ලිවීමට පෙර රචකයා සතු පරිකල්පන ශක්තිය මෙහෙයවා කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව.
2. නාට්‍යයක චරිත හා නාට්‍යෝචිත අවස්ථා තිබිය යුතු බැවින් එක් එක් කතාවට අදාළ පරිදි චරිත හා නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම.
3. ඒ ඒ චරිත හා නාට්‍යෝචිත අවස්ථාවන්ට සංවාද ගොඩනැගීම.
4. නාට්‍යයේ තේමාව උද්දීපනය වන පරිදි උචිත සංවාද ගොඩනැගීම.
5. සංවාද ගොඩනැගීම, චරිත නිරූපණය, නාට්‍යෝචිත අවස්ථා හා ගැටුම් නිර්මාණය ආදි උපක්‍රම මඟින් තේමාව උද්දීපනය කිරීම නිර්මාණශීලී ව කළ යුතු බව.
6. ඒ සඳහා පෙළ රචකයා සතු පරිකල්පන ශක්තිය උපයෝගී කරගැනීම.
7. නාට්‍ය පෙළක් නිර්මාණය කිරීම සඳහා පාඩමක් හෝ කතාවක් හෝ යොදාගැනීමේ දී එහි දැක්වෙන කතාව හෝ සිද්ධිමාලාව හෝ නව මඟකට හෝ නව අර්ථකථනයකට හෝ යොමු කිරීමට නාට්‍ය පෙළ රචකයාට ඉඩ ඇති බව.

8. පන්ති කාමර අධ්‍යයනයේ දී විවිධ විෂයයන් ගේ ඉගැනුම් - ඉගැන්වීම් කාර්ය සාධනය සඳහා නාට්‍යානුසාරී ඉගැන්වීම භාවිතයට ගත හැකි ය.

**පියවර 03**

- ඉහත කරුණු අනුව නාට්‍ය පෙළ රචනා කළ පසු එක් එක් නාට්‍ය පෙළ කියවා එක් එක් පෙළෙහි ඇති සාධනීය ලක්ෂණ හා අඩුපාඩු පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධ විෂයයන් යටතේ ලියැවුණු පොතපත ඇසුරෙන් නාට්‍ය පෙළ රචනය සඳහා සුදුසු කතා හා සිදුවීම් තෝරා ගැනීම.
- ඒවායින් පිළිබිඹු වන තේමා පෙළ ගැස්වීම.
- විවිධ තේමා ඉස්මතු වන පරිදි නාට්‍ය පෙළ රචනා කිරීම.
- සාර්ථක පෙළ රචනයක් සඳහා නිර්මාණාත්මක චින්තනය හෙවත් පරිකල්පන ශක්තිය උපයෝගී කොටගැනීම.
- සාර්ථක පෙළ රචකයකු බවට පත් වීම.

පැවරුම :

1. විවිධ විෂය පිළිබඳ ගවේෂණය කර නාට්‍යෝචිත කථා වස්තු, අවස්ථා හෝ සිද්ධි හෝ තෝරාගන්න
2. ඒවායින් ඉස්මතු වන තේමා පෙළ ගස්වන්න.
3. ඉන් එක් තේමාවක් යටතේ නාට්‍ය පෙළක් රචනා කරන්න.
4. රචනා කරන ලද පෙළ පන්තියේ සෙසු සිසුන් හා ගුරුවරයා ඉදිරියේ ඉදිරිපත් කර සාධනීය ලක්ෂණ හා අඩුපාඩු විමසන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.5** : පෙළට උචිත වන සේ ආනුෂංගික කලා සැලසුම් කරයි.

**ක්‍රියාකාරකම** : පෙළට උචිත ආනුෂංගික කලා සැලසුම් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගැනුම් පල** :

- ආනුෂංගික කලා යනු මොනවා ද යන්න විමසයි.
- නාට්‍යයක සාර්ථකත්වයට ආනුෂංගික කලා ප්‍රබල ලෙස දායක වන බව ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් අධ්‍යයනය කරයි.
- පරිකල්පන ශක්තිය උපයෝගී කොටගෙන හඬ, ශබ්ද, වර්ණ, හැඩතල ඇසුරෙන් ආනුෂංගික කලා නිර්මාණය කරයි.
- පරිසරයේ දක්නට ලැබෙන බොහෝ භෞතික සම්පත් මෙන් ම මානව සම්පත් ද ඇසුරු කොට ආනුෂංගික අංග නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදැවුම්** : 2.4 නිපුණතා මට්ටම යටතේ නිර්මාණය කරන ලද නාට්‍ය පෙළ නාට්‍යධර්මී හා ලෝකධර්මී නාට්‍ය කිහිපයක් හෝ නාට්‍ය කිහිපයක කොටස් ඇතුළත් සංයුක්ත තැටි නැතහොත් ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- ගුණාත්මක යෙදැවුම් යටතේ දී ඇති නාට්‍ය හෝ නාට්‍ය කොටස් හෝ සිසුන්ට නැරඹීමට අවස්ථාව ලබාදෙන්න.
- ඒවා නැරඹීමේ දී නළු - නිළියන් ගේ ඇඳුම් පැලැඳුම්, රංග භාණ්ඩ මුහුණුවල ඉරියවු, හැඩතල, සංගීතය, පසුතල, ආලෝකය ආදි සෑම අංගයක් ම අවධානයෙන් නරඹන ලෙස උපදෙස් දෙන්න.
- නරඹා අවසානයේ, නාට්‍යයක වේශභූෂණ, අංග රචනය, සංගීතය, නර්තනය, නාට්‍යෝපකරණ, ආලෝකකරණය, පසුතල නිර්මාණ ආදිය 'ආනුෂංගික ' කලාවලට අයත් වන බව සිසුන්ට පැහැදිලි කරන්න.
- එම ආනුෂංගික අංග මනා ලෙස සුසංයෝග කිරීම නාට්‍යයේ සාර්ථකත්වය කෙරේ බෙහෙවින් බලපාන බව සිසුන් හා සාකච්ඡා කරන්න.
- ඉන් පසු සිසුන් කණ්ඩායම් කීපයකට වෙන් කොට 2.4 නිපුණතා මට්ටම යටතේ නිර්මාණය කරන ලද නාට්‍ය පිටපත් කිහිපයක් කණ්ඩායම්වලට ලබාදෙන්න.
- පිටපත හොඳින් කියවීමෙන් පසු එයට අදාළ ව නිර්මාණය කළ යුතු ආනුෂංගික අංග පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න.
- ඒ සඳහා පරිසරයේ දක්නට ඇති දෑ පවා ඇතැම් ආනුෂංගික අංග නිර්මාණය කිරීම සඳහා යොදාගත හැකි බව පෙන්වා දෙන්න.
- එක් එක් සිසු කණ්ඩායම් සඳහා සිසුන් ගේ කැමැත්ත පරිදි ආනුෂංගික අංග සැලසුම් කිරීම සඳහා උපදෙස් ලබාදෙන්න.

උදා:

1. කණ්ඩායම - වේශ භූෂණ
2. කණ්ඩායම - අංග රචනය
3. කණ්ඩායම - ගායනය, නර්තනය හා සංගීතය
4. කණ්ඩායම - පසුතල නිර්මාණය
5. කණ්ඩායම - නාට්‍යෝපකරණ
6. කණ්ඩායම - ආලෝකකරණය

**පියවර 02** ආනුෂංගික අංග සැලසුම් කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතු බව පැහැදිලි කරන්න.

1. නාට්‍යයේ දැක්වෙන චරිත පිළිබඳ මනා අවබෝධයකින් යුතු ව අංග රචනය ආදිය සැලසුම් කිරීම.
2. නාට්‍යයේ ශෛලිය, යුගය, කාලය ආදිය පිළිබඳ මනා අවබෝධයකින් යුතු ව සැලසුම් කිරීම.
3. නාට්‍ය පෙළට ගැළපෙන සේ සංගීතය, නර්තනය,හා ගායනය සැලසුම් කළ යුතු වීම.
4. අංග රචනය, වේශ භූෂණ, ආලෝකකරණය හා පසුතල සැලසුම් කිරීමේ දී වර්ණ සංයෝජන පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු වීම.
5. නාට්‍ය පෙළෙහි එන නාට්‍යෝචිත අවස්ථා හා භාවයන් තීව්‍ර කිරීම සඳහා සංවාද මෙන් ම ගායන හා නර්තන ආදිය යොදාගත හැකි වීම.

**පියවර 03** ආනුෂංගික අංග සැලසුම් කිරීමේ දී පරිසරයෙන් ලබාගත හැකි භෞතික සම්පත් මෙන් ම මානව සම්පත් ද ප්‍රයෝජනයට ගැනීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

උදා: පරිසරයෙන් ලබාගත් සම්පත් වියළි පත්‍ර, උණගස්, බටගස් ආදි ගස් වර්ග, කාඩ්බෝඩ්, රබර් කිරි (ඇලවීම සඳහා ගම්වලට ආදේශකයක් ලෙස) විවිධ වැල් වර්ග (වේවැල්, වෙනිවැල්)

- එමෙන් ම චිත්‍ර, නැටුම්, සංගීතය විෂයයන්හි ප්‍රවීණත්වය දක්වන ගුරුවරුන්, ආදිශිෂ්‍යයන්, පාසලේ වෙනත් සිසුන් ආදීන් ගේ සහාය ලබාගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- සියලු ම කණ්ඩායම්වලට අදාළ ආනුෂංගික අංග සැලසුම් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබාදෙන්න.
- සියලු ම ආනුෂංගික අංග නිර්මාණය කළ පසු ඒවා සුසංයෝජනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකසා ගන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ආනුෂංගික අංග පිළිබඳ අධ්‍යයනය කරයි.
- ලියන ලද පෙළට ගැළැපෙන ආනුෂංගික අංග සැලසුම් කරයි.
- ආනුෂංගික අංග සැලසුම් කිරීමේ දී අවධාරණය කළ යුතු සුවිශේෂතා පිළිබඳ සාකච්ඡා කරයි.
- බාහිර පරිසරයේ ඇති භෞතික සම්පත් මෙන් ම වටපිටාවෙන් ලබාගත හැකි මානව සම්පත් ද ආනුෂංගික අංග සැලසුම් කිරීම සඳහා උපයෝගී කරගන්න.
- කණ්ඩායම් වශයෙන් නිර්මාණය කරන ලද ආනුෂංගික අංග සුසංයෝග කොට නාට්‍ය පෙළ සජීවකරණය සඳහා පෙළ ගැසෙයි.

පැවරුම : ලියන ලද නාට්‍ය පෙළට අදාළ ව නිර්මාණය කරන ලද ආනුෂංගික අංග සුසංයෝග කොට පෙළ සජීවකරණය සඳහා එනම් නාට්‍ය රංගගත කිරීම සඳහා දිනයක්, වේලාවක් හා ස්ථානයක් සැලසුම් කොට නාට්‍ය වේදිකා ගත කිරීම සිදු කරන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.6** : ආනුෂංගික අංග සුසංයෝග කරයි.

**ක්‍රියාකාරකම** : ආනුෂංගික අංග සුසංයෝග කර පෙළට පණ පොවමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නිර්මාණය කරන ලද ආනුෂංගික අංග සුසංයෝග කරයි.
- ආනුෂංගික අංග සුසංයෝගයෙන් නාට්‍ය පෙළට ජීවය දෙයි.
- සාමූහික නිර්මාණ රැසක් එක්වූ විට අපූර්ව නිර්මාණයක් බිහි කරගත හැකි බව ප්‍රායෝගික ව අත්දකියි.
- නාට්‍ය පෙළකට සුදුසු ආනුෂංගික අංග නිර්මාණය කිරීමෙන් ලත් ප්‍රායෝගික කුශලතා ප්‍රගුණ කරයි.

**ගුණාත්මක යෙදැවුම්** :
- සිසුන් විසින් නිර්මාණය කරන ලද ආනුෂංගික කලාවලට අදාළ දේ
- අංග රචනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
- පසුතල නිර්මාණය
- ආලෝකකරණය සඳහා අවශ්‍ය උපකරණ
- අවශ්‍ය වෙනත් දෑ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- කණ්ඩායම් වශයෙන් නිර්මාණය කරන ලද ආනුෂංගික අංග නාට්‍ය පෙළ සමග සුසංයෝග කිරීම සඳහා සිසුන්ට පූර්ව උපදෙස් ලබාදෙන්න.
- පාසල් වේදිකාව හෝ නාට්‍යයක් වේදිකාගත කිරීමට සුදුසු ස්ථානයක් හෝ තෝරාගන්න.
- සියලු ම ආනුෂංගික අංග නාට්‍ය පෙළට අදාළ පරිදි එකිනෙක පිළිවෙළට භාවිතයට ගැනීමට සිසුන්ට අවශ්‍ය පරිදි කාලය ලබාදෙන්න.
- චරිතවලට ගැළපෙන පරිදි අංග රචනා , රංගවස්ත්‍ර, නාට්‍යෝපකරණ, සංගීතය, ගායනා, නර්තන, ආලෝකකරණය ආදි සියල්ල එක්තැන් කොට නාට්‍ය පෙළට ජීවය ලබාදෙන්න.
- නාට්‍ය නැරඹීම සඳහා පාසලේ නාට්‍ය හා රංග කලාව ඉගෙන ගන්නා සිසුන් හෝ වෙනත් සිසුන් හෝ සහභාගි කරගන්න.
- චරිත නිරූපණයේ දී පූර්ව පුහුණුව වැදගත් වන බැවින් ඒ සඳහා කුශලතා ඇති සිසුන් නළුවරණයකින් තෝරා ගත යුතු අතර පූර්ව පුහුණු අනිවාර්යයෙන් කළ යුතු ය.
- අංග රචනා ආදිය සඳහා දක්ෂතා ඇති ශිල්පීන් ගේ සහාය ද ලබාගත හැකි ය.
- සංගීතය හා ගීත ආදිය නිර්මාණයේ දී ඒ සම්බන්ධ සුවිශේෂ හැකියාවක් ඇති අය ගේ ආධාර ලබා ගැනීම ද කළ හැකි ය.

**පියවර 02**
- පළමු අවස්ථාවේ දී ආනුෂංගික අංග සුසංයෝගයෙන් නාට්‍ය වේදිකාගත කිරීමේ දී යම් යම් ප්‍රමාද දෝෂ සිදු විය හැකි බැවින් ඒ සම්බන්ධ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

- ආනුෂංගික අංග සුසංයෝගයෙන් නාට්‍යයක් වේදිකාගත කිරීමේ දී පහත දැක්වෙන කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු බව සාකච්ඡා කරන්න.

1. චරිතවලට ගැළැපෙන අංගරචනා නිර්මාණය කිරීමේ දී ප්‍රමාදයකින් තොර ව ඒ ඒ චරිතයට ගැළැපෙන අයුරින් හා කාලය පිළිබඳ අවබෝධයෙන් මෙන් ම මිනිස් සිරුරට අහිතකර නොවන ආකාරයෙන් ද කළ යුතු බව.

2. වේශභූෂණ, රංග උපකරණ හා පසුතල ආදිය නිර්මාණය කිරීමේ දී පෙළට උචිත අයුරින් මෙන් ම පහසුවෙන් හැසිරවිය හැකි අයුරින් නිර්මාණය කිරීම හා පෙළ රංගගත කිරීමේ දී නාට්‍යයේ ගලායාමට බාධා නොවන අයුරින් නිර්මාණය කිරීම.

3. ආලෝකකරණ උපකරණ නිර්මාණයේ දී හා හැසිරවීමේ දී අනතුරුදායක තත්ත්වයන් මඟහරවා ඒවා නිර්මාණය කිරීම.

4. නිර්මාණය කරන ලද ආලෝකය භාවිතයේ දී වේශභූෂණ, අංගරචනා හා පසුතල නිර්මාණවලට ගැළැපෙන අයුරින් ආලෝකය භාවිතය.

5. සංගීතය හා ගායනා මෙන් ම සංවාද භාවිතයට ගැනීමේ දී ද චරිතවල රංගනයට බාධා නොවන අයුරින් මෙන් ම චරිතවල ගුණාත්මක බවට හානියක් නොවන පරිදි ද යොදාගැනීම.

6. සියලුම ආනුෂංගික අංග ක්‍රමානුකූල ව යොදාගත් විට රංග වින්‍යාසයට හා නාට්‍යය ගලායන රිද්මයට අපූර්ව සහායක් විය හැකිවීම.

7. ආනුෂංගික අංග මැනවින් නිර්මාණය වූ විට හා ඒවා නිසිතැන නිසි ලෙස භාවිතයට ගැනීම නාට්‍යයේ සාර්ථකත්වයට මනා පිටිවහලක් වීම.

8. නාට්‍යය වේදිකාගත වීමෙන් පසු එහි ඇතුළත් ආනුෂංගික අංග පිළිබඳ ඇගැයීමක යෙදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කණ්ඩායම් වශයෙන් නිර්මාණය කරන ලද ආනුෂංගික අංග සියල්ල ඒකරාශි කිරීම.
- ඒකරාශි කළ ආනුෂංගික අංග සියල්ල පෙළට අදාළ ව වේදිකාවක් මත භාවිතයට ගැනීම.
- ආනුෂංගික අංග භාවිතයට ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු අධ්‍යයනය කිරීම.
- ආනුෂංගික අංග නිර්මාණයේ දී බාහිර පරිසරයෙන් ලබාගත් දෑ හා බාහිර සම්පත් පුද්ගලයන් ගේ සහාය ලබාගැනීම.
- නිර්මිත ආනුෂංගික අංග භාවිත කොට නාට්‍යපෙළට ජීවය ලබාදීම.

**ඇගැයීම** :

1. නාට්‍ය පෙළ කීපයක් රචනා කරන්න.
2. රචනා කරන ලද නාට්‍ය පෙළට අදාළ පරිදි ආනුෂංගික අංග නිර්මාණය කරන්න.
3. වේදිකා නාට්‍ය පෙළ කීපයක් තෝරාගෙන ඊට අදාළ ව ආනුෂංගික අංග නිර්මාණය කරන්න.

නිපුණතාව 3.0 : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකමෙහි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.1** : සමාරෝපය අනුකරණය හා අභිනය භාවිතයෙන් චරිත නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම 3.1.1** : චරිතවලට සමාරෝපය වීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- අවකාශයේ හොඳින් ඇවිදියි.
- චරිත අනුකරණය යනු කුමක් ද යි ප්‍රකාශ කරයි.
- සතර අභිනය ම භාවිත කරමින් චරිත නිරූපණය කරයි.
- සමාරෝපය යනු කුමක් ද යි ප්‍රකාශ කරයි.
- විවිධ චරිත නිරූපණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : වේදිකා නාට්‍ය අවස්ථා සමීප ඡායාරූප

ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01**

- සිසුන් නිදහස් ස්ථානයකට රැගෙන යන්න. එහි අවකාශයේ නිදහස් ව ඇවිදීමට සලස්වන්න. එසේ ඇවිදින අතරතුර එකවර ම නැවතී ගල් ගැසුණාක් මෙන් සිටීමට සංඥා කරන්න. එහි දී සිසුන් විවිධ ඉරියවු නිරූපණය වන සේ ගල් ගැසුණාක් මෙන් සිටියි. ගල් ගැසුණු ශරීරයෙන් වඩාත් ස්වාභාවික ඉරියව්ව නිරූපණය කරන සිසුන් තෝරා අන් අයට බලා ගැනීමට ඉඩ සලසන්න. අවකාශයේ ඇවිදිමින් සිටින සිසුන්ට යම්කිසි චරිතයක් ප්‍රදර්ශනය වන ආකාරයට ගල් ගැසුණාක් මෙන් සිටීමට උපදෙස් දෙන්න. එසේ එකිනෙක සිසුවා නිරූපණය කරන චරිත ගැන සාකච්ඡාවක් කරන්න.

**පියවර 02**

- සිසුන් ගල් ගැසුණු (Freeze)චරිතය නිරූපණය වන සේ අවකාශයේ ඇවිදීමට සලස්වන්න. එසේ නැවත වාර කිහිපයක් ගල් ගැසී සිටීමට උපදෙස් දෙන්න. එහි දී මුලින් ම ශාරීරික ව පමණක් චරිතය ප්‍රකාශ වන ආකාරයට ඇවිදින්න සලස්වන්න. දෙවනු ව මුහුණේ හැඟීම්වලින් ද චරිතය ප්‍රකාශ කරන්න. තෙවනුව චරිතයට අදාළ වචන කිහිපයක් ද ප්‍රකාශ කරමින් ඇවිදීමට ඉඩ සලස්වන්න.
  මෙම ක්‍රියාකාරකමට වාර කිහිපයක් කර අවසන් ව සිසුන්ට රවුම සෑදෙන අයුරින් සිටුවන්න.

**පියවර 03**

- මෙතෙක් කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් කරන්න. එහි දී යම් චරිතයක් ක්‍රියාකරන ආකාරය අනුකරණය යනුවෙන් හැඳින්වෙන බවත්, එසේ චරිතයක් අනුකරණය කිරීමට මිනිස් සිරුර භාවිත කරන බවත් පෙන්වා දෙන්න.
  පරිකල්පනයෙන් මවාගන්නා චරිතය ක්‍රියාකරන ආකාරය තම සිරුර උපයෝගී කරගෙන කර පෙන්වීම චරිත නිරූපණය බවත්, ඒ සඳහා ආංගික, වාචික, සහ සාත්ත්වික අභිනය යොදා ගන්නා බවත් පෙන්වා දෙන්න. මේ ආකාරයට අභිනය භාවිත කරමින් චරිතයකට ආරෝපණය වීම සමාරෝපය ලෙස හැඳින්වෙන බව ද ප්‍රකාශ කරන්න. යම් අයකු චරිතයක් බවට පත් වී එය ප්‍රේක්ෂකයාට දර්ශනය වන විට නළුවා චරිතයට සමාරෝපය වී ඇති බව පෙන්වා දෙන්න.

**පියවර 04**

- සිසුන් සමාන ලෙස කණ්ඩායම් කරන්න. කණ්ඩායම එකතු වී එක් චරිතයක් පමණක් නිරූපණය කළ යුතු බව පෙන්වා දෙන්න. මුලින් ම සංවාදවලින් තොර ව අංගික අභිනයෙන් පමණක් චරිතය නිරූපණය කරන්න. අනෙකුත් කණ්ඩායම් ඔවුන් නිරූපණය කරන චරිතය හඳුනාගත යුතු ය. සැම කණ්ඩායමක් ම මේ ආකාරයට චරිතය නිරූපණය කළ යුතු ය.
- දෙවනු ව සංවාදය ද එකතු කරගෙන මෙම කණ්ඩායම් චරිතය නිරූපණය කළ යුතු ය.
- තුන්වනු ව අංගික, වාචික සහ සාත්ත්වික යන අභිනය හොඳින් ප්‍රකට වන පරිදි මෙම චරිතය නිරූපණය කළ යුතු ය.
- අවසාන වශයෙන් පෙර දැනුම් දීමකට අනුව සකස් කරගත් ඇඳුම් පැලඳුම් සහ අවශ්‍ය නාට්‍යෝපකරණ ද හැකියාව මත අංග රචනය ද භාවිත කර සමූහ රංගනයක් රඟපා ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම අවසන් වූ පසුව සිසුන් සමඟ සාකච්ඡා කරමින් ප්‍රායෝගික ක්‍රියාවලිය නාට්‍ය සිද්ධාන්ත සමඟ සම්බන්ධ කර අදහස් දක්වන්න.

- ''චරිතයක් අනුකරණය කිරීමේ දී සතර අභිනය ම භාවිත වන බවත්, සතර අභිනය ම භාවිත කරමින් චරිතය මැනවින් අනුකරණය කර පෙන්වීමේ දී නළුවා බාහිර ව සහ අභ්‍යන්තර ව චරිතය බවට පත්වීම සමාරෝපය වන බවත් ප්‍රකාශ කරන්න. සමාරෝපය අභ්‍යන්තර ව සහ බාහිර ව වෙනස් වීමට බලපාන සාධක ද සාකච්ඡාවට ගන්න. අවසාන වශයෙන් චරිතයක් නිරූපණය කිරීම සඳහා අනුකරණය සතර අභිනය සහ සමාරෝප ක්‍රියාවලිය ද ඉවහල් වන බවට ප්‍රකාශ කරන්න. ''

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- අවකාශය තුළ නිවැරදි ව සහ ගුරු විධානයට අනුව චලන ඉදිරිපත් කිරීම.
- චරිතයක් නිවැරදි ව ශාරීරික ව අනුකරණය කර පෙන්වීම.
- සමාරෝපය දෙයාකාරයකට වෙනස් වන අයුරු ප්‍රකාශ කිරීම.
- සතර අභිනය භාවිත කරමින් චරිතයක් නිරූපණය කිරීම.
- විවිධ චරිත ඒකල ව හා සාමූහික ව නිරූපණය කර පෙන්වීම.

**පැවරුම** : පාඩමේ දී බෙදන ලද කණ්ඩායම්වලට පන්ති කාලච්ඡේදයන් බැහැර අවස්ථාවල දී පුහුණු වී පන්තියේ ඉදිරිපත් කිරීමට සුදුසු විවිධ චරිත නිරූපණයන් සහිත අවස්ථාවක් නිර්මාණය කිරීමට අවස්ථාව සැලසීම.

නිපුණතාව 3.0 : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකමෙහි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.1.2** : අනුකරණය හා සතර අභිනය උපයෝගී කරගෙන රූපණයෙහි යෙදීම

**ක්‍රියාකාරකම 3.1.2** : රූපණයේ යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- විවිධ චරිත රඟපා පෙන්වයි.
- අභිනය භාවිතයේ වෙනස්කම් හඳුනාගනියි.
- බාහිර ව දැකිය හැකි විවිධ චරිත අනුකරණය කරයි.

ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01**

- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. මුලින් ම ශරීරය උණුසුම් කර ගැනීමේ අභ්‍යාස කිහිපයක යොදවන්න.

සිසුන් අවකාශය තුළ රවුමකට සිටින සේ පෙළ ගස්වන්න. රවුමේ එක් අයකුට කැමති චරිතයක් සංවාද රහිත ව ආංගික ව පමණක් නිරූපණය කරමින් රවුම මැද්දට එන ලෙස ප්‍රකාශ කරන්න. රවුම මැද්දට පැමිණ ස්වල්ප වේලාවකින් රවුමේ සිටින වෙනත් අයකු ළඟට එම චරිතය ම නිරූපණය කරමින් යන ලෙස උපදෙස් දෙන්න. එසේ ගිය විට රවුමේ සිටින සිසුවා තමන් වෙතට චරිතය නිරූපණය කරමින් එන සිසුවා ගේ චරිතය මේ ලෙස ම අනුකරණය කරමින් රවුම මැද්දට පැමිණිය යුතු ය. ඔහු රවුම මැදට පැමිණ එම චරිතයෙන් මිදී වෙනස් චරිතයක් බවට පත් විය යුතු ය. ඔහු ද එම චරිතය නිරූපණය කරමින් රවුමේ සිටින තවත් අයකු ළඟට යා යුතු අතර, ඔහු එම චරිතය අනු කරණය කරමින් රවුම මැදට විත් චරිතය වෙනස් කර ගැනීම කළයුතු ය. මේ ආකාරයට සැම සිසුවකු ම නියෝජනය වන සේ මෙම ක්‍රියාකාරකමේ යෙදවිය යුතු ය.

එය අවසානයේ චරිතයක් අනුකරණය කිරීමේ ක්‍රියාවලිය ගැන සිසුන්ට වටහා දෙන්න. එක් අයකු නිරූපණය කරන චරිතය ම තවත් අයකු ඒ ලෙසට සිදු කරමින් චරිතය අනුකරණය කරන බවත්, එසේ විවිධ චරිත අපට අනුකරණය කිරීමට හැකි බවත් පෙන්වා දෙන්න. චරිතයක් අනුකරණය කරන විට සතර අභිනය ම භාවිත කර චරිතය අනුකරණය කිරීම මඟින් චරිතය වඩාත් හොඳින් නිරූපණය වන බවත් ප්‍රකාශ කරන්න.

**පියවර 02**

ඉහත රවුමේ සිදු වූ ක්‍රියාකාරකම ම නැවත ආරම්භ කරන්න. එහි දී තමන් මුලින් ආංගික ව පමණක් අනුකරණය කළ චරිතය වාචික, සහ සාත්ත්වික අභිනය භාවිත කරමින් නිරූපණය කර දක්වන්න. අවට වටපිටාවෙහි සපයාගත හැකි දේ මඟින් ආහාර්ය අභිනය ද අදාළ කරගෙන සතර අභිනය ම භාවිත කරමින් මෙම ක්‍රියාකාරකම කළ හැකි ය. මෙහි දී චරිත නිරූපණයේ දී අදාළ චරිතය සාර්ථක ව අනුකරණය කරලීම සඳහා සතර අභිනය ද යොදාගත යුතු බව පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධ චරිත ආංගික ව පමණක් අනුකරණය කරයි.
- විවිධ චරිත සතර අභිනය ම භාවිත කරමින් අනුකරණය කරයි.
- චරිත නිරූපණය සඳහා අනුකරණය සහ සතර අභිනය ප්‍රයෝජනවත් වන අයුරු ප්‍රකාශ කරයි.
- විවිධ චරිතවලට වෙනස් වීම සිදු කරයි.
- නිර්දිෂ්ට ග්‍රන්ථවල එන චරිත නිරූපණය කරයි.

**පැවරුම** :

1. කදා වළලු නාට්‍යයේ තමන් කැමති චරිතයක් රඟපා පෙන්වීම සඳහා පුහුණු වී පැමිණෙන ලෙස ප්‍රකාශ කරන්න.

2. තමන් ජීවත් වන වටපිටාවේ දැකිය හැකි කැමති පුද්ගල චරිතයක් නිරීක්ෂණය කර එය අනුකරණය කර පෙන්වීමට සූදානම් ව එන ලෙස දැනුම්වත් කරන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.2** : නූතන වේදිකා නාට්‍යවල ආනුෂංගික කලා භාවිත කොට ඇති ආකාරය විමසයි.

**ක්‍රියාකාරකම 3.2.1** : ආනුෂංගික කලා භාවිතය විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ආනුෂංගික අංග යනු කුමක් ද යි ප්‍රකාශ කරයි.
- රංගයක් සඳහා විවිධ ආනුෂංගික අංග යොදාගනියි.
- නැරඹූ නාට්‍යවල ඇති විවිධ ආනුෂංගික අංග භාවිත කර ඇති ආකාරය පෙන්වා දෙයි.
- ආනුෂංගික අංග වෙන් වෙන් ව හඳුනාගෙන ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- සිංහබාහු/හුණුවටයේ කථාව/කැලණි පාලම/දෙපානෝ/ තලමල පිපිලා/කාලගෝල වැනි හෝ වෙනත් නාට්‍යවලින් තෝරා ගත් සංයුක්ත තැටි
- විවිධ නාට්‍යවලින් තෝරාගත් ඡයාරූප කිහිපයක්

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- 3.1 නිපුණතා මට්ටමේ පාඩමේ අවසානයේ සිසුන්ට ලබාදුන් පැවරුම ආශ්‍රය කරගෙන ආනුෂංගික කලා පිළිබඳ ව විමසීම හෝ පන්ති කාමරයෙන් බැහැර ව රැගෙන ගොස් තමා අවට ඇති පරිසරයෙන් සොයාගත් ද්‍රව්‍ය භාවිත කර චරිතයක් නිරූපණය කිරීමට අවස්ථාව සලසා දී භාවිත කළ ද්‍රව්‍ය ආශ්‍රය කරගෙන ආනුෂංගික අංග යනු කුමක් ද යි වටහා දීම.

- නාට්‍ය යනු සාමූහික කලාවක් වන අතර එය කලා කිහිපයක සම්මිශ්‍රණයෙන් ගොඩනැඟේ. සංගීතය, නර්තනය, චිත්‍ර ආදි සෞන්දර්ය විෂයයන් මෙන් ම විද්‍යාව, ගණිතය වැනි විෂයයන් ද හැදෑරීමෙන් ලබන දැනුම නාට්‍ය නිර්මාණය සඳහා දායක කරගත හැකි ය. නාට්‍යයක් සාර්ථක කරගැනීම සඳහා යොදාගන්නා අතිරේක කලා ආනුෂංගික කලා නමින් හැඳින් වේ. ඒ අනුව සංගීතය, නර්තනය, පසුතල, රංග භාණ්ඩ, ඇඳුම් පැලඳුම් රංගාලෝකය යනාදිය මෙයට අයත් වේ. ආනුෂංගික කලා යොදාගැනීම මඟින් නාට්‍යයේ අවස්ථා, චරිත, තේමාව වඩාත් අර්ථවත් කර ඇතිවීමට හැකි අතර නාට්‍ය පෙළින් කියැවෙන කාලය, යුගය, දේශය, සමාජය, ශෛලිය ආදි විවිධ කරුණු ද ප්‍රේක්ෂකයාට හොඳින් දැනවිය හැකි ය.

**පියවර 02**
- සපයාගෙන ඇති විවිධ සංයුක්ත තැටි සහ ඡායාරූප සිසුන්ට බැලීමට ඉඩ ප්‍රස්තාව ලබාදෙන්න. ඒවායෙහි ආනුෂංගික අංග භාවිත වී ඇති අයුරු වටහාගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න. පහත කරුණු පිළිබඳ ව අවධානය යොමු කරවන්න.
  - චරිතවල බාහිර ලක්ෂණ ඉස්මතු කිරීම සඳහා වේශභූෂණ සහ අංග රචනය යොදාගැනීම සිදු කරයි.
  - කථාවේ පසුතලය පිළිබඳ ව ප්‍රකාශ කිරීමට වේදිකා පසුතල යොදාගත හැකි ය.

උදා:		කැලණි පාලම - පාලම සහ පැල්පත්
		තලමල පිපිලා - නුගගස

- ගායනය, සංගීතය හා නර්තනය වැනි ආනුෂංගික අංග යොදාගැනීමෙන් අර්ථය සහ රසය වඩාත් හොඳින් තීව්‍ර කරගත හැකි වේ. නාට්‍ය වඩාත් චමත්කාරජනක කර ගැනීමට ද උපකාර වේ.

උදා: මනමේ, සිංහබාහු , තොප්පි වෙළෙන්දා , රාජකපුරු - ගීත ගායනය, නර්තනය, රංගනය මැනවින් යොදාගෙන ඇත.

- රූපණ කාර්යයේ දී නළුවාට නාට්‍යෝපකරණ අවශ්‍ය වේ. චරිතය පෙන්වීමටත්, රූපණය සාර්ථක කර ගැනීමටත් ඒවා ඉවහල් වේ.
  උදා: තලමල පිපිලා - සම්මානය, බෙරය
  මනමේ - දුනු හී, කඩුව
- වේදිකා රංගනය වඩාත් අර්ථවත් සහ සෞන්දර්යාත්මක කර ගැනීමට රංගා ලෝකය ද අවශ්‍ය වේ. වේදිකා රංගනය වර්ණවත් වන්නේ ආලෝකය භාවිතය නිසාවෙනි.
  උදා: විකෘති, තොප්පි වෙළෙන්දා, සිංහබාහු, හුණුවටයේ කථාව වැනි නාට්‍ය දැක්විය හැකි ය.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ආනුෂංගික අංග වෙන් වෙන් ව දැක්වීම.
- නාට්‍යයකට අවශ්‍ය ආකාරයට ආනුෂංගික අංග යෙදීම.
- විවිධ නාට්‍යවල ඇති ආනුෂංගික අංග පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- ආනුෂංගික අංගවලින් නාට්‍යයකට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව ප්‍රකාශ කිරීම.
- නිර්මාණාත්මක ව විවිධ ආනුෂංගික අංග භාවිත කිරීම.

**පැවරුම** : සිසුන් නරඹා ඇති නාට්‍යවලින් දෙකක් තෝරාගෙන එහි ආනුෂංගික අංග පිළිබඳ ව විස්තර පහත වගුවෙහි දක්වන්න.

| ආනුෂංගික කලා | 1. නාට්‍යය ....................... නාට්‍යයේ නම ලියන්න | 2. නාට්‍යය .................. නාට්‍යයේ නම ලියන්න |
|---|---|---|
| සංගීතය | | |
| නර්තනය | | |
| වේශභූෂණ | | |
| අංග රචනය | | |
| නාට්‍යෝපකරණ | | |
| පසුතල නිර්මාණය | | |
| රංගාලෝකය | | |

භාවිත ආනුෂාංගික අංගය ගැන කෙටියෙන් අදාළ ආනුෂංගික අංගය ඉදිරියෙන් ලියන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.3** : සිසුන් විසින් නිර්මාණය කරන ලද නාට්‍ය පෙළට අදාළ ව නිර්මාණාත්මක ව ආනුෂංගික කලා භාවිත කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍යයක ආනුෂංගික අංග නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- නාට්‍යයකට ආනුෂංගික අංග අවශ්‍ය වුව ද අත්‍යවශ්‍ය නොවන අවස්ථා ද ඇති බව පිළිගනියි.
- නිසි අවබෝධයකින් තොර ව ආනුෂංගික අංග භාවිතය මඟින් නිර්මාණය සඳහා අනපේක්ෂිත බාධා හා අවාසි සිදු විය හැකි බව අවබෝධ කරගනියි.
- ආනුෂංගික අංග සැලැසුම් කිරීමේ දී නාට්‍ය පිටපත හොඳින් අධ්‍යයනය කළ යුතු බව පිළිගනියි.
- නාට්‍යයක් නිර්මාණය කරන රංග ශෛලිය, මෙන් ම පිටපත වෙත ලබාදෙන අර්ථකථනය පිළිබඳව ද ආනුෂංගික අංග නිර්මාණයේ දී සැලකිලිමත් වෙයි.
- ආනුෂංගික අංග නිර්මාණයේ දී සෙසු ශිල්පීන් සමඟ ද සම්බන්ධ විය යුතු බව පැහැදිලි කරයි.
- නිවැරදි අවබෝධයකින් යුතු ව ආනුෂංගික අංග නිර්මාණයට පෙලැඹෙයි.

**ගුණාත්මක යෙදැවුම්** : ළමයි විසින් රචනා කරන ලද නාට්‍ය පිටපත්
ආනුෂංගික භාවිතයන් පැහැදිලි කළ හැකි නාට්‍ය කිහිපයක වීඩියෝ පට
විවිධ නාට්‍ය කිහිපයක ඡායාරූප

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- ආනුෂංගික අංග පිළිබඳ ව අවධානය යොමු කරමින් විවිධ නාට්‍ය නිර්මාණ කිහිපයක වීඩියෝ දර්ශන කොටස් කිහිපයක් හා නාට්‍ය පිළිබඳ ඡායාරූප කිහිපයක් ප්‍රදර්ශනය කරන්න.

- විවිධ නාට්‍ය නිර්මාණයන්හි නාට්‍ය කරුවා විවිධ වෙනස්කම් සහිත ව ආනුෂංගික අංග භාවිත කර ඇති බව අවබෝධ කර දෙන්න.

- නරඹන ලද නාට්‍ය නිර්මාණ කොටස් ඇසුරින් නාට්‍යයක සාර්ථකත්වය සඳහා කොතෙක් දුරට ආනුෂංගික අංග බලපාන්නේ දැ යි පැහැදිලි කර දෙන්න.

- වේදිකා උපකරණ, වේදිකා පසුතල නිර්මාණ ආදිය නොමැති වුව ද නාට්‍යයක් සාර්ථක ලෙස ඉදිරිපත් කළ හැකි බව වීඩියෝ දර්ශන ඡායාරූප ඇසුරින් පෙන්වා දෙන්න.

  උදා: මනමේ , රත්නාවලී, චරන්දාස්,

  පහත කරුණු ද ඇතුළත් කර ගනිමින් සිසුන් සමඟ සාකච්ඡාවක් ගොඩනඟන්න.

නාට්‍යෝපකරණ

- සැබෑ ජීවිතයේ දී භාවිත කරන උපකරණ හා වේදිකා නාට්‍ය සඳහා භාවිත කරන උපකරණ අතර වෙනස්කම් ඇත.
- සැහැල්ලු බව, සරල බව, පිටපත මඟින් අපේක්ෂිත අර්ථ හෝ සංකේත හෝ ප්‍රකාශනයන්ට සහාය වීම ආදි ගුණාංග නාට්‍යෝපකරණවල තිබිය යුතු ය.
- නාට්‍යයක් සඳහා නිර්මාණය කරනු ලබන නාට්‍යෝපකරණ වේ නම් ඒවා නාට්‍යය හා අත්‍යන්තයෙන් සම්බන්ධ ඒවා විය යුතු ය. එනම් නාට්‍යයේ විකාශයේ දී කවර අවස්ථාවක හෝ එම උපකරණ කවර හෝ අවශ්‍යතාවක් සඳහා භාවිත විය යුතු ය.
- ඇතැම් විට නාට්‍යෝපකරණ ප්‍රමාණයන් විශාල ලෙස අතිශයෝක්තියට බර ව හෝ සැබෑ ප්‍රමාණයට වඩා කුඩාවට හෝ නිර්මාණය කරන අවස්ථා ඇත. එය නාට්‍යය මඟින් ප්‍රකාශිත අර්ථය හෝ රංග ශෛලිය හෝ අනුව තීරණය කළ යුත්තකි.
- නාට්‍ය උපකරණ භාවිත නොකරමින් අභිරූපණ හෝ වෙනත් උපක්‍රම මඟින් මේවා ප්‍රේක්ෂක මනසෙහි මවමින් රූපණය සිදු කරන අවස්ථා ද ඇත.

පසුතල නිර්මාණ

- පසුතල නිර්මාණකරණයේ දී නාට්‍යය ඉදිරිපත් කරන රංග ශෛලිය පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.
- පිටපත හොඳින් අධ්‍යයනය කරමින් පිටපත මඟින් අපේක්ෂා කරන ලබන පරිසරය පසුතල නිර්මාණකරුවා විසින් නිර්මාණය කළ යුතු ය.
- නාට්‍ය පිටපතෙහි සඳහන් යුගය, ප්‍රදේශය ආදිය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ඒ සඳහා නිවැරදි අවබෝධයක් ලබා ගැනීම සඳහා විවිධ මූලාශ්‍රය ආශ්‍රය කරගනිමින් අධ්‍යයනයක් කළ යුතු වෙයි.

  උදා: අනුරාධපුර යුගයට අයත් කතා පුවතක් නම් එම යුගය පිළිබඳ තොරතුරු සපයාගත හැකි සිතුවම්, කැටයම්, ඓතිහාසික මූලාශ්‍රය ආදිය අධ්‍යයනය කිරීම)

- සංවාද හෝ ගීත හෝ මඟින්, සංකේතාත්මක ව මිනිස් සිරුර උපයෝගී කරගනිමින්, අලෝක උපක්‍රම යොදා ගනිමින් හෝ විචිත්‍ර වස්ත්‍ර යොදා ගැනීම වැනි ක්‍රමවේදයන් භාවිත කරමින් ද වේදිකා නාට්‍ය සඳහා පසුතල නිර්මාණය කළ හැකි ය.
- පසුතල නිර්මාණ කාර්යයේ දී වේදිකාවේ ඉඩකඩ හැසිරවීම පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය. මන්ද අත්‍යවශ්‍ය ලෙස විශාල ඉඩ ප්‍රමාණයක් වේදිකා පසුතල සඳහා වැය කිරීම හේතුවෙන් රූපණ කාර්යයට බාධා ඇති විය හැකි බැවිනි.

- පසුතල නිර්මාණ මඟින් සිදු විය යුත්තේ නළුවා හා රූපණ කාර්යය ඉස්මතු කර දැක්වීම යි. එහි භාවිත වර්ණ, හැඩතල ආදියෙන් නළුවා යටපත් වීම හෝ රූපණ කාර්යය ඉක්මවා පසුතල නිර්මාණ කෙරෙහි ප්‍රේක්ෂක අවධානය යොමු වීම සිදු නොවීමට වග බලා ගත යුතු ය.

- පහසුවෙන් හැසිරවිය හැකි වීම, පහසුවෙන් ගබඩා කළ හැකි වීම පහසුවෙන් ප්‍රවාහණය කළ හැකි වීම හා අඩු වියදමකින් උපරිම ප්‍රයෝජන ගත හැකි පරිදි පසුතල නිර්මාණය කිරීම පිළිබඳ ව සැලැකිලිමත් වෙමින් පසුතල නිර්මාණ සැලැසුම් කළ යුතු ය.

- 7, 8 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි සඳහන් කර ඇති පසුතල නිර්මාණ පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කිරීම වැදගත් ය.

අංග රචනය

- අංග රචනා නිර්මාණයේ දී පිටපත හොඳින් අධ්‍යයනය කළ යුතු ය.
- නාට්‍යය මඟින් නිරූපිත ප්‍රදේශය හා යුගය පිළිබඳ ව අංග රචනා සැලැසුම් කිරීමේ දී ද අවධානය යොමු කළ යුතු වෙයි.
- නාට්‍යයන් සඳහා අංග රචනය ආකාර කිහිපයකින් වැදගත් වෙයි.
  - ප්‍රේක්ෂකයාට චරිත හඳුනා ගැනීමට උපකාරී වීම.
  - චරිත පිළිබඳ ව නළුවා තුළත් ප්‍රේක්ෂකයා තුළත් විශ්වසනීයත්වයක් ගොඩනැඟීමට හැකිවීම.
  - නළුවා හට සමාරෝපය සඳහා සහාය වීම.
  - ආලෝකකරණ තත්ත්වයන් යටතේ යටපත් විය හැකි මුහුණේ හැඩතල, ඉරියවු හා ත්‍රිමාණ ලක්ෂණ මතුකර දැක්වීම ආදිය ඒ අතර වෙයි.
- අංග රචනයේ දී විවිධ ආලේපන පරිස්සමින් ගැල්වීම සිදු කරනුයේ සජීව නළුවා ගේ සම මත බැවින් ඉතා පරිස්සමින් එය සිදු කළ යුතු වෙයි. සමට හානිකර ද්‍රව්‍ය භාවිතය මඟින් විවිධ ගැටලු මතු විය හැකි බැවින් වෙළෙඳ පොළෙහි ඇති අනුමත ද්‍රව්‍ය හා උපකරණ පමණක් අංග රචනා සඳහා යොදාගත යුතු වෙයි.

උදා:
- මුහුණෙහි පදනම් ආලේපය සඳහා යොදන ද්‍රව්‍ය
- රැවුළ හා වෙනත් දේ ඇලවීම සඳහා ස්පිරිට් ගම් භාවිතය
- වර්ණ ගැන්වීම සඳහා lining colours වර්ග භාවිතය

වේෂභූෂණ

- නාට්‍යයක චරිත සඳහා නිර්මාණ කරනු ලබන ඇඳුම්, පැලඳුම් ආභරණ ආදිය පොදුවේ වේශභූෂණ ලෙස හඳුන්වයි.
- නළුවා ගේ බාහිර සමාරෝපයටත්, අභ්‍යන්තර සමාරෝපයටත් වේශ භූෂණ ඉතා වැදගත් වෙයි.
- ප්‍රේක්ෂකයන් හට නාට්‍යයක චරිත හඳුනාගැනීමටත්, රසවින්දනය හා විශ්වසනීයත්වයක් ගොඩ නැංවීමටත් වේශභූෂණ වැදගත් ය.
- වේශභූෂණ නිර්මාණයේ දී නාට්‍යය ඉදිරිපත් කරන රංග ශෛලිය, පිටපතෙහි සඳහන් යුගය හා දේශය ආදිය පිළිබඳ ව විශේෂ අවධානය යොමු කළ යුතුය.
- නළුවන් හට පහසුවෙන් දරා සිටිය හැකි වීමත්, රඟපෑමේ දී සහායක් මිස බාධාවක් සිදු නොවීමත් පිළිබඳ ව වේශභූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු ය.
- වේශභූෂණ නිර්මාණයේ දී සෙසු ආනුෂාංගික ශිල්පීන් සමඟ ද සාකච්ඡා කර තීරණ ගැනීම වඩාත් ප්‍රායෝගික ය.

**පියවර 02**

- සිසුන් කණ්ඩායම් 04 කට බෙදන්න. ඒ ඒ කණ්ඩායම් සඳහා සිසුන් විසින් මීට පෙර ලියන ලද නාට්‍ය පිටපත් අතුරින් තෝරාගත් නාට්‍ය පිටපතක ඡායා පිටපත බැගින් ලබාදෙන්න.
- නාට්‍යෝපකරණ, පසුතල නිර්මාණ, අංග රචනය හා වේෂභූෂණ, යන මාතෘකා අතුරින් එක් එක් මාතෘකා කණ්ඩායම් වෙත ලබාදෙන්න.
- පෙර වසරවල පාඩම්වලින් ද අත්දැකීම් එක්කර ගනිමින් තම කණ්ඩායමට ලැබුණු මාතෘකාවලට අදාළ ව ආනුෂංගික අංග සැලැසුම් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

**පියවර 03**

- තෝරාගත් නාට්‍ය පිටපත වේදිකාගත කිරීම සඳහා සුදුසු පරිදි ඒ ඒ කණ්ඩායම් විසින් සැලැසුම් කළ ආනුෂංගික අංග ප්‍රායෝගික ව භාවිතයට අවස්ථාව සලසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ආනුෂංගික අංග නම් කිරීම.
- ආනුෂංගික අංග මඟින් නාට්‍ය කලාවට ලැබෙන ප්‍රයෝජන හැඳින්වීම.
- ආනුෂංගික අංග සැලැසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කිරීම.
- නාට්‍යයක් නැරඹීමේ දී එහි ආනුෂංගික අංග භාවිත කර ඇති ආකාරය සොයා බැලීමට උනන්දුවක් දැක්වීම
- නිර්මාණාත්මක ව සෛද්ධාන්තික කරුණු පිළිබඳ අවබෝධයකින් යුතු ව ආනුෂංගික අංක සැලැසුම් කිරීමට හැකියාව ප්‍රකාශ කිරීම.

**පැවරුම** : ඔබ විසින් නරඹන ලද නාට්‍යයක භාවිත කර ඇති ආනුෂංගික අංග හඳුනාගෙන කෙටියෙන් විස්තර කරන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.4** : රූපණ අභ්‍යාසවල යෙදෙයි.

**ක්‍රියාකාරකම 3.4.1 :** **''දර්පණ තල'' අභ්‍යාසයෙහි යෙදෙයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- රූපණයේ දී දෑස් වැදගත් වන බව වටහා ගනී.
- දර්පණ තල අභ්‍යාසයේ යෙදෙයි.
- රංගනයේ දී සාත්ත්වික භාව නිරූපණය නිවැරදි ව යොදාගැනීමට අවශ්‍ය අවබෝධය ලබයි.
- නිවැරදි ව අංග රචනයෙහි යෙදෙයි.

**ගුණාත්මක යෙදැවුම්** : • නාට්‍ය ඡායාරූප කිහිපයක්

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- සිසුන් නිදහස් ස්ථානයකට රැගෙන යන්න. අවකාශය භාවිත කර සිරුර උණුසුම් කරගැනීමේ මූලික අභ්‍යාස කිහිපයක ම යොදවන්න. අනතුරු ව රවුමක් සිටින සේ සිසුන් පෙළ ගස්වා නාට්‍ය, ඡායාරූප එකිනෙක අත යවමින් ඒවා හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසන්න. ඒ ඡායාරූපවල දැකිය හැකි දේ පිළිබඳ ව ප්‍රශ්න කරමින් චරිතවල භාව නිරූපණ සඳහා මුහුණේ අංග භාවිත වී ඇති අයුරුත්, එයින් ඇස් ප්‍රධාන වන බවත් අවබෝධ කරවන්න. චරිත නිරූපණයේ දී එකිනෙකා අක්ෂි සම්බන්ධතාව රැකගනිමින් නිරූපණයෙහි යෙදිය යුතු බව පෙන්වා දෙන්න. ඡායාරූපවලින් ද මේ බව අවබෝධ කරවන්න. මේ හැකියාව වර්ධනය කර ගැනීමට විවිධ රංග අභ්‍යාස යොදාගත හැකි බව පෙන්වා දී දර්පණ තල අභ්‍යාසයට සිසුන් සූදානම් කරන්න.

**පියවර 02**

සිසුන් සමාන කොටස් දෙකකට බෙදන්න. එකිනෙකට මුහුණලා සිටින සේ සමාන්තර පේළි දෙකකින් යුක්ත ව සිටින්න. මෙහි දී එක් කණ්ඩායමක් දර්පණය ( කණ්ණාඩිය) ලෙසත්, අනෙක් කණ්ඩායම මිනිසා ලෙසත් නම් කරන්න. මිනිසා ලෙස නම් කරන ලද කණ්ඩායම මුහුණේ උපාංග චලනය කරන විට කණ්ණාඩිය ලෙස නම් කරන ලද කණ්ඩායමේ අය එය ඒ ආකාරයට ම අනුකරණය කළ යුතු ය. ඒ අනුව මිනිසා පේළියේ එක් අයකු කරන චලනය ඔහු ඉදිරියේ කණ්ණාඩිය ලෙස සිටින අය එලෙස ම අනුකරණය කළ යුතු වේ. මෙම පියවරේ දී කණ්ණාඩිය වූ අය මිනිසා වෙමින් ද, මිනිසා වූ අය කණ්ණාඩිය වෙමින් ද වාර කිහිපයක් මුහුණේ උපාංග චලනය කරමින් අභ්‍යාසයේ යෙදෙන්න.

**පියවර 03**

කිහිප අවස්ථාවක් එකිනෙක පිරිස මුහුණේ උපාංග චලනය කරන ක්‍රියාවලිය අවසන් වූ පසු ව සාත්ත්වික ව භාව නිරූපණය සඳහා අවස්ථාව සලසා දෙන්න. ඒ අනුව සතුට, දුක, විස්මය, ඊර්ෂ්‍යාව, බිය, පිළිකුල වැනි භාවයන් නම් කර ඒවා මෙම කණ්ඩායම් කණ්ණාඩිය, මිනිසා යනුවෙන් වෙනස් වෙමින් වාර කිහිපයක් ම කර දක්වන්න.

**පියවර 04**

- මෙම රංග අභ්‍යාසය අවසානයේ සිසුන් සමඟ සාකච්ඡාවක නිරත වෙමින් සිසුන් එයින් ලද අත්දැකීම ගැන විමසන්න.
    - රංගනයේ දී සාත්ත්වික භාව නිරූපණය සම්බන්ධ වන අයුරුත් අක්ෂි සම්බන්ධතාවේ (Eye Contact ) වැදගත් කමත් අවබෝධ කරවන්න.
    - නිර්දිෂ්ට ග්‍රන්ථයකින් හෝ වෙනත් නාට්‍ය ග්‍රන්ථයකින් හෝ තෝරාගත් සංවාද ඛණ්ඩයක් සිසුන් දෙනෙකුට ලබා දී රඟපෑමේ දී අක්ෂි සම්බන්ධතාවේ ඇති වැදගත්කම ප්‍රායෝගික ව අවබෝධ කරවන්න.
    - නිර්මාණශීලීත්වය, ක්ෂණික ව ක්‍රියාකිරීම, අනුකරණ කුශලතාව, යන ආදි ගුණාංග ද වර්ධනය වීමට දර්පණතල අභ්‍යාසය බලපාන අයුරු පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ː**

- අනුකරණ ක්‍රියාවන් ප්‍රගුණ කිරීම.
- විවිධාකාරයේ හැඟීම් නිරූපණය කිරීම.
- අභියෝගාත්මක නිරූපණ ක්‍රියාවන් නිර්මාණය කිරීම.
- අභිරූපණ රංගනයේ යෙදීම.
- අක්ෂි සම්බන්ධතාව සහිත රංගන අවස්ථා ඉදිරිපත් කිරීම.

–

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.5** සතර අභිනය භාවිත කරයි.

**ක්‍රියාකාරකම 3.5.1** : සාත්ත්වික අභිනය භාවිත කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- රූපණයේ දී අභ්‍යන්තර මනෝභාව මුහුණින් ප්‍රකාශ වන බව පවසයි.
- භූමිකාව අනුව සාත්ත්වික අභිනයන් විවිධාකාර වන බව අවබෝධ කරගනියි.
- විවිධ මනෝභාව නිරූපණය කර දක්වයි.
- සාත්ත්වික අභිනයේ සාර්ථකත්වයට අනෙකුත් අභිනය හේතු වන බව අවබෝධ කරගනියි.

**ගුණාත්මක යෙදැවුම්** : නාට්‍ය රචනයේ දී විවිධ මනෝභාවයන් ප්‍රකාශ වන පින්තූර කිහිපයක්
1. මනමේ නාට්‍යය, හුණුවටයේ කථාව නාට්‍යය, තලමල පිපිලා නාට්‍යය, කාලගෝල නාට්‍යය වැනි නාට්‍යවල හෝ
2. වෙනත් විදේශීය නාට්‍ය කෘතිවල හෝ විවිධ හැඟීම් ප්‍රකාශ වන ඡායාරූප කිහිපයක්

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- පන්තියේ සිසුන් සියලු දෙනාට ම ගුණාත්මක යෙදැවුම්වල දක්වා ඇති වර්ගයේ හෝ වෙනත් නාට්‍යවල හෝ ඡායාරූප කිහිපයක් නැරඹීමට ලබා දී ඒ මඟින් සාත්ත්වික භාව නිරූපණය පිළිබඳ ව සාකච්ඡාව ආරම්භ කරන්න. එහිදී පහත සඳහන් කරුණු ද සාකච්ඡාවට එක් කරන්න.
  - සාත්ත්වික අභිනය යනු මනස මූලික ව හට ගන්නා භාවයන් ශාරීරික වශයෙන් ප්‍රකට කරවීම යි. මෙම වෙනස්කම් චරිතවල පාලනයෙන් තොර ව සිදු වන බව
    උදා: දහදිය දැමීම, ඇඟ වෙවුලීම, රෝමෝද්ගමනය, සිරුර දරදඬු වීම, ගැස්ම ආදිය වේ.
  - රූපණයේ සාර්ථකත්වය සඳහා සාත්ත්වික අභිනය බලපාන අතර චරිතයක අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා බෙහෙවින් ම උපකාරී වේ.
  - වෙස්මුහුණු පලඳින අවස්ථාවක දී සාත්ත්වික අභිනයට බාධා සිදුවේ.
  - නාට්‍යයේ ශෛලිය හා ප්‍රභේද අනුව ද සාත්ත්වික අභිනයේ වෙනස්කම් සිදුවේ.

**පියවර 02**
- සිසුන් සමාන ලෙස (5ක් පමණ) කණ්ඩායම්වලට බෙදන්න. එම කණ්ඩායම්වලට ස්වල්ප වේලාවක් සාකච්ඡා කර මුහුණින් හැඟීම් ප්‍රකාශ වන අවස්ථාවක් හෝ ක්‍රියාවක් හෝ නිරූපණය කර පෙන්වීමට ඉඩ සලසන්න. එහි දී වෙනත් කිසි දු අභිනයන් එකතු කර ගැනීම නොකළ යුතු ය. දෙවනු ව ඒ සඳහා ආංගික, වාචික. ආහාර්ය වැනි අභිනයන් ද එකතු කරගෙන නැවත එම අවස්ථාව හෝ ක්‍රියාවක් හෝ නිරූපණය කිරීම සඳහා යොමු කරවන්න. අවසානයේ නැවත සිසුන් සමඟ සාකච්ඡා කරමින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරවන්න.

**පියවර 03**

- විවිධ භූමිකා මඟින් ප්‍රකට වන සාත්ත්වික අභිනය විවිධ වේ.
- චරිතයක ප්‍රබල හෝ දුබල හෝ බව ඉස්මතු වීම කෙරෙහි සාත්ත්වික අභිනය ප්‍රධාන වශයෙන් ම බලපායි.
- සාත්ත්වික භාව නිරූපණය වඩාත් ප්‍රබල වීමට, මැනවින් ඉදිරිපත් කිරීමට, ඒ සමග වාචික, ආංගික, ආහාර්ය අභිනය ද එක් විය යුතු බව පියවර 02 කි. රංගනයෙන් අවබෝධ කරවන්න.
- කණ්ඩායමක් වශයෙන් නිරූපණයේ යෙදෙන විට සෙසු භූමිකාවල සාත්ත්වික නිරූපණය ගැන ද සැලකිලිමත් වෙමින් ඒවා අතර අන්තර් සම්බන්ධතාවක් ගොඩනගා ගත යුතු බව පෙන්වා දෙන්න.
- අංග රචනය, වේශභූෂණ, රංගාලෝකය, නාට්‍යෝපකරණ ආදි ආනුෂංගික අංග භාවිතය ද සාත්ත්වික අභිනය නිරූපණයේ දී ප්‍රබල ව උපකාරී වන බව ද පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධ සාත්ත්වික භාව නිරූපණය
- සාමූහිකව රංගන අවස්ථා ගොඩනැගීම.
- සතර අභිනය ම එකට එකතු කරගත් ක්‍රියා නිරූපණයන් ඉදිරිපත් කිරීම.
- ආනුෂංගික අංග යොදාගෙන සාත්ත්වික අභිනය ප්‍රබල කරන අවස්ථා නර්තනය කරයි.
- සාත්ත්වික භාව නිරූපණය සඳහා ඉවහල් වන මුහුණේ උපාංග නම් කරයි.

**පැවරුම** : පහත දැක්වෙන තොරතුරු පත්‍රිකා භාවිත කර පෙර බෙදන ලද කණ්ඩායම්වලට රංගන අවස්ථාවක් නිර්මාණය කරන ලෙස දැනුම් දෙන්න.

තොරතුරු පත්‍රිකාව

ඔබේ කණ්ඩායමේ සියලු සිසුන් නියෝජනය වන පරිදි පහත දැක්වෙන සිද්ධීන්ට අනුව රූපණයේ යෙදෙන්න.

Ⅰ අවස්ථාව : (දුක) නිවසේ බල්ලා නොනවත්වා ම බුරමින් සිටී. ගෙහිමියා පැමිණ බල්ලාට සැර කර උඹ ලිහා දමයි. උ? වහ වහා පාරට පනියි. පාරේ ගමන් ගන්නා වාහනයට බල්ලා අහු වෙයි. බල්ලා දෙස බලා ගෙහිමියා ඇතුළු පවුලේ සියලු දෙනා දැඩි ලෙස දුකටත් කම්පනයටත් පත් වෙති.

Ⅰ අවස්ථාව : (බිය) නිවසේ දොරට යමෙක් තට්ටු කරයි. ගෙහිමි කාන්තාව වසා තිබූ දොර ඇර බලයි. එවිට දකින්නේ යකකුගේ ස්වරූපය ඇත්තෙකි. ගෙහිමි කාන්තිාව දැඩි ලෙස බිය වී කෑ ගසයි.

Ⅲ අවස්ථාව : (සතුට) තැපැල් කරු නිවසට පැමිණෙයි. සීනුව නාද වෙයි. එක් දූරියක් තැපැල්කරු වෙත දිව යයි. තැපැල්කරු ලිපියක් දිගු කරයි. දූරිය එය කඩා බලයි. සතුට දනවන කරුණක් ලිපියේ ඇති බව පෙනේ. ක්‍රමයෙන් ලිපිය කියවීමේ දී මුහුණේ ඉරියවු වෙනස් වී අධික සතුටක් ඇති වන අයුරු පෙනේ. සතුට ඉහවහා ගෝස ලිපිවේ සඳහන් දේ අන්‍යයන්ට ප්‍රකාශ කිරීඹට කෑ ගසමින් නිවසට දිව එයි. නිවසේ සියල්ලෝ ම ලිපිය බලා සතුට ප්‍රකාශ කරති

.

| | |
|---|---|
| IV අවස්ථාව : | (පිළිකුල) ළමයෙක් දිය නෑමට ළිඳට යයි. ළඳට බාල්දිය දැමීමට හදන අවස්ථාවේ ළිඳ තුළ යමක් පෙනේ. ඇය ළිඳට එබිකම් කර බලයි. අවට සිටින්නන්ට ද කථා කරයි. සියල්ලෝ ම ළිඳට එබී බලති. යමෙක් අසල තිබූ කොක්කක් සහිත ලීයක් ළිඳට දමා අමාරුවෙන් යමක් ගොඩ ගනී. ලීයේ පැටලී ඇත්තේ පූසෙකි. ''පූසෙක්'' යයි අවට සිටින්නෝ කෑ ගසති. පූසා මිය ගොස් ය. ඌ ඉදිමී ගඳ ගසන බව අයෙක් පවසති. ඇතැමෙක් පිළිකුල අභිනයෙන් දක්වති. |
| V අවස්ථාව : | (ආදරය) මවට ඉපදුණු අලුත් මල්ලී අද නිවසට ගෙනෙන දවස යි. එක් දරුවෙක් අම්මාත් තාත්තාත් මල්ලී ගෙනෙන තුරු මඟ බලමින් සිටී. (වාහනයක ශබ්දයක් ඇසෙයි) දරුවා ඇත මෑත බලයි. අම්මා මල්ලී තුරුලු කරගෙන එනු පෙනේ. දරුවා සතුටින් උඩ පනී. ඔහු අම්මා එන ඉදිරියට දිව යයි. අම්මා අත පහත් කර චූටි මල්ලියා දරුවාට පෙන්නයි. ඔහුට ඉමහත් සතුටක් දැනෙයි. ගෙදර සියල්ලෝ ම දුව විත් අලුත උපන් බිළිඳාගේ හැඩරුව බලා සතුටු වෙති. |

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.5** : සතර අභිනය භාවිත කරයි.

**ක්‍රියාකාරකම 3.5.2** : ශරීරයේ නම්‍යශීලී බව ඇති කරගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ශරීරාංග විවිධාකාරයට චලනය කර දක්වයි.
- ශරීරාංග චලනයෙහි විවිධ අදහස් ප්‍රකාශ කරයි.
- ශාරීරික අභ්‍යාසවල යෙදීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන නම් කරයි.
- රඟපෑම සඳහා ශරීර නම්‍යතාව අවශ්‍ය බව අවබෝධ කරගනියි.

**ගුණාත්මක යෙදැවුම්** : •

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- සිසුන් නිදහස් ස්ථානයකට රැගෙන යන්න. ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සුදුසු ඇඳුමක් භාවිත කරන්න. සිසුන් රවුමට සිටින සේ අවකාශය තුළ හසුරුවන්න. රවුම තුළ වේගයෙන් සහ සෙමෙන් ඇවිදවන්න. ගුරු සංඥාවකට අනුව ඇවිදින දිශාව ඉදිරියට සහ ආපසු හැරීම යන ලෙස වෙනස් කරන්න. සංඥා මඟින් එය ක්ෂණික ව ඉදිරියට හැරීම සහ ආපසු හැරීම ලෙස වෙනස් කරවන්න. ක්‍රමයෙන් ඇවිදීම වේගවත් කරන්න. වෙනස් කිරීම ද වේගවත් කරන්න.

**පියවර 02**

- හොඳින් සිරුර උණුසුම් වන සේ පළමු පියවරේ දී ඇවිදීමේ අභ්‍යාසයේ යොදවා අවසන් කර රවුමට ම සිටින්නට සලස්වා පහත සඳහන් අභ්‍යාසවල යොදවන්න.

  මෙම සියලු අභ්‍යාස දකුණ සහ වම් පසට 5 වරක් බැගින් 10 වරක් නිරත කරවීම ප්‍රමාණවත් ය.

- පළමු ව දකුණු කකුල දණ හිස ළඟට ඔසොවා පයේ ඇඟිලි නවමින් දිග හරින්න.
- දෙවනුව පාදයේ ඇස්වටය අසලින් දෙපසට ම කරකවන්න. පාද දෙක ම එලෙස අභාසයෙහි යෙදවීම අවශ්‍ය ය.
- පා ඇඟිලිවලින් රවුමේ ඇවිදීමට සලස්වන්න.
- සියලු චලන තාලයට අනුකූල ව සිදු කරවිය යුතු ය. විලම්බ ලය මධ්‍ය ලය සහ ද්‍රැත ලයට අදාළ ව සංඥා පසයන්න.
- විලුඹින් ඇවිදීම
- පාදයේ සුළැඟිල්ල බිමට ස්පර්ශ වන සේ පා පෙරළා ඇවිදීම
- පාදයේ මහපටැඟිල්ල බිමට ස්පර්ශ වන සේ ඇවිදීම
- දෑත් දිගු කර, අත්ල ඉදිරියට ගෙන ඇඟිලි නවමින් දිග හරවන්න.
- දකුණු අතේ මැණික් කටුව ළඟින් දකුණු පසට හා වම්පසට 5 වතාව බැගින් කරකැවීමට උපදෙස් දෙන්න.
- උරහිස අසලින් දකුණු සහ වම් දෑත් ඉදිරියෙන් සහ පසුපසට කරකැවීම
- ගෙලට අභ්‍යාස - දෙපසට හැරවුමට ගෙල කරකැවීම
- ඉගට අභ්‍යාස - දෙපා ඈත් කර, වේගනේ දෙපසට ඉන හැරවීම (දෙපසට ම)

- දෙපා ඇත් කර, දකුණු පාදය සඳහා වම් අත ද, වම්පාදය සඳහා දකුණු අත ද වශයෙන් දෙපසට නැමීම
- තාලයකට අනුව උඩ පැනීම
- ශාරීරික අභ්‍යාසවලින් අනතුරු ව රංග ක්‍රීඩාවක නිරත කරවන්න.
- තාලානුරූපී ව භූමිය පුරා ඇවිදීමට සලස්වන්න.
- විධානයන්ට අනුරූපී ව ක්ෂණික ව කටයුතු කිරීමට යොමු කරවන්න
  අංක 1 ලෙස විධානය කරද්දී මෙතෙක් ඇවිදීමෙහි යෙදී සිටි ළමුන් තනි තනි ව සිට ගත යුතු ය.
  අංක 2 දී දෙදෙනෙක් අත් අල්ලාගෙන නවතිති.
  අංක 3 දී තිදෙනෙක් අත් අල්ලාගෙන නවතිති.
  ''අහස'' ලෙසින් විධානය ලද කල උඩ බැලිය යුතු ය.
  ''පොළොව'' යන්නට බිම බැලිය යුතු අතර ''උඩ යන්නට උඩ පැනීම ද බිම යන්නට බිම ඉඳ ගැනීම ද
  ''කූඩු' යන්නට දෙදෙනෙකු අත් ඉහළට ඔසොවා නිවෙසක ආකෘතිය නිරූපණය කරන අතර හැකි සෑම යකු ම කූඩුවට රිංග ගත යුතු වේ.
- විධානයට ක්‍රියාත්මක වීමට අපොහොසත් වන අය ක්‍රීඩාවෙන් ඉවත් වේ.
- දැඩි අවධානයෙන් ක්ෂණික ව විධානය ක්‍රියාත්මක කරන දක්ෂයා ජයග්‍රහණය ලබයි.

**පියවර 03**

- මෙම අභ්‍යාස සියල්ල අවසන් කර සිසුන් රවුමට වාඩි කරවා කරන ලද අභ්‍යාසය ද පදනම් කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.
  නාට්‍ය කලාවේ දී ශරීරිය ප්‍රබල ප්‍රකාශන මෙවලමක් ලෙස යෙදේ.
- අදහස් ප්‍රකාශනයේ දී ද ආංගික අභිනය ද වැදගත් වේ. වාචිකාභිනයෙන් තොර ව ඇතැම් අවස්ථා සහ සිදුවීම් ප්‍රබල ව ආංගික අභිනයෙන් ඉදිරිපත් වේ.
- ආංගික අභිනය ප්‍රබල කරගැනීම සඳහා ඉහත ආකාරයේ ශාරීරික අභ්‍යාස ඉතා මවැදගත් වන බව පෙන්වා දෙන්න. මෙවැනි ශාරීරික අභ්‍යාසවල යෙදීමෙන් අත්කරගත හැකි ප්‍රයෝජන ද රැසක් ඇති බව පෙන්වා දෙන්න.

උදා: සබකෝලය දුරු වෙයි. ශාරීරික අපහසුතා මඟහැරෙයි.
ශරීරිය නම්‍යශීලී වෙයි.
රඟපෑම සඳහා ශාරීරික හා මානසික පෙලඹවීමක් ඇති කරයි.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධාකාරයේ ශාරීරික චලන පෑම
- ශරීරයේ විවිධ අවයව රිද්මයකට , තාලයකට චලනය කර දැක්වීම.
- ආංගික අභිනය පෑම
- ශාරීරික අභ්‍යාසවලින් ඇති ප්‍රයෝජන ප්‍රකාශ කිරීම.
- ආංගික අභිනයෙන් අවස්ථා, ක්‍රියා නිරූපණය කිරීම.

**පැවරුම** : සිසුන් සමාන පිරිසක් සිටින සේ කණ්ඩායම් කරන්න. ඔවුන්ට කැමති ආකාරයේ කෙටි අවස්ථාවක් හෝ සිද්ධියක් හෝ ආංගික අභිනයෙන් පමණක් නිරූපණය වන සේ නිර්මාණය කරන්නට උපදෙස් ලබාදෙන්න. විවේක කාලච්ඡේදවල හෝ වෙනත් අවස්ථාවල හෝ පුහුණු වී නාට්‍ය හා රංග කලාව කාලච්ඡේදයක රඟ දක්වන්නට අවශ්‍ය පහසුකම් සලස්වන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.5** : සතර අභිනය භාවිත කරයි.

**ක්‍රියාකාරකම 3.5.3** : නාට්‍ය ශෛලීන්ට උචිත සංවාද භාවිත කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නාට්‍ය ධර්මී සංවාදවල ලක්ෂණ විස්තර කරයි.
- නාට්‍යධර්මී සංවාද ප්‍රකාශ කරයි.
- ලෝකධර්මී නාට්‍ය සංවාදවල ලක්ෂණ විස්තර කරයි.
- ලෝකධර්මී සංවාද ප්‍රකාශ කරයි.
- නාට්‍ය කෘතිවල ඇති විවිධ සංවාද වර්ග වෙන් කර පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍යධර්මී සහ ලෝකධර්මී සංවාද ඛණ්ඩ අඩංගු පත්‍රිකා
- නාට්‍ය ධර්මී සහ ලෝකධර්මී සංවාද අඩංගු සංයුක්ත තැටි හෝ ශබ්ද තැටි

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- සිසුන්ට විවිධාකාරයේ සංවාද භාවිතයන් සහිත නාට්‍යවලින් උපුටාගත් කොටස් සහිත වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කිරීම හෝ හඬ පටයක් ඇසෙන්නට සැලැස්වීම (ඉහත පහසුකම් සපයා ගැනීමට නොහැකි නම් නාට්‍ය කෘති කිහිපයක් නම් කිරීම.)

- ලෝකධර්මී ශෛලියට අයත් සංවාද භාවිතයන් සහ නාට්‍ය ධර්මී ශෛලියට අයත් සංවාද භාවිතය නාට්‍යවල දැකිය හැකි බව.

- නාට්‍ය ධර්මී සංවාදවල රිද්මයක්, තාලයක් ඇති බව, ගීත කොටස් බහුල ව මෙම නාට්‍යවල දැකිය හැකි බව පෙන්වා දෙන්න.

- නාට්‍ය ධර්මී සඳහා විවිධ ජන නාටකවලින් ද රබන් පද, සවිදම් වැනි අංගවලින් ද තාල හා පද යොදාගෙන ඇති බව ප්‍රකාශ කරන්න.

- නාට්‍ය ධර්මී සංවාද ඉදිරිපත් කරන විට සංගීතය හා නර්තනය ද යෙදෙන බව පෙන්වා දෙන්න.

- ඇතැම් ලෝකධර්මී ගත භාෂණ ඉදිරිපත් කෙරෙන ආකාරය අනුව නාට්‍යධර්මී විය හැකි බව පෙන්වා දෙන්න.

  උදා: ආත්මගත භාෂණ, අපවාරිත භාෂණ, ජනාන්තික භාෂණ, ආකාශ භාෂණ

**පියවර 02**

- නාට්‍ය ධර්මී සංවාද ඛණ්ඩයක් සහිත පත්‍රිකා කිහිපයක් සිසුන්ට ලබාදෙන්න. ඒවා ඔවුන් සමඟ කියවන්න.
  උදා: මනමේ, සිංහබාහු, නරිබෑනා, එලොව ගිහින් මෙලොව ආවා, වැනි නාට්‍යවල එන නාට්‍යධර්මී සංවාද කොටස් මුලින් ම කියවන්න.
- දෙවනු ව කියවන විට එයට අදාළ වන සේ අංග චලන සහ හැඟීම් ද නිරූපණය වන සේ ඉදිරිපත් කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම කරන්න.

**පියවර 03** • ලෝකධර්මී සම්ප්‍රදායයට වඩා සමීප සංවාද, එදිනෙදා ව්‍යවහාර භාෂාවට සමීප වන බව පෙන්වා දෙන්න. සාමාන්‍ය ජීවිතයේ ගැහැනුන් මිනිසුන් කථා කරන ආකාරයට සංවාද මෙහි දී භාවිත වුවත් ඒවා නාට්‍යෝචිත ව යොදාගත යුතු බව ද පෙන්වා දෙන්න.

**පියවර 04** • සිසුන්ට ලෝකධර්මී සංවාද සහිත පත්‍රිකා කිහිපයක් බෙදා දෙන්න. ඒවා ඔවුන් සමඟ කියවන්න. මුලින් ම සාමාන්‍ය ආකාරයට කියවා පසු ව හැඟීම් ප්‍රකාශ වන ආකාරයට කියවන්න.

• නැවත කියවන විට සංවාදය සමඟ අනිකුත් අභිනය ද එකතු කර නිරූපණාත්මක ව සංවාදය ඉදිරිපත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යධර්මී සංවාද උච්චාරණය කරයි.
- නාට්‍යධර්මී සංවාදවල ලක්ෂණ පැහැදිලි කරයි.
- ලෝකධර්මී නාට්‍ය සංවාද ඉදිරිපත් කරයි.
- ලෝකධර්මී නාට්‍ය සංවාද සහිත රංගන අවස්ථා නිරූපණය කරයි.
- ලෝකධර්මී සහ නාට්‍යධර්මී සංවාද අවස්ථෝචිත ව නාට්‍ය සඳහා යොදාගනියි.
- ලෝකධර්මීගත භාෂණ විධියක් ඉදිරිපත් කිරීමේ දී නාට්‍ය ධර්මී විය හැකි අයුරු පැහැදිලි කරයි.

**පැවරුම** : 3.5.2 පාඩමට අදාළ ව කණ්ඩායම් වශයෙන් ආංගික අභිනයෙන් නිරූපණය කරන අවස්ථාවට ගැළපෙන ලෙස සංවාද එකතු කරන්න. ඒ අනුව 3.5.2 පාඩම අවසානයේ ලබා දී ඇති පැවරුමට අදාළ ව රංග අවස්ථාවට නාට්‍යධර්මී හෝ ලෝකධර්මී හෝ සංවාද ගැළපීම සිදු කරන්න.

තොරතුරු පත්‍රිකා

1. නාට්‍යධර්මී සංවාද සඳහා

තොරතුරු ගොනුව

''ගමමහගේ තෝව දෙන්නෙත් නරියටයි
තෝව ගන්නෙත් නරියෙකුයි
තෝව දෙන්නෙත්, තෝව ගන්නෙත්
කැලේ ඉන්නා නරියෙකුයි''

(නරිබෑනා)

''හිඟන්නා'' මෙලොවෙදි තව තව ලැබෙන්න
එලොවෙදි දුක නැතුව ඉන්න
දිව මාළිග පහළ වෙන්න
පිනට මොකුත් මට ලැබෙන්න''

දෙමවුපියන් දූ දරුවන්
නාමෙට පින් පමුණුවන්න
මළගිය ඇත්තන් වෙනුවෙන්
පිනට මොකුත් මට ලැබෙන්න''

(එලොව ගිහින් මෙලොව ආවා)

''නරියා ඉතිං සැනසෙන්න
හොඳින් පුළුවන්නෙ
දෙමව්පියො දෙන්න
ඇවිත් අර ඉන්නෙ
මෙතෙක් උඩ පැන්නෙ
ගමින් එන කන්නෙ
හුඟක් දෑවැද්ද
ගෙනත් ඇති වෙන්නැ
ගොඩක් බඩු මුට්ටු
ගෙනත් ඇති වෙන්නැ
හොඳින් කලරින්න
ඉතින් පුළුවන්නෙ''

(නරිබෑණා)

''කළුහාමි මමත් හිටිය හම්බ වෙන්න
එලොව ගිහින් ආපු කෙනෙක්
එහේ ඉන්න මගේ දුවගෙ
සුවදුක් දැනගන්න අහල
කළුහාමිගෙ දුව කිව්වම
කොයි කවුරුත් දන්නව ඇති
කොහොමද දුව සනීපෙන් ද ?
අපිව මතක නැති වෙලා ද ? ''

(එලොව ගිහින් මෙලොව ආවා)

''නරියා : සුරුට්ටු ද බොන්නේ
බුලත් ම ද කන්නෙ''

''ගමරාළ : හෙනං ගෙන එන්න
සුරුට්ටුව බොන්න''

''නරියා : පයිං ඇවිදිල්ල
මහන්සි ද මන්ද ''

''කපුරාල : ගොඩින් පැන ගත්ත
හුඟක් ළඟ හින්ද ''

''නරියා : මෙහෙත් හරි වැස්ස
වෙලත් උතුරන්න''

(නරිබෑනා)

2. ලෝකධර්මී සංවාද සඳහා

රජු - මට දවල් වෙනකන් බුදියගන්ඩ ඕනෑ
මහ ඇමති - එසේය මහරජතුමනි.
රජු - මේ වන්දිභට්ටයින් ගේ ගායනාව නතර කරන්ඩ ඕනෑ
මහ ඇමති - එසේ ........... අවසර මහරජතුමනි, වන්දිභට්ටයින් ගේ ගායනා මහා සම්මත කාලයේ හිටන් ඉටු කරන්නා වූ චාරිත්‍රයකි.
මහරජු - මොන සම්මත කාලයේ ඉඳලා තිබුණත් මට ඒක හිරිහැරයක්
මහඇමති - සමාවෙන්න මහ රජතුමනි, රාජ ගෞරවය පවතින්නේ පරම්පරාවෙන් පරම්පරාවට පැවතුණා චාරිත්‍ර උඩ
රජු - ඇමති, ඇමති මෙහෙ බලනවා - චාරිත්‍ර ද ආරක්ෂා කරන්නට ඕනෑ. මාවද ආරක්ෂා කරන්ට ඕනෑ.
මහ ඇමති - රාජ චාරිත්‍ර ආරක්ෂා වෙන කොට රාජ ගෞරවය ආරක්ෂා වෙනවා. රාජ ගෞරවය ආරක්ෂා වන විට රජතුමා ආරක්ෂා වෙනවා.
රජු - ඒ උණාට මිනිහෝ නිදිමතේ පුළුවන් ද හැමදාම රටක් පාලනය කරන්ඩ.

**(සුභ සහ යස)**

ආකාස - තව පොඩ්ඩකින් මම බොහොම වැදගත් දෙයක් කියනවා. කවුද මේ ජනේලය වැහුවේ.
ගායනී - මම !
ආකාස - ඒක අරින්ඩ බැරිද කරුණාකරලා ?
ගායනී - පුළුවනී........ ඔන්න !
ආකාස - කෝ මෙතන තිබුණු රෝස පඳුර ?
ගායනී - මම කපලා දැම්මා
ආකාස - ඒ ඇයි?
ගායනී - ජනේලෙ අරිනකොට මගේ අතේ කටු ඇනිලා සීරෙනවා !
ආකාස - ඒකට අතු කපා දමන්ඩ තිබුණනෙ
ගායනී - ඒක ආයිමත් වැවෙනවා
ආකාස - ඒ නිසා රෝස පඳුරත් කපාදාලා ජනේලෙත් වැහුවා ?
ගායනී - ඔව්
ආකාස - අපූරුයි !
ගායනී - මොකක්ද දැං කියන්ඩ ගිය වැදගත් දේ
ආකාස - මම යනවා
ගයනී - මොනවා
ආකාස - මම යනවා
ගායනී - කොහාට ද ? බෝඩිමට ද ?
ආකාස ු නැහැ
ගායනී - එහෙනම්
ආකාස - මං දන්නේ නෑ

(ජනේලය නාට්‍ය)

නිපුණතාව 3.0 : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.6** : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

**ක්‍රියාකාරකම 3.6.1** : සකස්කඩ - නොකී කට
උගේ කට - හුඹස් කට
සකස් කඩ - කියූ කට
නුඹේ කට - වටී රට

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- නිවැරදි ව සංවාද භාවිතය සඳහා අවශ්‍ය උච්චාරණ අභ්‍යාස ප්‍රගුණ කරයි.
- සංවාද භාවිතය සඳහා පැහැදිලි කටහඬක් තිබිය යුතු බව අවධාරණය කරයි.
- පැහැදිලි හා ප්‍රබල කටහඬක් ඇති කර ගැනීම සඳහා හඬ අභ්‍යාස ප්‍රගුණ කරයි.
- සකස්කඩ ශබ්ද නඟා කියවීමෙන් කටහඬ හැසිරවීමේ දී අභ්‍යාසයක් ලැබෙන බව ප්‍රායෝගික ව අත්දකියි.

ගුණාත්මක යෙදැවුම් :
- සකස්කඩ ග්‍රන්ථය හෝ එහි ඡායා පිටපත් කීපයක් හෝ
- 7 වන ශ්‍රේණිය ගුරු අත්පොත
- බුද්ධ ගජ්ජය, නම් පොත

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සිසුන් සියලු දෙනාට ම සකස්කඩ ඡායා පිටපත බැගින් ලබා දෙන්න. පළමු ව එය නිශ්ශබ්ද ව කියවා ගැනීමට සලස්වන්න.
- ඉන් පසු ශබ්ද නඟා කියැවීමට උපදෙස් දෙන්න. මේ සඳහා නිදහස් අවකාශයක් තෝරාගැනීම වඩාත් සුදුසු ය.
- සකස්කඩ කියවීමේ දී තමාට රිසි අයුරකින් කියැවීමට උපදෙස් දෙන්න.
- එහෙත් ශ්‍රව්‍ය ගෝචර රටාවකට ද කියැවිය හැකි අයුරු ප්‍රදර්ශනය කරන්න.

  උදා: ජාතක කථා කියවන විලාසය
  ගාථා කියන විලාසය
  පිරිත් සජ්ඣායනා විලාසය
  දොරකඩ අස්න ගායනා විලාසය
- සකස්කඩ කියැවීමේ දී වචනවල ඇති අක්ෂරවල නිරවද්‍යතාව අත්‍යවශ්‍ය කරුණක් සේ සලකා උච්චාරණය කළ යුතු බව (මහාප්‍රාණ අක්ෂර, ඌෂ්මාක්ෂර, නාසික්‍ය අක්ෂර ......................... ආදි ලෙස)

උදා:

දීපංකරාච්භය මුනීශ්වර පාදමූලේ
සන්ත්‍යජ්‍ය ලබ්ධ මමෘතං කරුණං විධාය
අත්‍යාහිතං පරහිතං - සුකෘතං විශේෂාත්
සිද්ධං නමෝස්තු සුගතාය - ජගද්ධිතාය

- භාෂා උච්චාරණයේ දක්ෂ ශිෂ්‍යයකු ලවා පළමු ව මෙවැනි පද්‍ය කොටසක් කියවීමට අවස්ථාව ලබාදෙන්න.
- ඉන් පසු සියලු ම ශිෂ්‍යයන්ට එහි පදයෙන් පදය කියැවීමට අවස්ථාව ලබාදෙන්න.

- සකස්කඩ ආරම්භයේ ඇති ' දීපඞකරාචිභය' ........ යන ගාථාව සියලු ම සිසුන් කියවා අවසන් වූ පසු ගද්‍ය ආකාරයෙන් ලියවී ඇති ඉතිරි කොටස (තථාගතයන් සංසිඞාශේෂ සම්බාර ...........................)

  විවිධ ශෛලි අනුව කියවීමට අවස්ථාව ලබාදෙන්න.

  උදා: • පිරිත් දේශනා ශෛලිය
  - ජාතක කථා කියවීමේ ශ්‍රව්‍ය ගෝචර ශෛලිය
  - දොරකඩ අස්න අනුශාසනා කියවන ආකාරය (පාසලේ දක්ෂ සිසුහු සිටිත් නම් මේ සඳහා ඔවුන් යොදා ගත හැකි ය.)
  - සමස්ත 'සකස්කඩය' සියලු ම සිසුන් තමන්ට හැකි ශෛලියකට කියවා අවසන් වූ පසු සිසුන් ගේ කුශලතා ඇගැයීමට ලක්කරන්න.

**පියවර 02**

- සිසුන්ට අදහස් ප්‍රකාශනයට ඉඩ ලබා දී මෙබඳු කෘති පරිශීලනයෙන් ලැබිය හැකි ප්‍රතිලාභ පෙන්වා දෙන්න.
- නිවැරදි භාෂා උච්චාරණයට හුරු වීම.
- කටහඬ මනා ලෙස පවත්වාගෙන යාමට හැකි වීම
- නාට්‍ය විෂයයේ දී - පෙළ කියවීමේ දී හා රංගනයේ දී සංවාද භාවිතය හා හඬ පාලනය පහසු වීම.
- ශබ්ද නඟා පොත් පත් කියැවීමට හැකියාව ලැබීම.
- සාහිත්‍යය තුළ ඇති කාව්‍යමය ගැදි බසෙහි හා පැදි බසෙහි අලංකාරය හා වෙනස හඳුනාගැනීම.
- නිවැරදි භාෂා උච්චාරණය නිසා රංගන කාර්යයේ යෙදෙන නළු - නිළියන්ට සිය නළු කාර්යය සාර්ථක ව කරගත හැකි වීම.

උදා: ගීත ගායනය, සභාවක් ඇමතීම, ක්ෂණික කතාවක් කිරීම, ක්ෂණික නිරූපණ ඉදිරිපත් කිරීම.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සකස්කඩ විවිධ ශෛලි අනුව කියවයි.
- එමඟින් හඬ අභ්‍යාස ප්‍රගුණ කරයි.
- හඬ අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් නාට්‍යවල සංවාද භාවිතයට අවශ්‍ය පරිචය ලබාගනියි.
- සකස්කඩ, නම්පොත ආදි ග්‍රන්ථ පරිශීලනයට පෙලැඹෙයි.
- අවස්ථෝචිත ව හඬ අවධි කිරීමට පෙලැඹෙයි.

පැවරුම :

- පන්තියේ සිසුන් කණ්ඩායම් වශයෙන් එක් ව බුද්ධගජ්ජය, සකස්කඩ, නම්පොත ආදි ග්‍රන්ථවල දැක්වෙන ගද්‍ය කොටස් විවිධ ශෛලියට අනුව කියවන්න.
- කණ්ඩායම් කීපයකට බෙදී එක් එක් කෘතියෙන් විවිධ කොටස් තෝරාගෙන හඬ අභ්‍යාස ලෙස පුහුණු කරන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.6** : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

**ක්‍රියාකාරකම 3.6.2** : ගමට නමක්, හැඩට හඬක්

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- උච්චාරණය මගින් කටහඬ අභ්‍යාස ප්‍රගුණ කරයි.
- සංවාද භාවිතය සඳහා හඬ අභ්‍යාස මගින් ලබාගන්නා කුශලතා ප්‍රයෝජනයට ගනියි.
- නම් පොත, බුද්ධ ගජ්ජය, සකස්කඩ වැනි ග්‍රන්ථ පරිශීලනයෙන් ලත් අත්දැකීම් හඬ අභ්‍යාස ප්‍රගුණ කිරීමට උපකාර කරගනී.
- පැරණි සාහිත්‍යයෙහි තුළ දක්නට ලැබෙන ඇතැම් නිර්මාණ පුද්ගලයා ගේ කායික, මානසික, සංවර්ධනය උදෙසා ප්‍රබල බලපෑම් එල්ල කරන බව උක්ත ග්‍රන්ථ පරිශීලනයෙන් ඉගෙන ගනී.

**ගුණාත්මක යෙදවුම්** :
- නම් පොත ග්‍රන්ථය හෝ නම් පොතෙහි අඩංගු ග්‍රාම නාම සඳහන් ඡායා පිටපත්
- එම ග්‍රාම නාම රිද්මයකට අනුව කියන ලද හඬ පටයක් ශ්‍රව්‍ය දෘශ්‍ය සංයුක්ත තැටියක්

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**
- සිසුන් සියලු දෙනාට ම නම් පොත ග්‍රන්ථය හෝ ඡායා පිටපත් හෝ ලබාදෙන්න.
- අදාළ පිටපත නිශ්ශබ්ද ව කියවාගැනීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- කීප වරක් නිශ්ශබ්ද ව කියවාගත් පසු ශබ්ද නගා කියැවීමට උපදෙස් දෙන්න.
- මේ අවස්ථාවේ දී සිසුන් සියලු දෙනාට ම නිදහසේ අභ්‍යාසයේ යෙදීම සඳහා නිදහස් වාතාවරණයක් ඇති ස්ථානයක් තෝරා ගැනීම ගුරුවරයා ගේ අභිමතය පරිදි කළ හැකි ය.
- නම් පොතෙහි සඳහන් ග්‍රාම නාම විරාමයකින් තොර ව හා විරාමයක් සහිත ව කියැවීමෙන් අභ්‍යාසයක් ලැබෙන පරිදි ශිෂ්‍යයන්ට විවිධ ආකාරයට කියැවීමට සලස්වන්න.
- මේ සඳහා ආකාර කීපයකට සිසුන් පෙළ ගස්වන්න. (පැවරුමේ දක්වෙන පරිදි)
- සිසුන් කියවා අවසන් කළ පසු ගුරුවරයා ඒ පිළිබඳ ව සිසුන්ට පහත දක්වෙන කරුණු අවධාරණය කරන්න.
- නම් පොත කිසියම් රිද්මයකට අනුව කියැවිය යුතු වීම.
- මැනැවින් වචන උච්චාරණය කළ යුතු ය.
- කටහඬ අභ්‍යාසයක් ලෙස නම් පොත කියැවීම භාවිත කළ යුතු ය.
- එම අභ්‍යාසය නිසා රංගනයට සුදුසු කටහඬක් සකස් කරගත හැකි බැවින් මෙම අභ්‍යාස අනවරත ව කරගෙන යා යුතු ය.

ඉන් පසු මේ සම්බන්ධ ව සිසුන්ගේ ද අදහස් විමසමින් ඇගයීමක යෙදෙන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නම් පොත ශබ්ද නඟා කියවයි.
- එමඟින් කටහඬ අභ්‍යාස ප්‍රගුණ කරයි.
- කටහඬ අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් නාට්‍යවල දී සංවාද භාවිතයට අවශ්‍ය පරිචය ලබාගනී.
- නම් පොත මෙන් ම බුද්ධ ගජ්ජය, සකස්කඩ ආදි වෙනත් කෘති ද පරිශීලනයට පෙලඹෙයි.
- සැබෑ ජීවිතයේ විවිධ අවස්ථා නියෝජනය කිරීමේ දී මනා පෞරුෂයකින් කටයුතු කරයි.

පැවරුම :

- පන්තියේ සිසුන් කණ්ඩායම් කීපයකට පෙළ ගස්වන්න. ඉන් පසු නම් පොතෙහි විරාම දැක්වෙන අවස්ථා අනුව එක් එක් කණ්ඩායම්වලට කොටස බැගින් වේගයෙන් කියැවීමට අවස්ථාව දෙන්න.
- ඉන් පසු එය දිගින් දිගට ම අභ්‍යාසයක් සේ පුහුණු කරන්න.
- පන්තිය කණ්ඩායම් පහකට බෙදූ පසු පළමු කණ්ඩායමට අවසන් කොටස කියවීම අවස්ථාව ලැබෙන තෙක් දිගට ම කියවීමට අවස්ථාව ලබාදෙන්න.
- ඉන් පසු සමස්තය ම, සියලු දෙනා ම එක් ව නොනවත්වා ම දෙවරක් හෝ තෙවරක් කියවා අභ්‍යාසයේ යෙදෙන්න.

නිපුණතාව 3.0 : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.6** : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

**ක්‍රියාකාරකම 3.6.3** : පරිකල්පන අභ්‍යාසවල යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- පරිකල්පනය යනු කුමක් දැ යි ප්‍රකාශ කරයි.
- තමන්ට අසන්නට ලැබෙන හෝ දකින්නට ලැබෙන හෝ දෙය ඔස්සේ පරිකල්පනය මෙහෙයවයි.
- පරිකල්පන චින්තනය ඔස්සේ යම් අවස්ථාවක් , සිද්ධියක් නිර්මාණය කරයි.

ගුණාත්මක යෙදැවුම් : • පටිගත කිරීමේ යන්ත්‍රයක්' සහ විවිධ සංගීත ඛණ්ඩ ඇතුළත් සංයුක්ත තැටි

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. රවුමට හෝ වෙනත් පහසු ආකාරයකට හෝ වාඩි කරවන්න. ''දෙඇස් පියාගන්න'' යැයි පවසන්න. ඔබ තෝරාගත් යම් කිසි භාවයක් ප්‍රකාශ වන ආකාරයේ සංගීත ඛණ්ඩයක් ශ්‍රවණය කරන්නට ඉඩ ප්‍රස්තාව සලසන්න. වාර දෙකක් හෝ තුනක් හෝ නැවත නැවත අසන්නට සලසන්න.
- පසු ව ඒ සංගීත ඛණ්ඩය පිළිබඳ ව ඔවුන්ට දැනුණු දේ ගැන සංකච්ඡා කරන්න. ඒ මගින් සිසුන්ට ඇති කරගත් අදහස් පිළිබඳ ව විමසන්න.
- නැවත මුලින් ශ්‍රවණය කරන ලද සංගීත ඛණ්ඩයට වඩා වෙනස් හැඟීම් ප්‍රකාශ වන සංගීත ඛණ්ඩයක් ශ්‍රවණය කරන්න ඉඩ සලස්වන්න. ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න. මේ ආකාරයට එකිනෙකට වෙනස් සංගීත ඛණ්ඩ කිහිපයක් ශ්‍රවණය කරන්න සලසා ඒ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**පියවර 02**
- සාකච්ඡා අවසානයේ ඔවුන් ශ්‍රවණය කළ සංගීත ඛණ්ඩ ආශ්‍රයයෙන් වඩාත් කැමති සංගීත ඛණ්ඩය විමසා එය නැවත ශ්‍රවණය කරන්න සලසන්න.
- සිසුන් 4-5 ක් වැනි ප්‍රමාණයකට අයත් වන සේ කණ්ඩායම් කරන්න. අසන ලද සංගීත ඛණ්ඩය ගැන සිතා එයට ගැළපෙන නිර්වාචික ව ඉදිරිපත් කළ හැකි අවස්ථාවක් නිර්මාණය කරන්නට ඉඩ සලසන්න. සිසුන් කණ්ඩායම් විසින් කරනු ලබන ඉදිරිපත් කිරීම් සලකා බලා පරිකල්පනය යනු කුමක් දැ යි තේරුම් කර දෙන්න.

**පියවර 02**
- පරිකල්පනය යනු මනසින් යමක් මවා ගැනීම යි.
- නිර්මාණයේ දී පරිකල්පන හැකියාව බෙහෙවින් ම වැදගත් වේ.
- විවිධ විෂයයන් පිළිබඳ ව පුද්ගලයා සතු අවබෝධය මත පරිකල්පනය කිරීමේ හැකියාව වෙනස් වේ.
- යමක් නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම සඳහා පරිකල්පනය බලපායි.
- විවිධ අභ්‍යාස ක්‍රම මඟින් පරිකල්පනය වර්ධනය කළ හැකි ය.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පරිකල්පන අභ්‍යාසවල යෙදෙයි.
- පරිකල්පන අභ්‍යාස යනු කුමක් ද යි ප්‍රකාශ කරයි.
- පරිකල්පනයෙන් විවිධ අවස්ථා නිරූපණය කරයි.
- පරිකල්පනය සාමාන්‍ය ජීවිතයට ද යොදා ගනියි.
- නාට්‍ය නිෂ්පාදනයේ දී පරිකල්පන ශක්තිය යොදා ගනියි.

**පැවරුම :**

- ගුරුවරයා ලබාදෙන මාතෘකාවකට නාට්‍යමය අවස්ථාවක් නිරූපණය කිරීමට අවස්ථාව සලසා දීම.

නිපුණතාව 3.0 : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.6** : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

**ක්‍රියාකාරකම 3.6.4** : ශිථිලකරණ අභ්‍යාසවල යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- ශිථිලකරණය යන්න හඳුන්වයි.
- ශරීරාංග ලිහිල් කර දක්වයි.
- ශිථිලකරණ අභ්‍යාස චරිත නිරූපණය සඳහා යොදාගනියි.
- ශිථිලකරණය සාමාන්‍ය ජීවිතයට ද වැදගත් බව ප්‍රකාශ කරයි.

ගුණාත්මක යෙදවුම් :
- ශිථිලකරණය අභ්‍යාස දක්වෙන ඡායාරූප හෝ සංයුක්ත තැටි

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. ශරීරය උණුසුම් කර ගැනීමට අවශ්‍ය කරන අභ්‍යාස කිහිපයක යොදවන්න.
- ශරීරය උණුසුම් කරගැනීමේ අභ්‍යාසවලින් පසු ව සිසුන් රවුමක සිටුවන්න.
- ඔවුන් සැම දෙනාට ම මොහොතක් දෑස් පියා ගැනීමට සලස්වා තමා ගේ සිරුරේ දෙපතුල සිට හිස් මුදුන තෙක් ද හිස් මුදුනේ සිට දෙපතුල තෙක් ද ඇති බාහිර ශරීර අවයව පිළිබඳ ව සිහි කර ගැනීමට ඉඩ සලසන්න. එය භාවනාවක් මෙන් කිහිප වරක් කරන්නට ඉඩ හරින්න. එය අවසානයේ කරන ලද කාර්යය පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් කරන්න.
    - ශිථිලකරණය යනු සිරුරේ අංග සැහැල්ලු කිරීම බව පෙන්වා දෙන්න.
    - චරිත රංගනයේ දී මෙම සැහැල්ලු බව අවශ්‍ය බව පෙන්වා දෙන්න.

**පියවර 02**

- සිරුරේ තද ගතිය තුරන් කර අවශ්‍ය පරිදි පේශි ලිහිල් කිරීම සඳහා සිදු කළ යුතු මූලික අභ්‍යාසවල යොදවන්න.
    - පහසුවෙන් සිට ගන්න. අත් දෙක ඉහළට ඔසවන්න. අත් හා කඳ එක වර ලිහිල් කරන්න. එවිට ඉනෙන් ඉහළ කොටස පහළට කඩා වැටීමට සැලැස්විය යුතු ය. එය කිහිප වාරයක් සිදු කරන්න.
    - සීරුවෙන් සිටගන්න. උරහිස් දෙක උඩට ඔසවන්න. සැහැල්ලු කර එකවර කඩා හැලීමට සලස්වන්න. කීප වාරයක් මෙය සිදු කරන්න.
    - දැන් මුළු සිරුර ම ලිහිල් කරන්න. ඒ සඳහා සීරුවෙන් සිටගන්න දෙඇස් පියාගන්න. මනසින් සිරුරේ ඒ ඒ අවයව ගැන සිතමින් මෙම අභ්‍යාසය කරන්න. ඒ අනුව ක්‍රමයෙන් හිසේ සිට පාදාන්තය තෙක් වූ අවයව ගැන සිතමින් එකින් එක ලිහිල් කරන්න. හිස, මුහුණ, බෙල්ල, අත් උරපතු, පපුව, උදරය

ඉණ, කලවා දණහිස්, කෙණ්ඩා වළලුකර, යටිපතුල් යනාදි එකින් එක ගැන සිතමින් ඒවා ලිහිල් කරන්න. මෙසේ ලිහිල් කිරීමේ දී මුළු සිරුර ම ක්‍රමයෙන් කඩා හැලේ. පේශිවල තද ගතිය ඉවත් වීමත් සමඟ ක්‍රමානුකූල ව ශරීරය බිමට පතිත වන ආකාරයට අභ්‍යාසය සිදු කළ යුතු ය. සියලු දෙනා ම බිමට පතිත වූ පසු ද සැහැල්ලු භාවයෙන් සිටිය යුතු ය. ගුරුවරයා ඔවුන් ගේ අත්, පා හිස ආදිය අල්ලා බලමින් ශිථිලකරණය වී ඇත් ද යන්න නිරීක්ෂණය කළ යුතු වේ.

**පියවර 03**

- අභ්‍යාසය අවසානයේ සිසුන් සමඟ සාකච්ඡා කරමින් කරන ලද අභ්‍යාසය පිළිබඳ ව විමසන්න. ඒ මඟින් කායික හා මානසික සැහැල්ලුවක් ද ලැබෙන බව පෙන්වා දෙන්න. රංගනයේ දී ශරීරයේ ඇති තද ගතිය නැති විය යුතු බවත් ශරීර අවයව සැහැල්ලුවෙන් හැසිරවීම කළ යුතු බවත් ඒ සඳහා මෙම අභ්‍යාස වැදගත් වන බවත් පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ශරීරාංග මැනවින් ලිහිල් කර දක්වයි.
- මනසින් ඒකාග්‍ර කර ගැනීම සිදුකරයි.
- ශිථිලකරණයෙන් ඇති ප්‍රයෝජන ප්‍රකාශ කරයි.
- රංගනය සඳහා ශිථිලකරණය දායක කර ගනියි.
- විවිධ ශිථිලකරණ අභ්‍යාසවල යෙදෙයි.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.7** : රංග ක්‍රීඩාවන්හි නිරත වෙයි.

**ක්‍රියාකාරකම 3.7.1** : රංග ක්‍රීඩාවල යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- කායික හා මානසික ප්‍රබෝධයක් ලබයි.
- සාමූහික ව ක්‍රියා කිරීමට හුරු වෙයි.
- පොදු ජයග්‍රහණය උදෙසා කැප වීමට හුරු වෙයි.
- විවේකය අර්ථාන්විත ව ගත කිරීමට පිටිවහලක් වේ.
- අවධානය හා ක්‍රියාශීලී බව ඇති කරගනී.

**ගුණාත්මක යෙදැවුම්** :
- අවධානය යොමු කිරීම සඳහා මෙන් ම සංඥා ලබාදීම සඳහා අවශ්‍ය වන උපකරණ (බෙර, තාලම්පට, විසිල් වැනි)
- ක්‍රීඩාව සඳහා අවශ්‍ය වන උපකරණ (සින්තටික් පැදුරු සිසුන් 10කට 1 බැගින්, උපදෙස් පත්‍රිකා)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න.
- සිසුන් සමඟ පහත කරුණු ද උපයෝගී කරගෙන රංග ක්‍රීඩාව පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.
- විවිධ රංග ක්‍රීඩා ඇති බව
- නළුවකු හෝ නිළියක හෝ තම රංගන කාර්යයේ දී මූලික වශයෙන් ම සාමූහිකත්වය රැකීම අත්‍යවශ්‍ය වන බැවින් රංග ක්‍රීඩා කිරීම මඟින් එය ප්‍රගුණ වන බව, ක්ෂණික ව ක්‍රියාත්මක වීමේ හැකියාව ඇති වන බව.
- උත්සාහය, ක්‍රියාශීලී බව, කැපවීම පරිත්‍යාගය වැනි ගුණාංග ප්‍රගුණ වන බව.

**පියවර 02**
- සිසුන් කණ්ඩායම් කරන්න.
- තොරතුරු ගොනුවේ දක්වා ඇති පරිදි රංග ක්‍රීඩාවේ යෙදීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ක්‍රීඩාවේ යෙදෙන අතරතුර ගුරුවරයා ගේ අධීක්ෂණය අත්‍යවශ්‍ය කරුණක් බව සලකන්න.
- සාධාරණ අයුරින් සිසුහු රංග ක්‍රීඩාවල නිරත වෙත් ද යන්න නිරීක්ෂණය කරන්න.
- සියලු ම කණ්ඩායම් ක්‍රීඩා අවසන් කළ පසු ඒ සම්බන්ධ ව කරුණු පැහැදිලි කරන්න.
- ඒ ඒ ක්‍රීඩාවල නිරත වීමේ දී සිසුන්ට දැනුණු දේ ලබාගත් අත්දැකීම් ආදිය පිළිබඳ ව සිසුන් ගෙන් තොරතුරු විමසන්න.

**පියවර 03**
- ක්‍රීඩා අවසන් වූ පසු නැවත සිසුන් සමඟ සාකච්ඡා කරන්න. පහත කරුණු ද උපයෝගී කරගන්න.
  - සාමූහික ව ක්‍රීඩාවේ නිරත වීමෙන් ජයග්‍රහණය ලැබිය හැකි බව.

- එක් අයකුගේ හෝ දුර්වලතාව පරාජයට හේතු වන බව.
- ජය පරාජය එක ලෙස විඳ ගැනීමට හැකියාව තිබිය යුතු බව.
- කණ්ඩායමේ ජයග්‍රහණය උදෙසා මනා කැපවීමක් කළ යුතු බව හා අවශ්‍ය විටෙක දී පරිත්‍යාගශීලී වීම ද ජයග්‍රහණයට හේතු වන බව.
- රංග ක්‍රීඩා මඟින් ස්මරණය දියුණු කළ හැකි බව.
- මානව දයාව, හැඟීම් පාලනය කිරීම වැනි නිපුණතා රැසක් ළඟා කරගත හැකි බව.
- නාට්‍ය නිර්මාණයේ දී රංග ක්‍රීඩා උපයෝගී කරගත හැකි බව.
- සිසුන් ගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා නව රංග ක්‍රීඩා නිර්මාණය කළ හැකි බව.
- රංග ක්‍රීඩා මඟින් දක්ෂ නායකයකු වීමට අවශ්‍ය නිපුණතා ළඟා කර ගත හැකි බව.
- සාර්ථක රංගන ශිල්පියකු වීමට රංග ක්‍රීඩාවලින් මනා පිටිවහලක් ලැබෙන බව.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංග ක්‍රීඩාව හොඳින් හඳුනාගැනීම
- කණ්ඩායම නිසි පරිදි මෙහෙයවීම
- නීතිරීතිවලට අනුකූල ව ක්‍රීඩාවේ නිරත වීම
- ජයග්‍රහණය සඳහා දක්වන සහයෝගය
- සාමූහික ව ක්‍රියාශීලී ව පරිත්‍යාගයෙන් හා පරිකල්පනයෙන් යුතු ව ජයග්‍රහණය ලැබීම.

පැවරුම :

- තොරතුරු ගොනුවේ සඳහන් රංග ක්‍රීඩා කණ්ඩායම් සියල්ල ම ලවා කරවන්න. එම ක්‍රීඩාවලින් සිසුන්ට ලැබුණ අත්දැකීම් සහ නිපුණතා සටහනක් සකස් කරවන්න.

**අතිරේක උදවු :**


- 9 වසර පරණ ගුරුඅත්පොතෙහි ඇති රංග ක්‍රීඩා තොරතුරු ඇතුළත් කරන්න.

1. පෙරළුණු ඔරුව
2. රාක්සයකු ගමට ඇවිල්ලා

## තොරතුරු ගොනුව

1. පන්තියේ සමස්ත කණ්ඩායම සඳහා පොදු ක්‍රීඩාවක්

පුවරුව ඉදිරිපස




ආදර්ශ ඉලක්කම් පුවරුව

1 - අත් දෙපසට එසවීම
2 - අත් ඉහළට එසවීම
3 - අත් පහත දැමීම
4 - දෙපාමත වාඩිවීම
5 - හිට ගැනීම

2. ක්‍රීඩා පිටිය ඉදිරිපස සවි කරන පුවරුව (7 ශ්‍රේණිය මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති '' නම් පොතෙන් '' උපුටා ගත්)

1

1 - සගම
2 - පස්ගම
3 - අරත්තන
4 - මාදන්වල
5 - විල්වල

11


1. කඩදොර
2. මොරපාය
3. දිඹුල
4. පුසුල්පිටිය
5. නියම්ගම්යාය

3. නාට්‍ය ගීත කීපයක්
- මනමේ නාට්‍යය
- සිංහබාහු නාට්‍යය
- තාරාවෝ ඉගිලෙති නාට්‍යය
- බෙරහඬ නාට්‍යය හෝ වෙනත්

## ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව

**අංක (1) ක්‍රීඩාව සම්බන්ධ උපදෙස්**


- තොරතුරු ගොනුවේ අංක 1 - අංක 5 තෙක් ඉලක්කම්වලට අදාළ ක්‍රියාකාරකම් ලොකු අකුරෙන් ලියන ලද රංග ක්‍රීඩාවේ යෙදෙන පන්ති කාමරය ඉදිරිපස/වේදිකාව /එළිමහන් රංග භූමිය ඉදිරිපස එල්ලන්න.
- කණ්ඩායමට ක්‍රියාකාරී නායකයකු තෝරා ගන්න
- සිසුන් සියලු දෙනා පේළි කීපයකට සිටුවා තබන්න. (පහත පරිදි)




- පළමුවෙන් ම සිසුන්ට පුවරුවේ දැක්වෙන අංකවලට අනුකූල ක්‍රියාකාරකම්වල කීප වරක් යෙදීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉන් පසු පුවරුව කණපිට හරවා අංක පමණක් කියමින් සිසුන්ගේ මතකය විමසා (අංක පිළිවෙළට) ක්‍රීඩාවේ යෙදීමට ඉඩ ලබාදෙන්න.
- කීප වරක් එක ම ආකාරයට ක්‍රීඩාවේ යෙදෙන්න.
- ඉන් පසු ආදර්ශ ඉලක්කම් පුවරු (අංක 1-5 තෙක් පෙර සකසා තිබූ) කණ්ඩායම් නායකයා මාරුඇවෙන් මාරුවට ඔසවමින් මතකය සම්බන්ධ ක්‍රියාකාරකම්හි යෙදෙන්න සලස්වන්න. මෙහි දී වරක අංක 1 එසවිය හැකිය. වරක 5 එසවිය හැකිය. මෙහි දී අංකවලට අදාළ ක්‍රියාකාරකම අමතක වූ සිසුන් වැරදි ක්‍රියාකාරකමක යෙදුණ විට ඔවුන් කණ්ඩායමෙන් ඉවත් කරන්න.
- ක්‍රීඩාව අවසානයේ ස්මරණ ශක්තිය වැඩි පිරිස තරගයේ රැඳී සිටිති.
- ඒ අය ජයග්‍රාහකයන් ලෙස සලකන්න.
- පරාජය වූවන් අත්පොළසන් දී ජයග්‍රහකයන්ගේ ජයග්‍රහණය අගය කරන්න.

අංක (2) ක්‍රීඩාව


- පන්තියේ සියලු ම සිසුන් පස් දෙනා බැගින් පේළිවලට සිට ගැනීමට සලස්වන්න.




- ළමුයි ඉදිරියේ ග්‍රාමනාම සහිත පුවරුව ප්‍රදර්ශනය කරන්න.
- 7 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන ''නම් පොතින්'' උපුටාගත් ග්‍රාමනාම ලේඛනයෙන් ගම් 5ක නම් 5ක් පිළිවෙළින් එක් එක් ළමයාට ලබාදෙන්න. ඔවුන්ට තමා ගමේ නම හොඳින් මතක තබා ගන්නා ලෙසට අවවාද කරන්න.
- මුලින් ම සිටින ශිෂ්‍යයා තමා ගමේ නම හඬගා කියන්න.
- අංක 2 හිමි ශිෂ්‍යයා පළමු ශිෂ්‍යයා ගේ ගමේ නමත් තමාට හිමි ගමේ නමත් හඬගා කියන්න. (සගම, පස්ගම)
- අංක 3 හිමි ශිෂ්‍යයා පළමු ශිෂ්‍යයා ගමේ නමත්, දෙවන ශිෂ්‍යයා ගමේ නමත් තමා ගමේ නමත් මතකයෙන් කිව යුතු ය. (සගම, පස්ගම, අරත්තන)
- අංක 4 හිමි ශිෂ්‍යයා පළමු, දෙවන, තෙවන ශිෂ්‍යයන් ගම්වල නම් හා තමා ගමේ නමත් මතකයෙන් කිව යුතු ය. (සගම, පස්ගම, අරත්තන, මාදන්වල )
- අංක 5 හිමි ශිෂ්‍යයා මුල් සතර දෙනා ගම්වල නම් හා තමා ගමේ නම ද පිළිවෙළින් හඬ නගා කිව යුතු ය. (සගම, පස්ගම, අරත්තන, මාදන්වල, විල්වල )
- ඉන් පසු ඔහු දුවගොස් පෙළේ ඉදිරියෙන් සිටගත යුතු ය.
- එවිට ඔහුගේ ගම වන්නේ අංක 1ට හිමි ගමේ නම ය. (සගම)
- මේ අන්දමට සියලු ම සිසුන්ට අංක 5ට ම හිමි ගම්වල නම් තමාගේ ගමේ නම ලෙස සලකා ක්‍රීඩා කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- සෑම ළමයකුට ම ගම් පහේ ම නම තම ගම ලෙස සලකා ක්‍රීඩාව කිරීමට අවස්ථාව ලැබේ.
- කණ්ඩායමේ පස් දෙනා ම ක්‍රීඩාව කර අවසන් වූ විට ක්‍රීඩාව අවසන් වේ.
- මෙම ක්‍රීඩාව තරගයක් ලෙස කළ හැකි ය.
- මෙම ක්‍රීඩාව අධීක්ෂණය සඳහා සිසුන් යෙදවිය යුතු ය. නැතහොත් ගුරුවරයාට අධීක්ෂණය කළ හැකි ය.
- ඉතා ඉක්මනින් නිවැරදි ව ක්‍රීඩා කළ කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම ලෙස සලකන්න.
- ජයග්‍රාහී කණ්ඩායමට අත්පොළසන් ලබා දී ජයග්‍රහණය හා මතක ශක්තිය ඇගයීමට ලක් කරන්න.
- ක්‍රීඩාව කරන අතරතුර දී මතක ශක්තිය අඩු සිසුන් ක්‍රීඩාව වැරදි ලෙස කළ විට නැවත මුල් ළමයාගේ සිට ක්‍රීඩාව අරඹන්න.
- හැකි තාක් නිවැරදි මතකයෙන් යුතු ව ක්‍රීඩාවේ යෙදීමට අවංක වීමට සිසුන්ට උපදෙස් දෙන්න.

අංක 3 ක්‍රීඩාව

- පන්තියේ සිසුන්ට නාට්‍ය ගීත කීපයක් මතක තබාගෙන එන ලෙස පෙර දින උපදෙස් දෙන්න.
- පන්තියේ සිසුන්ට වෘත්තයක් ලෙස සිටගැනීමට සලස්වන්න.
- මැදින් නායකයා සිට ගැනීමට සලස්වන්න.
- නායකයා නාට්‍ය ගීතයක් ආරම්භ කරන්න.
- සෙසු සිසුන් රවුමට වටේට ඇවිදීමට සලස්වන්න.
- නායකයා අත්පුඩි ගසා කණ්ඩායම නතර කළ පසු නායකයා ගීතය නතර කරයි.
- එතැන් සිට නායකයා නම් කරන අයකු ගීතයේ ඉතිරි කොටස ගායනා කළ යුතු ය.
- නායකයාගේ අත්පොළසන් නාදයට අනුව වටේ ඇවිදිමින් ගීතය කොටසින් කොටස ගායනා කළ යුතු ය.
- මෙසේ කොටසින් කොටස ගීතය සම්පූර්ණයෙන් ම ගායනා කර අවසන් වූ පසු ක්‍රීඩාව අවසන් වේ.
- ගීතයේ කොටස් ගායනා කිරීමට අමතක වූ සිසුන් ක්‍රීඩාවෙන් ඉවත් කරන්න.
- මෙසේ නාට්‍ය ගීත 5ක් පමණ මෙම ක්‍රීඩාව හා යොදා ගන්න.
- අවසානයේ ඉතිරි වන පිරිස් ජයග්‍රාහකයන් ලෙස සලකා අත්පොළසන් දී ජයග්‍රහණය සමරන්න.




- අවසානයේ ජයග්‍රහණය කළ සිසුන් හා පරාජයට පත් වූ සිසුන් සියලු දෙනා ම එක් ව ගීත සියල්ල ගායනා කොට ක්‍රීඩාව අවසන් කරන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.8** : ප්‍රකාශනාත්මක නිරූපණයෙහි යෙදෙයි.

**ක්‍රියාකාරකම 3.8.1** : වයන වැයුමට උචිත රැඟුමක්

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- වාද්‍ය  ඛණ්ඩය වින්දනය කරයි.
- වාද්‍ය ඛණ්ඩයට අර්ථ සපයයි.
- වාද්‍ය ඛණ්ඩයේ  අර්ථ ප්‍රකාශ වන අයුරින්  රූපණය  ඉදිරිපත් කරයි.
- එක ම වාද්‍ය ඛණ්ඩයට  විවිධ වූ අර්ථ නිරූපණ ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදැවුම්** :

- සංගීත ඛණ්ඩ සහිත  සංයුක්ත තැටි  (VCD Player)  සංයුක්ත තැටි වාදන යන්ත්‍ර
- ක්‍රීඩාව සඳහා  අවශ්‍ය වන උපකරණ (පැදුරු හා සිසුන් 10 කට 1 බැගින් උපදෙස් පත්‍රිකා)

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- හොඳින් වාද්‍ය ඛණ්ඩ ශ්‍රවණය කිරීමට හැකි නිදහස් අවකාශයක් තෝරාගෙන  සිසුන්ට වාද්‍ය ඛණ්ඩ ශ්‍රවණයට අවස්ථාව සලසන්න.
- සිත එක තැනක  රඳවාගෙන  (චිත්ත ඒකාග්‍රතාව) මනා සංයමයෙන් යුතු ව හැකි තාක් නිශ්ශබ්ද ව සවන් දිය යුතු බව  පැහැදිලි  කරන්න.

**පියවර 02**

- එක් එක් වාද්‍ය ඛණ්ඩ පිළිබඳ ව  සිසුන්ට අර්ථවත් වූ  හැඟීම් විමසන්න. (තම තමන්ට  දැනුණු  දේ එක් එක්  සිසුවා ගෙන් වෙන වෙන ම විමසන්න)

**පියවර 03**

- වාද්‍ය ඛණ්ඩයකට ප්‍රකාශනාත්මක  නිරූපණයක් ඉදිරිපත් කිරීමේ දී අවධානය යොමු විය යුතු කරුණු පිළිබඳ ව  සිසුන්ට පැහැදිලි කරන්න.
    - කාලය පිළිබඳ ව
    - අර්ථාන්විත බව කෙරෙහි
    - ආරම්භය හා නිමාව පිළිබඳ ව
    - තාලය හා රිද්මය පිළිබඳ ව
    - අවකාශ භාවිතය කෙරෙහි

  අවධානය යොමු කරමින්  තම නිරූපණය සකස්  කිරීමට  සිසුන්ට පවසන්න.

**පියවර 04**

- සිසුන්ට  විවිධ සංගීත ඛණ්ඩ  වෙන් කර දෙන්න.
- එක ම සංගීත ඛණ්ඩයට  වුව ද  විවිධ නිරූපණ  ඉදිරිපත් කළ හැකි බව පවසන්න.
- ලබාදුන් හෝ  සිසුන් විසින්  තෝරාගන්නා ලද  හෝ සංගීත ඛණ්ඩවලට

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වාද්‍ය ඛණ්ඩයට අර්ථ සැපයීම.
- අර්ථාන්විත ව ඉදිරිපත් කිරීම
- විවිධ අර්ථ සැපයීම
- තාලය හා රිද්මය රඳවා ගැනීම
- ආරම්භය, නිමාව, හා අවකාශ භාවිතය

**පැවරුම** :

- විවිධ වාද්‍ය ඛණ්ඩයනට විවිධ වූ අර්ථ සපයමින් ප්‍රකාශනාත්මක ව චලනය ඉදිරිපත් කරන්න. (වර්ෂ කීපයක අ.පො.ස (සා.පෙළ) විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා යොදාගත් සංයුක්ත තැටි එකතුවක් කර, ඒ ඒ සංගීත ඛණ්ඩවලට නිර්මාණ ඉදිරිපත් කිරීමට හුරු වන්න)

නිපුණතාව 3.0 : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.9** : ගීත, කවි හා විරිදු ඇසුරු කරගත් රංගන අවස්ථා නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 3.9.1** : ගයමින් රඟමු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- විවිධ කවි, ගීත, විරිදු රැස් කරයි.
- රංගනයට වඩාත් සුදුසු කවි, ගී තෝරාගනී.
- නියම තාල හා ශ්‍රැති අනුව ගයයි.
- භාවාත්මක ව කවි ගී ගයයි.
- ඒ ඒ ගීවලට ආවේණික නාදමාලා අනුව ගයයි.
- ගයමින් රඟයි.

ගුණාත්මක යෙදවුම් :
- විවිධ කවි ගී ඇතුළත් පොත් පත්‍රිකා
- විවිධ කවි ගී අඩංගු සංයුක්ත තැටි
- කවි ගී රංගන ඇතුළත් වීඩියෝ පට
- සංගීත භාණ්ඩ කීපයක් (සෙරපිනාව, බෙරය, රබාන වැනි)

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01**
- ගුරුවරයා විසින් වෙනත් එවැනි ගායනා සඳහා දක්ෂ අයකු ලවා හෝ කවියක්, ගීයක්, විරිදුවක් ගයමින් හෝ ශ්‍රව්‍ය - දෘශ්‍ය පටයක් මගින් සිසුන්ට ඇසීමට, නැරඹීමට සලස්වන්න. එම ගීත, කවි ගැන විමසමින් පාඩමට පිවිසෙන්න.

**පියවර 02**
- සිසුන් දන්නා එවැනි රංගනය සඳහා සුදුසු කවි, ගී ගායනා කරවන්න. ඒවා අතරින් වඩාත් නාට්‍යෝචිත ගී තෝරාගෙන ඒ සඳහා රංගන අවස්ථා නිර්මාණය කරන්න.

**පියවර 03**
- පහත කරුණු ද උපයෝගී කරගෙන සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
  - විවිධ ගායනා ඇති බව
  - චිත්තරූප මැවෙන අයුරින් ගැයෙන කවි ගී උපයෝගී කොටගෙන රංගන අවස්ථා නිර්මාණය කළ හැකි බව.
  - ඒ ඒ කවි, ගී සඳහා ආවේණික නාදමාලා ඇති බව.
  - ඒ ගී එකිනෙකට යොදාගන්නා සංගීතය ද විවිධාකාර වන අතර භාවිත කරන සංගීත භාණ්ඩ ද වෙනස් වන බව.
  - රංගන අවස්ථා සඳහා තෝරාගන්නා කවි, ගී, විරිදු ශ්‍රව්‍ය - දෘශ්‍ය දෙආකාරයෙන් ම රස විඳීමට හැකි ඒවා විය යුතු බව,
  - මෙම ගායනා භාවාත්මක ව මෙන් ම නාට්‍යෝචිත ව ගායනා කළ යුතු බව.

ඉහත සඳහන් කරුණු ද සැලැකිල්ලට ගෙන ඒ ඒ ගායනා සඳහා රංගන අවස්ථා නිර්මාණය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**පියවර 04** • සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා කවියක්, ගීතයක්, විරිඳුවක් බැගින් සැම කණ්ඩායමක් ම අංග තුන බැගින් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- උචිත ගී තෝරා ගැනීම.
- ආවේණික නාදමාලා අනුව ගායනා කිරීම.
- තාලය හා ශ්‍රැතිය නියමාකාරයෙන් යොදාගැනීම.
- භාවයන් ප්‍රකාශ වන පරිදි ගායනය හා රංගනය කිරීම.
- සමස්ත නිර්මාණයේ සාර්ථකත්වය.

පැවරුම : රංගන අවස්ථා නිර්මාණය සඳහා යොදාගත හැකි කවි, ගීත, විරිඳු එකතුවක් සකසන්න.

අතිරේක උදවු

කවි

1. පි. අල්ලාගෙන නෙරිය අතකින් කිම් ද නගෝ
වසාගෙන දෙතන අතකින් කිම් ද නගෝ
හිමියෙක් නැති ගමන් තනිමග කිම් ද නගෝ
අම්බලමේ ඉඳලා අපි යමු ද නගෝ

ගැ. අල්ලාගෙන නෙරිය මඩ තැවරෙන හින්දා
වසාගෙන දෙතන බිලිඳුගෙ කිරි හින්දා
බාල මස්සිනා පස්සෙන් එන හින්දා
යන්නම් අයියණ්ඩි ගමරට දුර හින්දා

පි. අල්ලාගෙන නෙරිය මඩ තැවරුණොත් නැතී
වසාගෙන දෙතන බිලිඳුගෙ කිරිත් නැතී
බාල මස්සිනෙක් පස්සෙන් එන්නෙ නැතී
බිලිදෙක් තියා සැමියෙක් වත් තව ම නැතී

ලොකු පුතා මල්ලියෙ ඔහොම නොකරන් අපෙ අම්මාට
දෙතනේ කිරි දුන්නෙත් අපි දෙන්නාට
තියෙන දෙයක් දෙන්නෙත් අපි දෙන්නාට
බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට

2. පිහියක් එවාපන් පපුවට ඇන ගන්න
ලණුවක් එවාපන් බෙල්ලේ ලා ගන්න
පණිමක් එවාපන් පාසානං කන්න
ලියුමක් එවාපන් දුකසැප දැනගන්න

3 කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
මිනිරන් තෝරන්න දින ගණනින් එනවා
මිනිරන් තේරුවොත් ළඳ නුඹ කළු වෙනවා
ළඟ නම් ගෙදර මුර ඇරුණ මම එනවා

4 දොඩම් කපාලා ඇඹුල් තනාලා නාන්න යන සැටි
බලන් කළු
සේලේ ඇඳලා නෙරිය තියාලා මිදුලේ සක්මන්
කරයි කළු
දහසක් දීලා වළලු තනාලා දෑතේ අතලා
බලයි කළු
දුකේ මල සේ උළුගෙයි ඇඳපිට ඔළිඳ
කෙළින සැටි බලන් කළු

5. වෙනදා එනකොට මා පල වැල මීරිය රැගෙනා
දුවලා පෙරමගදී දැක සිරුරේ මගෙ වෙළෙනා
රුවිනා මනහර ජාලිය පුතු හා පොඩි දියණී
අද කෝ අහො අද කෝ නැත කිමදෝ මෙම අරුමේ

**විරිඳු : සාලිය අශෝකමාලා**

අශෝකමාලා - දුටු දුටු තැන සිනහ වෙවී - කුල භේදය නොසලකාවි
සැඩොල් කුලයෙ ඉපදුණ මට - වනයේ මල් මුහුණ දේවි
අශෝක වනයට වෙලා
සැනසෙමි මල් නෙළ නෙළා

සාලිය - අශෝක මහ වනය මැද්දෙ -කදිමයි තිගෙ මිහිරි සද්දෙ
කියනු මැනවි මිහිරාවිය -මනු ලෝකෙ ද උපත ලද්දෙ
තිගේ මිහිරි හඬ අසා
මම ආවෙමි රස නිසා

අශෝකමාලා - පින්වත, මගේ සිතට බයයි - අපි කුලයෙන් පහත් අය යි
හෙළලෝලිය යන නම මට - මගේ පියා නිතර කියයි
අපි දුප්පත් වෙමු ඉතා
ජීවත් වෙමු මල් ගොතා

සාලිය - නෙළුම් පිපේ ගොහොරු මඩේ - මුතු ඇත බෙල්ලකුගෙ බඩේ
තිගෙ ලස්සණ රූපෙ නිසා - කුලභේදය දෙකට කැඩේ
කහළ ගොඩක තිබුණත්
මැණික වටී කවදත්

අශෝකමාලා : බඳ පටියේ මැණික දිලේ - එහි රැස් බිඳු බිමට හැලේ
රජ කෙනෙකුගෙ හැඩ පවසයි - රැඳුණු වචන ඔබගෙ තොලේ
නළලෙ තිබේ රන් කොත
ඔබ කවුරු ද පින්වත

සාලිය අශෝක මල් හැඩට ගොතා - හුරුකම ඇත ඔබට ඉතා
ළඟ දි ම මිණි කිරුළ දරන - මම ගාමිණී රජුගෙ පුතා
ලක් දිව සිහසුන මගේ
තී ළඟ දුහුවිලි වගේ

අශෝකමාලා		සිංහාසනයට ද වැඩී	-	අගයක් තියෙනව ද රොඩී
		රජ වෙනු මැන මා අතහැර	-	නංවා ලොව විජය කොඩී
			අද අසරණ මට අනේ
			ඔබගෙ රුව ද කොඩිවිනේ
සාලිය		නොකිලිටි සමනළ තොල් මත	-	ආලෙ කරන වනමල් වෙත
		වටිනව මට දිවිය ලෝකයට වැඩියෙන් තිගෙ පැල්පත
			තිගෙ ආලයෙ දූලෙ වැටී
			අද සාලිය මෙහි සිටී

අශෝකමාලා	-	හෙළලොලිගම හුලවාලී
සාලිය	-	නෑ සාලිය මනමාලී
දෙදෙනාම	-	පෙන්වමු අපි රසවතුනට - පෙම් ලෝකයෙ පෙළපාලී
			අශෝකවන මැද්දේ
			ආලය ගැන යුද්දේ

නිපුණතාව 3.0 : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.9** : ගීත, කවි හා විරිදු හා කතාන්දර ඇසුරු කරගත් රංගන අවස්ථා නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 3.9.2** : නාට්‍යමය රංගන අවස්ථා මූලික කරගනිමින් කතාන්දරයක් ඉදිරිපත් කරමු. (Story Telling)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- විවිධ ආකාරයේ කතාන්දර ප්‍රකාශ කිරීම
- කතාන්දරයක ඇති නාට්‍යමය ලක්ෂණ අවබෝධ කරගනී.
- කතාන්දර හොඳින් කියවයි.
- කතාන්දර නාට්‍යමය ආකාරයෙන් කියයි.

ගුණාත්මක යෙදැවුම් : • නාට්‍යමය රංගන අවස්ථා මූලික කරගත් කතාන්දර සහිත ශ්‍රව්‍ය දෘෂ්‍ය පට

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01**
- පන්ති කාමරය තුළ ම පාඩම සිදු කළ හැකි ය. සිසුන් සමග අසා ඇති කතාන්දර පිළිබඳ ව විමසීම. සැම අයෙකුට ම තමන් අසා ඇති කතාන්දරයක්, ගැන සිතා ගැනීමට ඉඩ ලබාදීම.

**පියවර 02**
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකු හට කතාන්දරය අනෙක් අයට අසා සිටීමට හැකි ආකාරයෙන් කියවන්නට ඉඩ සලසා දීම. ඒවා ප්‍රකාශ කිරීමෙන් පසු ව අතීතයේ සීයාලා ආච්චිලා ළමයින්ට කතාන්දර කියා දී ඇති ආකාරය පිළිබඳ ව සිසුන් ගෙන් විමසීම. විශේෂයෙන් ම අර්ථවත්, සහ රසවත් කතාන්දර සීයා /ආච්චි කියාදීම. ළමා මනසට ගැළපෙන, ළමා සිත් කුතුහලයට සහ පුදුමයට පත් කරන විචිත්‍ර ලෝකයක් පිළිබඳ ව චිත්තරූප මවාගත හැකි ආකාරයට කතා තෝරා ගැනීම.

  එම කතා සියල්ලක්ම ආසාවෙන් අසා සිටීමට පොළඹවන ලද හේතු සාධක විමසීම, පැහැදිලි කටහඬ, නාට්‍යමය ආකාරයට කටහඬ භාවිතය , හැඟීම් නිරූපණය වන සේ කථා ප්‍රකාශ කිරීම. වැනි හේතු ඒ සඳහා බලපාන ලද බව පෙන්වා දීම.

**පියවර 03**
- ඉහත සාකච්ඡාවෙන් කතාන්දරයක් කියන ආකාරය වඩාත් නාට්‍යමය ආකාරයෙන් සිදු කළ හැකි බව පෙන්වා දී තෝරාගත් තවත් සිසුන් කිහිප දෙනෙකු හට නැවත කතාන්දර ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම. පළමු කතාන්දර ඉදිරිපත් කළ ආකාරය සහ දෙවන කතාන්දර ඉදිරිපත් කළ ආකාරයේ වෙනස ගැන සාකච්ඡා කිරීම.

**පියවර 04**
- කතාන්දරයක් අනෙක් අයට කියන විට එය නාට්‍යමය ආකාරයට ප්‍රකාශ කළ හැකි බව පෙන්වා දෙන්න. කතාන්දරය තුළ ඇති චරිත, ඒ අයගේ මුවින් ප්‍රකාශ වන සංවාද කථකයා විසින් රංගනාත්මක ව ඉදිරිපත් කළ හැකි ය. අවකාශය ද භාවිත කරමින් කථාවට වඩාත් හොඳින් කථනය කිරීමට අවශ්‍ය යැයි හැඟෙන රංග භාණ්ඩ දභාවිත

කරමින් නාට්‍යමය අංග ලක්ෂණ යොදා ගනිමින් කතාන්දරය ඉදිරිපත් කළ හැකි බව සිසුන්ට වටහා දෙන්න. මෙසේ රංගනාත්මක ව කතාන්දරයක් කීම Story Telling නමින් හඳුන්වන බව ද ප්‍රකාශ කරන්න. මෙහි දී සිසුන් හැම විට ම යම්කිසි අර්ථයක් සහිත රසවත් ළමා මනසට ගැළපෙන කතාන්දර තෝරාගෙන ඉදිරිපත් කිරීම වැදගත් බව අවධාරණය කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සිසුන් දන්නා අර්ථවත්, රසවත් කතාන්දර නම් කරයි.
- කතාන්දරයක ඇති නාට්‍යමය ලක්ෂණ දක්වයි.
- පැහැදිලි හඬකින් කතාන්දරය කියයි.
- භාවාත්මක ව හා විවිධ අභිනය භාවිත කරයි.
- රංගාත්මක ව කතාන්දරය කියයි.

**පැවරුම** :
- 

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාව විෂයයට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.1** : දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍යයේ අංකුර අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසංගික ලක්ෂණ හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** : දේශීය ශාන්තිකර්මවල ප්‍රාසංගික ලක්ෂණ හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- බෞද්ධ පූජාකර්‍ම නම් කරයි.
- ඒවාහි නාට්‍යමය ලක්ෂණ විමසයි.
- බෞද්ධ පූජාකර්‍ම නරඹයි
- පූජාවිධි අනුකරණය කරයි.
- බෞද්ධ කථා තේමා කොටගෙන නාට්‍ය රචනා කරයි.

**ගුණාත්මක යෙදැවුම්** :
- බෞද්ධ පූජාකර්‍මවල සංවාද අඩංගු පත්‍රිකා

ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01**
- ගුණාත්මක යෙදැවුම් වශයෙන් සකස් කරගත් බෞද්ධ පූජාකර්‍මවලට අදාළ සංවාද කොටස් අඩංගු පත්‍රිකා (කණ්ඩායමකට 1 බැගින්) ලබාදී කියැවීමට අවකාශ ලබාදෙන්න.
- අනතුරු ව පූජාකර්‍ම ඇරැඹීමේ ඓතිහාසික පසුබිම පිළිබඳ ව පහත දැක්වෙන කරුණු සහිත ව පැහැදිලි කරන්න.
- බෞද්ධ පොතපත පරිශීලනය කළ නොහැකි ජනතාවට දහම් දැනුම් ලබාදීම පිණිස, බෞද්ධ කථා අනුකරණය කර, නිරූපණය කිරීමේ ක්‍රමවේදයක් ඇතිවිය. ඒ සඳහා පාදක කරගත් ජනප්‍රිය කතා පුවත් වූයේ ආලවක දමනය, මිලින්ද ප්‍රශ්නය, ආසන දෙකේ බණ, සති පිරිත් අවසානයේ පැවැත්වෙන දොරකඩ අස්න කීම වැනි අවස්ථා ය.

**පියවර 02**
- එක් එක් කණ්ඩායම් මඟින් ඒ ඒ පූජාකර්‍මයට අයත් සංවාද කොටස් කියැවීමට අවස්ථාව ලබාදෙමින් ප්‍රාසංගික ලක්ෂණ ඉස්මතු කරමින් සාකච්ඡා කරන්න.

**පියවර 03**
- ආලවක දමනය

  අලවු නම් රට පාලනය කරන්නා වූ රජු මුව දඩයමෙහි ගිය කල ආලවක නම් යක්ෂයාට හසු වී සිය පණ බේරා ගැනීමේ අටියෙන් ප්‍රතිඥාවක් දෙයි. එනම් දිනපතා දරුවකු බැගින් යකුට බිලි දීම ය. දොළොස් වසරක් ඉක්ම ගිය කලැ, නියමිත වූයේ රජු ගේ පුත් වූ ආලවක කුමරු බිලි දීමට ය. එදින එපුවත් දැනගත් බුදුන් වහන්සේ එතැනට වැඩම කළ සේක.

  ආලවක විමානයේ මුරකරු වූ ගද්‍රභ නම් යක්ෂයා බුදුන් වහන්සේ එතැනින් ඉවත් කිරීමට කොතෙක් උත්සාහ කළ ද උන් වහන්සේ ආලවක විමානයෙහි නතර වීමට තීරණය කළ බව දැන්වූ හ. මේ බව දැන්වීමට ගද්‍රභ, අලවු යකු සහභාගි වූ හිමාල වනයේ තැබූ යක්ෂ සමාගමට ගියේ ය.

සාතාගිර, හේමවත යන යක්ෂයන් ද යක්ෂ සමාගමට යාම සඳහා අලවු යකු ගේ විමානයට ඉහළින් යාමට උත්සාහ ගනිද්දී නොහැකි වූයෙන් ඒ පිළිබඳ විමසයි. ඔවුහු බුදුන් වැඳ, බණ අසා, එතැනින් නික්ම ගොස් අලවු යකුට විස්තර කියති. ඒ අසන අලවු යකු කිපී තම විමනට විත් සැර පරුෂ ලෙස හැසිරේ. බුදුන් වහන්සේ ගෙන් විවිධ ප්‍රශ්න අසමින්, පිළිතුරු ලබමින් අවසානයේ පංචශීලයෙහි පිහිටා මෙල්ල වෙයි. මෙවිට බිල්ලට යෝජිත ආලවක කුමාරයා යක්ෂයාට බාර දෙනු ලැබේ. යක්ෂයා ලජ්ජාවට පත් වෙයි.

මෙහි දී කථා ප්‍රවෘත්තියක්, නිරූපණය කරනු ලබන්නේ, සජීව ව, ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ ය. රූපණය කරනු ලබන ස්ථානයෙහි පෙන්විය නොහැකි දෑ භික්ෂූන් වහන්සේ විසින් දේශනා කරනු ලැබේ. එය මනා සේ නාටකීය ඉදිරිපත් කිරීමකි. භික්ෂූන් වහන්සේ විසින් නියෝජනය කරනු ලබන්නේ බුදු රජාණන් වහන්සේ වේෂ - භූෂණයෙන් සැදුම් ලද්දෝ ය. වෙස් මුහුණු පැලඳ හෝ දගා මුහුණ රචනය කර ඇත. යක්ෂ විමානය වශයෙන් සලකනු ලබන ස්ථානයක් ඇත.

කථා ප්‍රවෘත්තිය ප්‍රේක්ෂකයාට දැන ගැනීමට ලැබෙන්නේ භික්ෂූන් වහන්සේ ගේ දේශන හා නළුවන් ගේ සංවාද ඇසුරෙනි.

පසුබිමින් බෙර වාදනය සහාය වන අතර, දැල්වූ, පන්දම් මඟින් ආලෝකය ලබා '' හූ'' කීම් වැනි ශබ්ද අවශ්‍ය ස්ථානයන්වල යොදාගැනේ.

රංග භූමිය වශයෙන් බොහෝ විට පන්සලේ ධර්ම ශාලාව ඇසුරු කර ගැනේ. උපාසක - උපාසිකාවෝ ප්‍රේක්ෂකයෝ ය. නළු වෙස් ගන්නෝ ඔවුනතරින් යමින් එමින් රංගනයෙහි යෙදෙති. මේ ආදි ප්‍රාසංගික ලක්ෂණ බොහෝවක් මෙම පූජා කර්මයෙහි දක්නට ලැබේ.

පියවර 3

මිලින්ද ප්‍රශ්නයේ දී ධර්ම දේශක ස්ථවිරයන් වහන්සේ නාගසේන හිමියන් වශයෙන් ද, වෙන ගිහියෙක් රාජාභරණ හා කිරුළ පැලඳ මිළිඳු රජු වශයෙන් ද සැරසෙති. මෙහි දී යොදාගැනෙන්නේ '' මිලින්ද ප්‍රශ්නය'' නැමැති ග්‍රන්ථයෙහි එන ප්‍රශ්නෝත්තර ය.

'මිලින්ද ප්‍රශ්නය' භාර කණ්ඩායමට පැවරූ සංවාද කොටස නාට්‍යානුසාරී ව කියැවීමට අවස්ථාව ලබාදී ප්‍රාසංගික ලක්ෂණ සෙවීම පිණිස සහාය වන්න.
එහි දී වේෂභූෂණ, සංවාද භාවිතය, නාට්‍යෝපකරණ භාවිතය, අංග රචනය, කථාව ඉදිරිපත් කරන නාට්‍යමය උපක්‍රම, ප්‍රේක්ෂක සහභාගිත්වය, ආලෝකය යොදා ගැනීම, වාද්‍ය සහාය හා ශබ්ද භාවිතය වැනි ප්‍රාසංගික ලක්ෂණ සොයාබැලීම සඳහා සිසුන් යොමු කරන්න.

පියවර 4

ප්‍රාසංගික ලක්ෂණ බොහෝවක් අඩංගු තවත් බෞද්ධ පූජා කර්මයක් වනුයේ සති පිරිතක් අවසානයේ සිදු කරනු ලබන 'දොරකඩ අස්න' ය.

මෙහි කතාව වනුයේ සති පිරිත් අවසන් දිනයේ පිරිත් ඇසීමට දෙවිවරුන්ට ආරාධනා කිරීම ය. ගෞරවාන්විත ව ගෙන එනු ලබන තල් ගොබයේ පත් ඉරුවල 'දේව ආරාධනා' ලියා සරසනු ලැබූ කත්

ලීයක දෙපස රඳවා, දේවදූතයකු සේ සැරසුණු පිරිමි ළමයකු සතර දේවාලයය වෙත යනුයේ පෙරහැරකිනි. සතර දේවාලය යේ සතර කොන ආරාධනා පත් එල්වනු ලැබ පෙරහැර ආපසු විහාරයට පැමිණේ.

පෙරළා පැමිණි පසු දේවදූතයා කඩු ගත් රැකවලුන් විසින් මුර කරන ලද කාමරයක රඳවා රාත්‍රියෙහි පිරිත් කීමට භික්ෂූන් වහන්සේ යළි වඩින තුරු එසේ තබනු ලැබේ.

අවසාන ජවනිකාවේ දී භික්ෂූන් වහන්සේ පිරිත් මණ්ඩපයෙහි වැඩ හිඳිති. දේවදූතයා දොරටුව ළඟ සිටී. කඩු ගත් දොරටු පාලයෝ ඔහු දෙපස සිටිති. දේවදූතයා හා කැටිව ආ භික්ෂුව පිරිත් මණ්ඩපයෙහි තිබෙන යුග පුටුව අසල නැඟී සිටී, එම ස්ථානය කැටයම් කපන ලද පුවක් කරටියකින් සරසා ඇත්තේ ය. භික්ෂුව හා දේවදූතයා අතර සංවාද ඇති වේ.

මෙම පූජා කර්මයෙ ද වෙස්වළා ගැනීම, නාට්‍යෝපකරණ භාවිතය, රංගභූමිය භාවිත කිරීම, සංවාද භාවිතය, ප්‍රේක්ෂක සහභාගිත්වය වැනි ප්‍රාසංගික ලක්ෂණ අඩංගු වේ.

පියවර 5 ඒ ඒ කණ්ඩායම්වලට අදාළ අංගය නිරූපණය කිරීමට අවස්ථාව සලසන්න. අගය කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සංවාද භාවිත කිරීම.
- නිවැරදි ලෙස භාෂාව හැසිරවීම.
- රූපණයෙහි යෙදීම.
- ප්‍රාසංගික ලක්ෂණ හුවා දැක්වීම.
- බෞද්ධ කථා තේමා කොට නාට්‍ය පෙළ රචනය

**පැවරුම** :
- බෞද්ධ කථා හෝ වෙනත් ආගමික කථා හෝ තේමා කරගෙන නාට්‍ය පෙළ රචනා කරන්න.

**අතිරේක උදවු** : එදිරිවීර සරච්චන්ද්‍ර - සිංහල ගැමි නාටකය.

**දොරකඩ අස්න - භික්ෂුව හා දේවදූතයා අතර ඇති වන සංවාදය**

| | | |
|---|---|---|
| භික්ෂුව | - | විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිස්සු ඇත. |
| දේව දූතයා | - | සර්ව ශීලාද්‍ය අමිත ගුණ ගණාංගයෙන් උපලක්ෂිත වූ පින්වත් ස්වාමීන් වහන්ස, විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩපය ද්වාරයෙහි මිනිස්සු ඇත. |
| භික්ෂුව | - | සරද නිශේන්ද්‍රාකාශ කුන්දෙන්දු වාරණ විශද විමලකීර්ති මාලාලංකෘත ප්‍රවරතර සුරේන්ද්‍රාරාධනාවට ගියෝත් අවු ද ? |
| දේවදූතයා | - | නෛකබලපරාක්‍රම ප්‍රතාපාලංකෘත වූ සුරේන්ද්‍රාරාධනාවට ගියා වූ දේවදූතයා වන මම මෙහි අවුත් සිටියෙමි. |
| භික්ෂුව | - | අමිත, තෙජොබල වික්‍රම ප්‍රතාපාලංකෘත කමලාසනෙන්ද්‍රාදි දෙවියෝත් අවු ද ? |

දොරකඩ අස්නයේ පෙළ ඃ

| | | |
|---|---|---|
| දේවදූතයා | - | පින්කම කරවීමට ඇතුළත් ''දායක මූලික කාරකාදී සකල ශ්‍රද්ධාවන්ත සත්පුරුෂ ජනයන්ගේ බාහ්‍යාභ්‍යන්තරොත්පන්න දුඃස්වප්න දුර්නිමිත්ත කලිකලහ වෛකල්‍ය විග්‍රහාදීන් වන්නා වූ අෂ්ටාතිරේක නවතිසංඛ්‍යාත ව්‍යාධියෙන් හා සංවත්සර ඍතුපරිවර්තනොපක්‍රම ජන්ම නක්ෂත්‍රාධිවර්ධනය පිණිස ධෘතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණ යන සතර වරම් දෙවි මහරජ දරුවන් ඇතුළු සැම දෙවියන් ම සහ පිරිවරින් වැඩි බව ය. |

**ආලවක දමනය ඃ**

ආලවක යක්ෂයාගේ විමානයෙහි මුරකාවල සිටි ගදභ නම් යක්ෂයා හා බුදුන් වහන්සේ වෙනුවට පෙනී සිටි භික්ෂූන් වහන්සේ අතර කෙරෙන සංවාදය

| | |
|---|---|
| ගදභයා ඃ | මේ අවේලාවේ ඔබ වහන්සේ මේ විමානයට වැඩියේ ඇයි ? |
| භික්ෂුව ඃ | මේ එන්න ම වුවමනාවක් නිසා තමයි මම ආවේ. ඔබ ඉඩ දෙනවා නම් මම කැමති යි මෙහේ නවාතැන් ගන්න අද රාත්‍රියට. |
| ගදභයාඃ | අනේ බුදු රජාණන් වහන්ස, ඔබ වහන්සේ මේ ස්ථානය ගැන දන්නේ නැද්ද? මේ ආලවක යකාගේ විමානය. මගේ තැනක් නම් ඔබ වහන්සේට නවාතැන් දෙන එකත් අරුමයක් ද ? මේ ජේනව නේ බිම හැටි. හැම තැන ම ලේ. මිනී කාල හැම තැන ම ලේයි ඇට කටුයි. මෙහෙම තැනක හිටියොත් ඔබ වහන්සේට මොනව වෙයි ද කියලා හිතාගන්න පුළුවනි. |
| භික්ෂුව | මට ඕන නෑ යකාගෙ නපුරුකම් ගැන දැනගන්න. මම ඒව නොදැන නොවේ ආවෙ. මම අද මෙතන නවතින්න ම යි අධිෂ්ඨාන කර ගත්තේ |

## මිලින්ද ප්‍රශ්නය

මිලිඳු රජු හා නාගසේන හිමියන් අතර ඇති වන සංවාදය

මිලිඳු රජු : ස්වාමීනී, නුඹ වහන්සේ කවර නම් වී ද ?

නාගසේන ස්ථවිර : මහ රජාණෙනි, මම නාගසේන යයි දන්වමි. මහ රජාණනි, සබ්‍රහ්මචාරීන් වහන්සේලා මට නාගසේන යයි කියති. තව ද නම් තබන්නා වූ දෙමව්පියෝ නාගසේන යයි කියා හෝ සූරසේන යයි කියා හෝ වීරසේන යයි කියා හෝ සිංහසේන යයි කියා හෝ නම් කෙරෙති. තව ද මහරජාණෙනි, යම් මේ නාගසේන යයි කියා සැලකිය යුතු වූ සංඥා මාත්‍ර වූ ප්‍රඥප්ති ව්‍යවහාරය නාම මාත්‍රයෙක මෙහි නාගසේන යයි කියා පුද්ගලයෙක් නොලබන්නේ ය.

මිලිඳු රජු : (සභාව අමතා) මේ සභායෙහි රැස් ව සිටින පන්සියයක් යොන් අමාත්‍යයෝ ද අසූ දහසක් පමණ භික්ෂු සංඝයා වහන්සේ ද මාගේ වචනය ඇසුව මැනව. මේ නාගසේනයන් වහන්සේ මෙහි නාගසේන යයි කියා පුද්ගලයෙක් නොලබන්නේ යයි මෙසේ කී සේ ක. (ස්ථවිරයන් අමතා) ස්වාමීනී නාගසේනයන් වහන්ස, ඉදින් පුද්ගලයෙක් නොලැබේ නම් කවරෙක් දූන් නුඹ වහන්සේට සිවුරු, ආහාර, සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකර දේ ද ? .... යමෙක් නුඹ වහන්සේ මරා ද ඕ හට ප්‍රාණඝාත අකුසල නැත. මහරජ මට සබ්‍රහ්මචාරීන් වහන්සේලා නාගසේන යයි කියා වදාරන සේකැයි කියා යමක් නුඹ වහන්සේ කී සේක් ද ? මෙහි නාගසේන වූයේ කවරෙක් ද? කිමෙක්ද ස්වාමීනී, හිසකේ නාගසේන ද ?

නාගසේන ස්ථවිර : නැත මහ රජාණෙනි,

මිලිඳු රජ : එසේ වී නම් නියපොතු, දත්, සම්, මස්, නහර .... ආදිය නාගසේන ද ?

නාගසේන ස්ථවිර : නැත මහ රජාණෙනි

මිලිඳු රජ : එසේ වීනම් රූපය ................වේදනාව, සංඥා... ආදිය නාගසේන ?

නාගසේන ස්ථවිර : නැත මහරජාණනි,

මිලිඳු රජු : එසේ වී නම් ස්වාමීනී, නුඹ වචනාර්ථයෙන් සිස් වූ නාගසේනයෙමි. කියා මුසාවාදයක් කී සේක. නාගසේන කෙනෙක් නැත.

නාගසේන ස්ථවිර : මහරජ කිමෙක් ද තෙපි පයින් ම ආයේ ද ?

මිලිඳු රජු : ස්වාමීනි මම පයින් නොආයෙමි. රථයෙන් ම ආයෙමී

නාගසේන ස්ථවිර : මහරජ, තෙපි ඉදින් රථයෙන් ආවෝ නම් රථය මට කියා දෙව. කිමෙක් ද මහරජ, රථ ඉස රථය ද ?

මිලිඳු රජු : නැත ස්වාමීනි

නාගසේන ස්ථවිර : රථ චක්‍රය, රථ පඤ්ජරය, රථ දණ්ඩ, විය, රැන, කෙවිට යන මේ සියල්ල ම රථය ද ?

මිලිඳු රජු : නැත ස්වාමීනි

නාගසේන ස්ථවීර : මහරජ, තෙපි බොරු වූ මුසාවාදයක් කිව්වාහු ය. ඇති රථයෙක් නැත. මහරජ, තෙපි සකල ජම්බුද්වීපයෙහි අග්‍රරාජ තනතුරට පැමිණියාහු ය. තෙපි වනාහි කවුරුන්ට භය ගෙන කුමක් පිණිස මෙසේ බොරු කියවු ද ?

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2** : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් පිළිබඳ ව විමසයි.

**ක්‍රියාකාරකම 4.2.1** : එදිරිවීර සරච්චන්ද්‍ර

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිෂ්පාදනය කැරුණු නාට්‍ය නම් කරයි.
- එම නාට්‍ය වර්ග කරයි.
- එම නාට්‍යවලට පාදක වූ කථාවස්තු විමසයි.
- සිංහල නාට්‍ය කලාවේ සරච්චන්ද්‍රයන්ගේ දායකත්වය අගයයි.
- නාට්‍ය පෙළ රසවිඳියි.

**ගුණාත්මක යෙදැවුම්** :
- එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ ඡායාරූපයක්
- එතුමන් විසින් රචිත නාට්‍ය පෙළ කීපයක්
- එම නාට්‍යයක සංයුක්ත තැටියක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ නාට්‍යයක කොටසක් හෝ එම නාට්‍යයක සඳහන් වන ජනප්‍රිය ගීතයක් හෝ සිසුන්ට ඉදිරිපත් කරමින් පාඩමට පිවිසෙන්න. එම කොටස /ගීතය උපුටා ගැනුණු කෘතිය සඳහන් කරමින් ඒ ඔස්සේ සරච්චන්ද්‍ර නම සඳහන් කොට එම ඡායාරූපය පෙන්වමින් මූලික හැඳින්වීම සිදු කරන්න.

**පියවර 02**
- 1940 දශකය වන විට විශ්වවිද්‍යාලයය තුළ සිංහල නාට්‍යය පිළිබඳ ව තිබූ උනන්දුවත්, එම උද්යෝගය ඇති කිරීම සඳහා සරච්චන්ද්‍රයන් විසින් කරනු ලැබූ කැප කිරීමත් සිසුන් හා සාකච්ඡා කරන්න.
- සිංහල සාම්ප්‍රදායික ගැමි කලාව ආශ්‍රය කරගනිමින් සිංහල නාට්‍යයේ නව ආකෘතියක් ගොඩනැගීමට එතුමා කර ඇති පර්යේෂණ විස්තර කරන්න.
- පුරාණෝක්ති, ජන කථා, ජාතක කථා මෙන් ම වර්තමාන සමාජ සංසිද්ධි ද භාවිත කරමින් ප්‍රශස්ත ගණයේ නාට්‍ය රාශියක් බිහි කිරීමට සරච්චන්ද්‍රයන් දායක වී ඇති ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මෙම සැම නිර්මාණයක් ම නව දෘෂ්ටියක් හා අපූර්වත්වය කුළු ගැන්වෙන අයුරින් ඉදිරිපත් කිරීමට ඔහු සතු ව පැවති සමත් බව සඳහන් කරන්න.

**පියවර 03**
- සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය කෘති - පෙළ - සිසුන්ට පෙන්වමින් එම නාට්‍යවල නාමාවලියක් සකස් කරන්න. එම නාට්‍යවලට පාදක වූ කථා වස්තු සැකෙවින් විස්තර කරන්න.

- ඒ අනුව  එම නාට්‍ය අංශ  හතරක් යටතේ වර්ග කරන්න.
    1. වෙනත් භාෂාවලින්  ලියැවුණු නාට්‍යවල අනුවර්තන  වශයෙන් නිෂ්පාදනය කළ නාට්‍ය  (මුදලාලිගේ පෙරළිය, කපුවා කපෝති, හැංගිහොරා, වලහා, මගුල් ප්‍රස්තාව, මැනේජර්, වෙද හටන)

    2. ජාතක කතා ඇසුරින්  නිෂ්පාදනය කළ නාට්‍ය  (පබාවතී-  කුස ජාතකය, මනමේ - චුල්ල ධනුග්ගහ ජාතකය,  වෙස්සන්තර- වෙස්සන්තර ජාතකය, කදාවළලු - සේරිවාණිජ ජාතකය, මහාසාර - මහාසාර ජාතකය, ලෝමහංස -  මහා පදුම ජාතකය, බව කඩතුරාව - ස්වර්ණ හංස ජාතකය )

    3. පුරාවෘත්ත හා වෙනත් කතා  ආශ්‍රයයෙන්  නිෂ්පාදනය කළ නාට්‍ය (ඒකට මට හිනා හිනා, රත්තරං, වෙල්ලවැහුං, එලොව ගිහින් මෙලොව ආවා, සිංහබාහු, හස්ති කාන්ත මන්තරේ, පේමතෝ ජායතී සෝකෝ)

    4. ස්වතන්ත්‍ර නාට්‍ය
       (බහින කලාව, වටපුළුවේ ගෙවල් බිඳලා, වඳින්න ගිය දේවාලය)

ඉහත ගොඩනැඟූ සටහන සිසුන්ට ලියා ගැනීමට සලස්වන්න.

පැවරුම  :

- සිංහල නාට්‍ය කලාවට  එදිරිවීර සරච්චන්ද්‍රයන්  අතින් සිදු වූ  සේවය සහ ඔහු විසින් නිෂ්පාදනය  කෙරුණු  නාට්‍ය පිළිබඳ ව  කරුණු ගොනු වන සේ  ප්‍රශ්නෝත්තර සංග්‍රහයක්  සකස් කරන්න.  (මෙහි දී  සිසුන් කණ්ඩායම් දෙකකට  බෙදා එක්  කණ්ඩායමක් ලවා  ප්‍රශ්න ද අනෙක් කණ්ඩායම ලවා  පිළිතුරු ද  සකස් කොට  ඒවා එක්තැන්  කරමින් ප්‍රශ්නෝත්තර  සංග්‍රහය  පිළියෙළ කළ හැකි ය.  )

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සිංහල නාට්‍ය කලාව  වෙනුවෙන්  එදිරිවීර සරච්චන්ද්‍රයන්  අතින් සිදු වූ සේවය විස්තර කිරීම.
- එතුමා විසින් නිෂ්පාදිත  නාට්‍යවල  නාමාවලියක් සකස් කිරීම.
- එම නාට්‍ය වර්ග කිරීම.
- එම නාට්‍යවලට  පාදක වී ඇති කථා වස්තු  එක්රැස් කිරීම.
- නාට්‍ය පෙළ රස විඳීම.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2** : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් පිළිබඳ ව විමසයි.

**ක්‍රියාකාරකම 4.2.2** : දයානන්ද ගුණවර්ධන

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- දයානන්ද ගුණවර්ධන ගේ නාට්‍ය නිෂ්පාදන නම් කරයි.
- එම නාට්‍යවල ඇති විශේෂ ලක්ෂණ විමසයි.
- එම නාට්‍යවලට තේමා වූ කථාවස්තු ප්‍රකාශ කරයි.
- දයානන්ද ගුණවර්ධන ගේ නාට්‍ය පෙළ රස විඳියි
- සිංහල නාට්‍යයේ ප්‍රගමනයට දයානන්ද ගුණවර්ධන ගෙන් ඉටු වූ මෙහෙවර අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- දයානන්ද ගුණවර්ධන ගේ ඡයාරූපයක්
- ඔහු විසින් නිෂ්පාදිත නාට්‍ය පෙළ හා ඒවායේ සංයුක්ත තැටි, එම නාට්‍යවල දක්නට ලැබෙන ජනප්‍රිය ගීතවල පිටපත්, තෝරාගත් කොටස් කීපයක පිටපත්.
- එම නාට්‍යයක සංයුක්ත තැටියක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- 'නරි බෑණා' නාට්‍යයේ අවස්ථාවක් පෙන්වමින් හෝ ගීතයක් අසන්නට සලස්වමින් හෝ සිසුන් හා එක් ව ගීතයක් ගයමින් හෝ පාඩමට පිවිසෙන්න. එම ගීතය අඩංගු කෘතිය පිළිබඳ ව සඳහන් කරමින් එහි නිර්මාතෘ දයානන්ද ගුණවර්ධන නම් වූ සුවිශේෂ නාට්‍යවේදියා බව සඳහන් කරන්න.

**පියවර 02**
- දයානන්ද ගුණවර්ධන යනු සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ සුවිශේෂ නාට්‍යකරුවකු බවත්. අපූර්වවත්වයෙන් යුතු ව සිද්ධි ගැළපීමෙහි ලා දයානන්ද ගුණවර්ධනයන් අතිදක්ෂයකු බවත් සිසුන්ට පැහැදිලි කරන්න. පහත සඳහන් කරුණු ද ආශ්‍රය කරගනිමින් ඔහු ගේ නාට්‍ය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ජනකතා දෙකක් ඇසුරින් 1961 වසරේ දී ලියැවුණු ඔහු ගේ නරිබෑණා නාට්‍යය බෙහෙවින් ජනප්‍රිය නාට්‍යයකි. ගම දුවක සරණපාවා ගන්නා නරියකු හා ඔවුන් ගේ නොගැළපීම පිළිබඳ ව හාස්‍යෝත්පාදක කථාවක් එම නාට්‍යයට පාදක වේ.
- මෙම නාට්‍යය සමඟ ම 'කාමරේ පොරේ' නම් වූ තවත් නාට්‍යයක් වේදිකාගත කොට ඇත.
- විදේශීය නාට්‍යයකින් ලබාගත් තේමාවක් අනුව නිර්මාණය කළ 'බක්මහ අකුණු' නාට්‍යය හාස්‍ය රසයෙන් අනූන වූ අපූර්ව නිර්මාණයකි.
- කාර්යාලයයක කම්කරුවකු ණයක් ලබාගැනීමට ගත් උත්සාහයත්, එහි ප්‍රතිඵලය වශයෙන් ඔහු රෝගියකු වන ආකාරයත් පිළිබිඹු වන 'ජීවන වංචාව හෙවත් ඉබිකට්ට' නාට්‍යය ද ඔහු ගේ කෘතියකි.

- සාම්ප්‍රදායික ගැමි නාටක විශේෂයක් වූ කෝලම් නාටකයෙහි එන චරිතයක් උපයෝගී කරගනිමින් ගැමි රංග ශෛලියෙන් නිර්මාණය කෙරුණු ''ජස ලෙන්චිනා'' ප්‍රේක්ෂකයන් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත් විය.

- මාතර යුගයේ ජීවත් වූ ප්‍රකට කිවිඳියක වන ගජමන් නෝනා ගේ චරිතය අළලා නිෂ්පාදිත ''ගජමන් පුවත'', රාවණ යුගයෙන් පටන්ගෙන ඩුබායි යන වංශවතී තෙක් වූ ලංකා ඉතිහාසයේ රස මුසු තැන් විදහා දක්වෙන ''මධුර ජවනිකා'', බෞද්ධ අධ්‍යාපන පුනරුදය සඳහා ගෙන ගිය ඓතිහාසික අරගලය හා කැප කිරීම විදහා දක්වෙන ''ආනන්ද ජවනිකා'' යන නිෂ්පාදන දයානන්ද ගුණවර්ධන ගේ නිර්මාණ වන අතර මෙහි සඳහන් ''මධුර ජවනිකා '' හා ''ආනන්ද ජවනිකා'' ''වාර්තා රංග'' ගණයට අයත් වේ.
- මීට අමතර ව ස්වර්ණ තිලකා, පරාස්සයා, ඇමති පට්ටම, පිංගුත්තර ආදි නාට්‍ය ද ඔහුගේ නිර්මාණ වේ.

**පියවර 03**

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා දයානන්ද ගුණවර්ධන ගේ නාට්‍ය පෙළවලින් තෝරා ගත් කොටස් සඳහන් පත්‍රිකා ඒ ඒ කණ්ඩායම්වලට ලබාදෙන්න. එය මැනවින් අධ්‍යයනය කොට එහි සංවාද පුනරුච්චාරණය කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න. ඒ සඳහා මිනිත්තු 05ක තරම් සීමිත කාලයක් ලබා දී අනතුරු ව එම කොටස නාට්‍යරූපී ව ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යකරුවකු වශයෙන් දයානන්ද ගුණවර්ධන ගේ සුවිශේෂත්වය ප්‍රකාශ කිරීම.
- ඔහු ගේ නාට්‍ය නාමාවලියක් සකස් කිරීම.
- එම නාට්‍යවලට පාදක වූ කථා වස්තු එක්රැස් කිරීම.
- නාට්‍ය පෙළ රස විඳීම
- ස්වකීය රංගන කුශලතාව ප්‍රදර්ශනය කිරීම.

පැවරුම :

- දයානන්ද ගුණවර්ධන ගේ නාට්‍යවල දක්නට ලැබෙන ජනප්‍රිය ගීත ඇතුළත් ගොනුවක් සකස් කරන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2 :** ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් පිළිබඳ ව විමසයි.

**ක්‍රියාකාරකම 4.2.3** : ගුණසේන ගලප්පත්ති

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගැනුම් පල** :

- ගුණසේන ගලප්පත්ති ගේ නාට්‍ය නිෂ්පාදන පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- එම නාට්‍යවල අන්තර්ගතය විමසයි.
- විදේශීය නාට්‍ය දේශීයත්වයට ගළපා ඇති ආකාරය පිරික්සයි.
- දේශීය චින්තන රටාව නාට්‍යය සඳහා යොදාගැනීමේ සාර්ථකත්වය අත්විඳියි.
- ගුණසේන ගලප්පත්ති ගේ නාට්‍යවල සඳහන් ජනප්‍රිය ගීත ගයයි ; විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :

- ගුණසේන ගලප්පත්ති ගේ ඡායාරූපයක්, ඔහු විසින් නිර්මාණය කරන ලද නාට්‍ය පෙළ කීපයක් ''මූදු පතුල යට ඉඳලා'' ''එපා පුතුනේ මූදු යන්නට.... වැනි භාවාත්මක ගීතවල පිටපත් කීපයක් /ශ්‍රව්‍ය පටයක්.

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01**-

- ඔබ විසින් තෝරාගන්නා ලද ගීතය සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබාදෙන්න. එම ගීතවල පිටපත් සිසුන්ට බෙදා දී ශ්‍රව්‍ය පටයට සමගාමී ව ගීතය ගායනා කිරීමට අවස්ථාව ලබාදෙන්න. ඉන්පසු ව එම ගීතය අඩංගු නාට්‍යය කුමක් ද ?, එම නාට්‍යයේ නිර්මාතෘ කවුරු ද ආදි වශයෙන් ''ගුණසේන ගලප්පත්ති'' යන නාමය සිසුන්ට හඳුන්වා දෙන්න.

**පියවර 02**

- පහත සඳහන් කරුණු අවධාරණය වන සේ ගුණසේන ගලප්පත්ති ගේ නාට්‍ය ක්‍රමවේදය හා ඔහු විසින් නිෂ්පාදිත නාට්‍ය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක් සිදුකරන්න.
- 1957 වර්ෂයේ දී ගුණසේන ගලප්පත්ති විසින් නිපැදවුණු ''සඳ කිඳුරු'' නාට්‍යය පැරණි කවි නාඩගම් ශෛලියට අනුරූප ව සකස් වූ අතර, එයට ආශ්‍රය කරගනු ලැබුවේ පතිව්‍රතාවේ බලමහිමය කියැවෙන චන්ද කින්නර ජාතකය යි.
- 1962 වර්ෂයේ දී ඔහු විසින් නිෂ්පාදනය කෙරුණ ''මූදු පුත්තු'' නම් විශිෂ්ට නිර්මාණයට පාදක වූයේ ස්පාඤ්ඤ ජාතික ෆෙඩ්රිකෝ ගාර්ෂියා ලෝර්කාගේ යෙර්මා නැමති නාට්‍යය යි. මෙය සිංහල නාට්‍ය කලාවේ අමරණීය නිර්මාණයක් ලෙස විචාරක පැසසුමට පාත්‍ර වූවකි.
- ධීවර ගම්මානයක් පසුබිම් කොට නිෂ්පාදිත ''මූදු පුත්තු'' නාට්‍යයෙන් කියැවෙන අනුවේදනීය කතා පුවත විශිෂ්ටත්වයට පත් වන්නේ එය සැම ප්‍රේක්ෂකයකු ම ස්වාත්ම අත්දැකීමක් ලෙස විඳින නිසා ය. ධීවර ගම්මානයක ජීවත් වන 'සරා', ඇගේ සැමියා වන තේගිරිස් හා ඔහු ගේ මලණුවන් වන 'දියෝනිස්' යන චරිත ත්‍රිත්වය යොදාගනිමින් සරා දරුවකු ලබා ලබාගැනීමට දරන උත්සාහයත්, තේගිරිස් අතින් දරුවා මිය යාමත් පිළිබඳ ඛේදාන්තය විග්‍රහ කරන්නේ ගීතවත් බස් වහරක් මගින් ප්‍රේක්ෂකයා ඇදබැඳ ගනිමිනි.

- 1963 දී ස්වතන්ත්‍ර නිර්මාණයක් ලෙස එළි දකින ''දේවතා එළි'' 1964 දී ස්වතන්ත්‍ර නිර්මාණයක් ලෙස එළි දකින '' දෑස නිසා'' 1967 දී දේශපාලන තේමාවක් සහිත ව එළි දකින ''ලියතඹරා '' 1969 දී දේශීය සංස්කෘතියෙහි දක්නට ලැබෙන කුටුම්බයේ අන්‍යෝන්‍ය සහසම්බන්ධය පිළිබිඹු කරමින් එළි දකින ''තාත්තා'', අද්භූත කථා පුවතක් රැගත් ''මාහේනේ රීරි යකා'' යන නාට්‍ය ගුණසේන ගලප්පත්ති විසින් නිෂ්පාදනය කරනු ලැබ ඇත.
- නාට්‍යධර්මී ශෛලිය කිසියම් ස්වාධීනත්වයක් සහිත ව යොදාගනිමින් බිහි කළ තමා ගේ ම සම්ප්‍රදායය අනුව ගුණසේන ගලප්පත්ති නිර්මාණකරණයෙහි නියැළී ඇත.

**පියවර 03**

- ''මූදු පුත්තු'' නාට්‍යයේ පෙළ ආශ්‍රය කරගනිමින් එහි සඳහන් කථා වස්තුව සිසුන්ට පැහැදිලි කරන්න. එහි චරිත පිළිබඳ ව සාකච්ඡා කරන්න. එය කතාන්දරයක් ලෙස ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- පාඩම මුළුමනින් ම ආවරණය වන සේ සකස් කරගත් ප්‍රශ්න මාලාවකට පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරමින් අවබෝධය ස්ථාවර කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ගුණසේන ගලප්පත්තිගේ නාට්‍ය නිෂ්පාදන නම් කිරීම.
- මූදු පුත්තු නාට්‍යයේ අන්තර්ගතය ප්‍රකාශ කිරීම.
- එම නාට්‍යවල දක්නට ලැබෙන දේශීයත්වය පිළිබඳ කරුණු දැක්වීම.
- දේශීය චින්තනය මඟින් නව නිර්මාණයකට අපූර්වත්වය ලබාදීමට ගලප්පත්ති සමත් වූ ආකාරය පැහැදිලි කිරීම.
- මූදු පුත්තු නාට්‍යයේ චරිත නම් කිරීම හා එම චරිතවල ස්වභාවය විස්තර කිරීම.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2 :** ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් පිළිබඳ ව විමසයි.

**ක්‍රියාකාරකම 4.2.4 :** රංජිත් ධර්මකීර්ති

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගෙනුම් පල :**
- රංජිත් ධර්මකීර්ති ගේ නාට්‍ය හඳුන්වයි.
- එම නාට්‍ය නාමාවලිය සකසයි.
- එම නාට්‍යවල විශේෂතා විස්තර කරයි.
- එම නාට්‍ය වර්ග කරයි.
- රංජිත් ධර්මකීර්ති ගේ නාට්‍ය රස විඳියි.

**ගුණාත්මක යෙදවුම් :** රංජිත් ධර්මකීර්ති ගේ ඡායාරූපයක්
ඔහු ගේ නාට්‍යවල සංයුක්ත තැටි හෝ ඡායාරූප, නාට්‍ය පෙළ කිහිපයක්, එම නාට්‍යවල විවිධ වර්ග හා ආකෘති පැහැදිලි වන ආකාරයෙන් උපුටාගත් කොටස්වල පිටපත් කිහිපයක්.

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- රංජිත් ධර්මකීර්ති ගේ නාට්‍යයක් හෝ කොටසක් හෝ සිසුන්ට නැරඹීමට අවස්ථාව ලබාදීම හෝ නාට්‍ය දර්ශන ඇතුළත් ඡායාරූප දකින්නට සැලැස්වීම හෝ මඟින් එම නාට්‍යකරුවා කවරෙක් 'දැයි සෙවීමේ පෙලඹවීමක් ඇති කොට, එහිදී නාට්‍යකරුවා ගේ ඡායාරූපය හඳුන්වා දෙමින් පාඩමට අවතීර්ණ වන්න.

**පියවර 02**
- රංජිත් ධර්මකීර්ති යනු සම්මානලාභී නාට්‍ය රචකයකු හා අධ්‍යක්ෂවරයකු මෙන් ම නවකතාකරුවකු , පරිවර්තකයකු හා ශාස්ත්‍රීය ග්‍රන්ථ සම්පාදකවරයකු ද වශයෙන් ප්‍රකට අයකු බව පෙන්වා දෙන්න.
- පරිවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය මෙන් ම සංගීතමය නාට්‍ය ද ඔහු විසින් නාට්‍ය ක්ෂේත්‍රයට දායාද කර ඇති ආකාරය සාකච්ඡා කරන්න.
- ඔහු ගේ ඉතා ම ජනප්‍රිය කෘති අතර

  හිරු නැති ලොව - පරිවර්තන නාට්‍යය

  මෝදර මෝල - ස්වතන්ත්‍ර නාට්‍යය

  මේස - ස්වතන්ත්‍ර නාට්‍යය යන නාට්‍ය සම්මාන දිනා ඇත.
- ඔහු ගේ සංගීතමය නාට්‍ය අතර 'අංගාරා ගඟ ගලා බසී. ' හා ' ආඬි රැළේ නාඩගම' ප්‍රසිද්ධ ඒවා ය.
- මීට අමතර ව ''හස්ති රාජ මහත්තයා '' නම් වූ අසම්මත නාට්‍යය ද අන්තන් චෙකෝව් ගේ '' චෙරි උයන'' නාට්‍යය ද විශේෂ වේ.

**පියවර 03**

- රංජිත් ධර්මකීර්ති ගේ නාට්‍යවල විවිධ ස්වභාවයන් පිළිබිඹු වන නාට්‍ය කොටස් අඩංගු කොට සකසා ගත් පත්‍රිකා පිළිබඳ ව සමස්තයක් ලෙස සිසුන් සමඟ පොදුවේ සාකච්ඡා කරන්න. ඉන් පසු සිසුන් කණ්ඩායම්වලට බෙදා උක්ත පත්‍රිකා එම කණ්ඩායම්වලට ලබාදෙන්න. තම කණ්ඩායමට ලැබුණු පත්‍රිකාවේ සඳහන් දේ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීමට කණ්ඩායමේ එක් අයකුට අවස්ථාව ලබාදෙන්න. ( එම කොටස උපුටාගත් නාට්‍ය පෙළ, කතුවරයා, තේමාව, වස්තුව, දළ වශයෙන් ආදි කරුණු මෙහි දී ඉදිරිපත් කළ යුතු වේ.)

- ඉහත සඳහන් ආකාරයට කරුණු ඉදිරිපත් කරද්දී එහි ඇති වැදගත් දෑ සටහන් කර ගැනීමට අනෙකුත් සිසුන්ට අවස්ථාව ලබාදෙන්න. මේ ආකාරයට සියලු පත්‍රිකාවල සඳහන් දේ පිළිබඳ ව ප්‍රකාශ කොට අවසන් වන විට පාඩමට අදාළ සටහන සිසුන් ගේ සටහන් පොත්වල ලියැවී තිබෙනු ඇත

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංජිත් ධර්මකීර්ති යනු කවරෙක් දැ යි හැඳින්වීම.
- රංජිත් ධර්මකීර්ති ගේ නාට්‍ය කෘති නාමාවලියක් සැකසීම.
- සපයා ඇති පත්‍රිකා අනුව අදහස් ප්‍රකාශ කිරීම.
- සටහන් නිවැරදි ව හා ක්‍රමවත් ව සකස් කිරීම.
- නාට්‍ය රස විඳීම.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.3** : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංගන ශිල්පීන් පිළිබඳ ව අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම 4.3.** :

4.3.1 මාලනී රණසිංහ
4.3.2 එඩ්මන්ඩ් විජේසිංහ
4.3.3 මාක් ඇන්ටනි ප්‍රනාන්දු
4.3.4 නිශ්ශංක දිද්දෙණිය
4.3.5 සාලමන් ෆොන්සේකා
4.3.6 ට්‍රිලීෂියා ගුණවර්ධන
4.3.7 සෝමලතා සුබසිංහ
4.3.8 සිරිල් වික්‍රමගේ

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගැනුම් පල** :

- ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ මුල් යුගයේ (50-60 දශක) රංගන ශිල්පීන් හඳුනාගනියි.
- ඔවුන් නිර්මාණය කළ රඟ දක්වන ලද හොඳ ම නාට්‍ය හා චරිත නම් කරයි.
- රංගනයට අමතර ව නාට්‍ය ක්ෂේත්‍රයේ ඔවුන් ගේ දායකත්වය විස්තර කරයි.
- ඔවුන් ගේ චරිත නිරූපණ හැකියාව සාකච්ඡා කරයි.
- සිනමාවේ හා ටෙලි නාට්‍යවල ඔවුන් ගේ දායකත්වය ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : • මාක් ඇන්ටනි ප්‍රනාන්දු, සාලමන් ෆොන්සේකා, එඩ්මන්ඩ් විජේසිංහ, මාලනී රණසිංහ, ට්‍රිලීෂියා ගුණවර්ධන, සෝමලතා සුබසිංහ, නිශ්ශංක දිද්දෙණිය, සිරිල් වික්‍රමගේ යන රංගන ශිල්පීන් ගේ ඡායාරූප එකතුවක්, ඔවුන් විසින් රඟ දක්වන ලද චරිත ඇතුළත් ඡායාරූප හෝ සංයුක්ත තැටි

ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01**

- (මෙම පාඩමේ දී එක් කාලච්ඡේදයකට රංගන ශිල්පීන් දෙදෙනකු පිළිබඳ ව පමණක් සාකච්ඡා කරන්න.)
  ඔබ විසින් තෝරාගන්නා ලද ශිල්පීන් දෙදෙනා ගේ ඡායාරූප ඉදිරිපත් කරමින් හෝ ඔවුන් විසින් නිරූපණය කරන ලද චරිත ඇතුළත් නාට්‍යමය අවස්ථාවක් සිසුන්ට පෙන්වමින් හෝ සාකච්ඡාව ආරම්භ කරන්න.

**පියවර 02**

- පහත සඳහන් කරුණු ද උපයෝගී කරගනිමින් රංගන ශිල්පීන් පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.
- **මාක් ඇන්ටනි ප්‍රනාන්දු** 1960 දශකයේ බොහෝ දෙනා ගේ අවධානයට ලක්වන්නේ සිංහබාහු නාට්‍යයේ සිංහයා ගේ චරිතයට පණ දීම නිසා ය. 1961 වර්ෂයේ දී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිෂ්පාදනය කරන ලද සිංහබාහු නාට්‍යයේ ආරම්භක වකවනුවේ සිංහයා ගේ චරිතය වේදිකාවේ නිරූපණය කරමින් මාක් ඇන්ටනි ප්‍රනාන්දු ප්‍රේක්ෂකයාට අමතක නොවන චරිතයක් බවට පත් විය. 'ඉඳහිට යන ගමන්' 'මමත් මිනිහෙක්' යන නාට්‍ය නිෂ්පාදනය කරමින් ඔහු නාට්‍ය ක්ෂේත්‍රයේ තව දුරටත් ඉදිරියට ගොස් ඇත.

- **මාලනී රණසිංහ** සිංහබාහු නාට්‍යයේ ආරම්භයේ සිට (1961) 'සුප්පා දේවී' චරිතය නිරූපණය කළා ය. දශක කීපයක් ම වේදිකාවේ රැඳී සිටි

ඇය 1985 දී කේ.බී.හේරත් ගේ මායා දේවී නාට්‍යයේ දෙනගම හාමිනේ (දුර්ගා) ගේ චරිතය නිරූපණය කරමින් එම වසරේ සාම නාට්‍ය උලෙළ සහ රාජ්‍ය නාට්‍ය උලෙළ යන නාට්‍ය උත්සව දෙකේ දී ම හොඳ ම සහාය නිළියට හිමි සම්මානය දිනාගත්තා ය. 1980 - වෙස්සන්තර ගීත නාටකයේ මද්‍රි දේවිය ගේ චරිතය නිරූපණය කළේ ද මාලනී රණසිංහ ය.

- **සෝමලතා සුබසිංහ** නාට්‍ය වේදිනියක ලෙස ශ්‍රී ලංකාවේ නාට්‍ය ක්ෂේත්‍රයේ නොමැකෙන නමක් තැබූ අයෙකි. ගුණසේන ගලප්පත්ති ගේ ''මූදු පුත්තු'' නාට්‍යයේ සාරා ගේ චරිතය (1962) නිරූපණය කරමින් ඇය දක්වූ රංගන කුශලතාව අතිශයින් විශේෂ වන අතර එය ප්‍රේක්ෂකයා ගේ සිත තුළ නොමැකෙන පරිදි සටහන් වූ බව කිව හැකි ය. එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ රත්තරං නාට්‍යයේ - මැහැල්ල ලෙස ද, එලොව ගිහින් මෙලොව ආවා නාට්‍යයේ කළුහාමී ලෙස ද ඇය විශිෂ්ට රංගනයක යෙදී ඇත. රංගන ශිල්පිනියක වශයෙන් පමණක් නොව නාට්‍ය නිෂ්පාදකවරියක ලෙස ද ඇය නාට්‍ය ක්ෂේත්‍රයේ නොමැකෙන නමක් තබා ඇත. ''විකෘති'' නාට්‍යයෙන් විවෘත ආර්ථිකය සමඟ ඇති වූ සමාජ සංකීර්ණත්වය වේදිකාවට ගෙන ආ ඇය ''තොප්පි වෙළෙන්දා, පුංචි අපට දූන් තේරෙයි'' වැනි ළමා නාට්‍යවලින් ළමා ප්‍රේක්ෂකයන් අතර ද ජනප්‍රිය වූවා ය.

එඩ්මන්ඩ් විජේසිංහ - 1956 මනමේ නාටකයේ ප්‍රථම දර්ශනයේ සිට වර්ෂ ගණනාවක් ම එහි වැදි රජු ගේ චරිතය රඟපාමින් මොහු සිය විශිෂ්ට රංගන කුශලතාව දක්වා ඇත. ඒ අතර ම එම නාට්‍යයේ ම රාජගුරු ගේ චරිතය ද ඔහු නිරූපණය කොට ඇත. 1958 දී එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ 'කදා වළලු' නාට්‍යයේ සේරිවාණිජ ගේ චරිතය රඟපාමින් ඔහු තව දුරටත් ප්‍රේක්ෂක ආකාර්ශනය දිනා ගත්තේ ය.

ට්‍රිලීෂියා ගුණවර්ධන 1956 දී මනමේ නාටකයේ ප්‍රධාන චරිතය වූ මනමේ කුමරිය ගේ චරිතය රඟපෑවේ ට්‍රිලීෂියා ගුණවර්ධන යි. (ට්‍රිලීෂියා අබේකෝන්). වේදිකාවේ ඉහළ ම දස්කම් පෑ 1960 දී වේදිකාගත වූ සරච්චන්ද්‍රයන්ගේ ''හස්තිකාන්ත මන්තරේ'' නාට්‍යයේ වාසුල දත්තා ගේ චරිතය රඟපාමින් සිය රංගන කුශලතාව තවදුරටත් පෙන්නුම් කළා ය. ට්‍රිලීෂියා ටෙලිනාට්‍යවලට හා සිනමාවට ද රංගනයෙන් දායක වී ඇත.

නිශ්ශංක දිද්දෙණිය ශ්‍රී ලංකාවේ නාට්‍ය වේදිකාවේ අමරණීය නමක් තබමින් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ නාට්‍යවලට රංගනයෙන් දායක වූ නිශ්ශංක දිද්දෙණිය 1970 වර්ෂයේ දී ''සිංහබාහු'' නාට්‍යයට සම්බන්ධ වන්නේ ''සිංහබාහු ගේ චරිතය නිරූපණය කරමිනි. දශක තුනකට ආසන්න කාලයක් ඔහු සිංහබාහු චරිතය රඟපෑම වාර්තාගත සිද්ධියකි. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ පිංගල ගේ චරිතය ද වෙස්සන්තර ගීත නාටකයේ සක්දෙව් චරිතය ද, ලෝමහංස ජාතකයේ බරණැස් රජු ගේ චරිතය ද ඔහු රඟපෑවේ ය. එසේ ම දයානන්ද ගුණවර්ධන ගේ ගජමන් පුවත නාට්‍යයේ ඇලපාත මුදලි ගේ චරිතය ඔහු විසින් නිරූපණය කරන ලද අමතක නොවන චරිතයකි.

සිරිල් වික්‍රමගේ සිනමාවේ ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයේ මෙන් ම වේදිකාවේ ද එක සේ දස්කම් පෑ සිරිල් වික්‍රමගේ විසින් රඟපාන ලද විශිෂ්ට ම චරිතයක් ලෙස ගුණසේන ගලප්පත්තිගේ ''මූදු පුත්තු'' නාට්‍යයෙහි ''තේගිරිස්'' ගේ චරිතය හඳුන්වා දිය හැකි ය. දරුවකු නොලබන ඔහු සරා විසින් ලබා ගන්නා ලද දරුවා ද ඝාතනය කිරීමට පෙලඹෙන්නේ මිනිස් සිතෙහි ඇති සංකීර්ණ භාවය ප්‍රකට කරවමිනි. සාර්ථක නළුවකු ලෙස ඔහු ප්‍රේක්ෂක අවධානය දිනාගෙන තිබේ.

සාලමන් ෆොන්සේකා - දයානන්ද ගුණවර්ධන ගේ නාට්‍ය බොහෝ ගණනකට රංගනයෙන් දායක වී ඇති සාලමන් ෆොන්සේකා නරිබෑණා දෙවැනි නිෂ්පාදනයේ දී නරියාගේ චරිතය නිරූපණය කරමින් ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගත්තේ ය. එසේ ම ''ජීවන වංචාව හෙවත් ඉබිකට්ට''නාට්‍යයේ ඔහු සාරගර්භ ගේ චරිතය නිරූපණය කරන අතර ජස ලෙන්චිනා නාට්‍යයේ (1965) හෙන්චා ගේ චරිතය ද රඟපා තිබේ. රංගභූමි අලංකරණය හා වෙස් ගැන්වීම් පිළිබඳ ව ද ඔහු දක්ෂතා පෙන්වා ඇත.

**පියවර 03**

- කාලච්ඡේදයේ දී සාකච්ඡා කරන ලද කරුණු ආශ්‍රය කර ගනිමින් කෙටි සටහනක් ලෙස සටහන් පොත්වල ලියාගැනීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නිර්දිෂ්ට රංගන ශිල්පීන් නම් කිරීම
- එම රංගන ශිල්පීන් විසින් චරිත නිරූපණය කරන ලද නාට්‍ය නම් කිරීම.
- රංගන ශිල්පීන් විසින් එම නාට්‍යවල නිරූපණය කරන ලද ප්‍රබල චරිත හැඳින්වීම.
- එම චරිතවල විශේෂත්වය සාකච්ඡා කිරීම.
- උගත් කරුණු ගොනු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම.

පැවරුම : උක්ත නාට්‍ය කරුවන් අටදෙනා පිළිබඳ ව කරුණු සාකච්ඡා කිරීම සඳහා කාලච්ඡේද හතරක් යොදාගන්න. පස් වැනි කාලච්ඡේදයේ දී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් සැලසුම් කොට ලබාගත් දැනුම තහවුරු කිරීමට කටයුතු කරන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.4 :** සංස්කෘතික හා සාමාජික වටිනාකම් සහිත තේමාවන්ට අනුව නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 4..4.1 : විවිධ ආගමික නාට්‍ය තේමා සොයා ගනිමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- නාට්‍ය සඳහා යොදාගත හැකි බෞද්ධ ආගමික කතා පුවත්හි තේමා ප්‍රකාශ කරයි.
- නාට්‍ය සඳහා යොදාගත හැකි කිතුණු ආගමික කතා පුවත්හි තේමා ප්‍රකාශ කරයි.
- එම ආගමික තේමාවන් මතු කර ගැනීම සඳහා යොදාගෙන ඇති කතා පුවත, මූලික සිදුවීම් හා චරිත විස්තර කරයි.
- සරල ව ඒවා මඟින් ලබාදෙන ආදර්ශ ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- පන්සිය පනස් ජාතක පොත
- ශුද්ධ වූ බයිබලය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** කණ්ඩායම් දෙකකට සිසුන් බෙදන්න. බෞද්ධ හා කිතුනු ආගම්වල ඇතුළත් කතා පුවත් දෙක සිසුන් වෙත ලබාදෙන්න. (නලපාන ජාතකය, නාස්තිකාර පුත්‍රයා)

එම කතා පුවත්හි තේමා සෙවීමට ඔවුන් අතර සාකච්ඡාවක් මෙහෙයවන්න. තේමාවක් සටහන් කරවන්න. සරල ව දක්වතොත් ඒවා මඟින් ලබාදෙන ආදර්ශ සාකච්ඡා කරවන්න.

**පියවර 02** එම කතා පුවත්හි තේමා සටහන් කර ගැනීමෙන් අනතුරු ව කණ්ඩායම් මඟින් එම තේමා මතු කර ගැනීම සඳහා යොදාගෙන ඇති කතා පුවත්, මූලික සිදුවීම් සහ චරිත විස්තර කරමින් ඒවා පෙළගස්වන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යෝචිත කතා පුවත් තෝරාගැනීම.
- ඒවායෙහි තේමා ප්‍රකාශ කිරීම.
- ඒවායෙහි චරිත පෙළ ගැස්වීම.
- එහි මූලික සිදුවීම් හරහා මතු වන ආදර්ශ දැකීම
- එම තේමාවන් වත්මන් සමාජය ඔස්සේ දැකීම.

පැවරුම : නාට්‍යයේ කථා වස්තුව ලිඛිත ව හෝ චිත්‍ර මාධ්‍යයෙන් හෝ ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

අතිරේක කතා පුවත්:
- වෙස්සන්තර ජාතකය (බෞද්ධාගමික)
- තලෙන්ත කතාව (කිතුනු ආගමික) ශු.මවේ 25.14.30
- යහපත් සාමාජිකයා ගේ කතාව (ශු.ලූක් 10.30.37)
- තිලමුට්ඨි ජාතකය (බෞද්ධාගමික)
- යහපත් සාමාජිකයාගේ කතාව (කිතුනු ආගමික)

ක්‍රියාකාරකම සඳහා යොදාගනු ලබන ආගමික කතා පුවත් දෙකක් පහත දැක්වේ.

**නළපාන ජාතකය ( 20 ජාතකය)**

යටගිය දවස එක්තරා වන ළැහැබක් විය. එහි නළපාන නම් පොකුණක් විය. එම පොකුණට උදක රාක්සයෙක් අරක්ගෙන සිටියේ ය. එම දිය රකුසා පොකුණට බට මිනිසුන් කන්නේ ය. එසමයෙහි බෝධිසත්ත්වයෝත් මහතැති වඳුරු රජු ව තිත් මුවකු සමඟ ඒ වනයෙහි විසුවෝ ය. තමන් සමග සිටින වානර සමූහයාට බෝසතාණෝ අවවාදයක් දුන් හ. එනම් මෙම වනයේ මෙන් ම එහි පොකුණුවල ද යක්ෂ, රාක්සාදීන් සිටින නිසා එම ස්ථානවල ඇති ගඩා ගෙඩි අනුභව කිරීම හෝ පැන් බීම හෝ තමා ගෙන් නොවිමසා නොකළ යුතු බව යි. එලෙස දිනක් වඳුරු පිරිස පොකුණක් දැක එහි පැන් නොබී බෝසතුන් ගේ පැමිණීම අපේක්ෂාවෙන් වටපිට බලමින් සිටියහ. එවිට බෝසතාණෝ පැමිණ ඔවුන් ක්‍රියා කළ අයුරු අගයමින්, පොකුණ වටා ඇවිද පියවර ඇත් දැයි පරික්ෂා කර, දියට බට පියවර තිබුණත් දියෙන් ගොඩට ආ පියවර නොදැක, ඇත්තෙන් ම මෙම පොකුණ අමනුෂ්‍යයන් ගහන පොකුණක් බව තීරණය කළහ. උදක රාක්ෂයා ද එම වඳුරන් දියට නොබසින බව දැක, තමා ගේ නිල් උදරය පෙන්වා, දත් විළිස්සමින් රතු අතුල් තල, පතුල් ඇති ව බියකරු වෙසින් දිය දෙබෑ කරමින් පොකුණෙන් උඩට ආවේ ය. දිය රකුසා වඳුරු පිරිස අමතා ''බලා නොසිට පොකුණට බැස පැන් බොව යි'' කී ය. එවිට මහ බෝසතාණෝ මෙසේ පැවසූහ. ''මේ පොකුණෙහි උපන් උදක රාක්සයා ඔබ ද ? ''එසේය, මම යි'' යනුවෙන් රාක්ෂයා පිළිතුරු දුන්නේ ය. ''පොකුණට බට අය කනවා දැ'' යි බෝසතුන් ඇසූ විට පොකුණට බසින පක්ෂියා ගේ සිට හැම අයකු ම තමා කන බවත්, මෙම වඳුරු පිරිස ද තමා ආහාරයට ගන්නා බවත් රකුසා පැවසුවේ ය. එහෙත් වඳුරු පිරිස ආහාරයට ගැනීමට ඔහුට ඉඩ නොදෙන බව බෝසත්හු පැවසූහ. දියරකුසා එවිට ඔවුන් පැන් බීමට සූදානම් දැයි ඇසී ය. ''ඔව් පැන් බොනවා. ඒමුත් නුඹට හසු නොවී'' යයි බෝසතාණෝ පැවසූහ. ''එලෙස පැන් බොන්නේ කෙසේ දැ'' යි රකුසා විමසූ විට බෝසතාණෝ ''එලෙස පැන් බොන අයුරු විස්තර කළාහ. එනම් වඳුරන් පොකුණට නොබැස එකිනෙකා බට දණ්ඩක් බැගින් ගෙන පැන් බීම සිදුකරන බව පැහැදිලි කරන ලදි. මෙම නැණවත් උපක්‍රමය ක්‍රියාත්මක කරනු සඳහා මහ බෝසතාණෝ එහි බට දණ්ඩක් ගෙන්වාගෙන පාරමී ධර්ම ආවර්ජනා කොට සත්‍ය ක්‍රියා කර එයට මුඛයෙන් පිඹිය හ. එලෙස පොකුණ අවට සියලු බට දඬු පැන් බීමට හැකි අයුරින් ඇතුළත වැසුණු තැන් විවර වී නළ බවට පත් විය.

නාස්තිකාර පුත්‍රයා ගේ කතාව (ශු.ලූක් 15.11.32)

එක් පියකුට පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. ඔවුන්ගෙන් බාලයා පියාට කතා කොට තමාට අයත් දේපළ පංගුව ලබාදෙන ලෙස ඉල්ලුවේ ය. පියා දෙදෙනාට ම අයත් කොටස් බෙදා දුන්නේ ය. ටික දිනකට පසු බාල පුත්‍රයා තම දේපළ විකුණා මුදල් රැගෙන දුර රටකට ගොස් ඒවා නාස්තිකාර ලෙස වියදම් කර දුරාචාරයේ යෙදී අසරණ තත්ත්වයට පත්විය. අවසානයේ දී ඔහු ඌරු කොටුවක දාසයකු බවට පත්විය. ඌරන්ට දෙන කෑම ඔහුගේ ද භෝජනය බවට පත්විය. මෙලෙස අන්ත අසරණ ව සිටින ඔහුට පියා ගේ කරුණා දයානුකම්පාව මතක්වන්නට විය. පියා ගේ මෙහෙකරුවන් පවා තමාට වඩා සුව පහසු ලෙස ජීවත් වන අයුරු සිහියට නැගෙන්නට විය. බාල පුතා නැවත පියා වෙත හැරී අවුත් තමාට පුත්‍රයකු ලෙස නොව දාසයකු ලෙස සලකා සමාව දෙන්නැයි අයැද සිටියේ ය. තමා දෙවියන් වහන්සේට හා පියාට එරෙහි ව ගත කළ ජීවිතය ගැන පසුතැවිලි විය. පියා තම මෙහෙකරුවන් කැඳවා සළුව ගෙන බාලපුතුට පළඳවන ලෙසත් ඇඟිල්ලෙහි මුදුවක් ද, පයට පාවහන් ද පලඳවන ලෙසත්, ඔහු වෙනුවෙන් විශේෂ භෝජන සංග්‍රහයක් පිළියෙල කරන ලෙසත් දන්වා සිටියේ ය. මේ අතර ඔහුගේ වැඩිමහල් පුත්‍රයා ගොවිපළ සිට එන විට නිවසෙහි සිට නැගෙන නැටුම්, ගැයුම්, වැයුම් හඬ අසා මවිත විය. ''ඔබේ නැති වූ සහෝදරයා පැමිණ සිටියි. ඔබේ පියා එය ජයෝත්සවයෙන් සමරනවා'' යැයි දාසයෝ පැවසූහ. වැඩිමහල් සහෝදරයා කිපී පියා අමතා තමා බොහෝ කාලයක් පියාට කීකරු ව නිවසේ වැඩ කටයුතු කළත් කිසි දවසක මෙවැනි සාදයක් නොපැවැත් වූ බව අවලාද ස්වරූපයෙන් පවසා සිටියේ ය. එවිට පියා ගේ පිළිතුර වූයේ '' අප ප්‍රීති සන්තෝෂ විය යුතු ම ය. මේ ඔබේ මල්ලී මැරී සිටි නමුත් නැවත ජීවත් ව සිටී'' යන්න යි.

**යහපත් සමාරිතයාගේ කතාව**

අසල්වැසියා යනු කවරේ ද? යන ප්‍රශ්නය අයකු ජේසුතුමාගෙන් ඇසූ අවස්ථාවේ දී එතුමා විසින් පවසන ලද උපමා කතාවකි. එය හඳුන්වනුයේ යහපත් සමාරිතයා ගේ උපමා කතාව නමින් ය.

එක් වංශවත් මිනිසෙක් ජෙරුසලමෙන් පිටත් වී මහ මඟ යද්දී සොර මුළකට හසු විය. සොරු ඔහු සතු දෙය පැහැරගෙන ඔහුට තළා පෙළා අඩපණ කොට මහ මඟ දමා ගිය හ. මහමඟ යන වංශවත් යුදෙව් පූජකයෙක් ද වංශවත් යුදෙව් නීතිඥයෙක් ද මොහු දැක ඔහු දෙස නොබලාම පාරේ අනික් පැත්තෙන් ගිය හ. මේ අතර එතැනින් ගමන් ගත් යුදෙව් වර්ගයා සතුරකු ලෙස සලකන සමාරිතානු වර්ගයට අයත් මිනිසෙක් ඔහුගේ තුවාලවලට තෙල් හා මිදි යුෂ ගල්වා ප්‍රතිකාර කොට තානායමට ගෙන ගියේ ය. පසු ව තානායම්කරුට මුදල් ගෙවා ඔහුට අවශ්‍ය පහසුකම් හා ප්‍රතිකාර ද ලබා දීමට කටයුතු කළේ ය. මෙම සොරුන් අතට පත් වූ පීඩා විඳි පුද්ගලයාට සැබෑ අසල්වැසියා වූයේ ඔහු විසින් සතුරකු ලෙස සලකන ලද ඔහුට උදවු වී උපකාර කළ පුද්ගලයා ය.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.4 :** සංස්කෘතික හා සාමාජික වටිනාකම් සහිත තේමාවලට අනුව නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 4..4.2 :** බෞද්ධ කිතුනු කථා පුවත් රංගනයට

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගැනුම් පල :**
- නළපාන ජාතකය සහ නාස්තිකාර පුත්‍රයාගේ හෝ යහපත් සමාරිතයා ගේ හෝ කතාව යන කතා පුවත් දෙකෙහි නාට්‍යමය අවස්ථා පෙළ ගස්වයි.
- චරිත සඳහා ළමයින් තෝරා ගනියි.
- ළමයින් ම සංවාද ගොඩනගාගනිමින් කතා පුවත ක්ෂණික නිරූපණයක් ලෙස පුහුණු වෙති.
- මූලික වේශභූෂණ යොදා ගනියි.
- කතා පුවත් රඟ දක්වයි.

**ගුණාත්මක යෙදැවුම් :**
- නළපාන ජාතකය
- නාස්තිකාර පුත්‍රයා /යහපත් සමාරිතයා ගේ කතාව

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- නළපාන ජාතකය සහ නාස්තිකාර පුත්‍රයා / යහපත් සමාරිතයා යන කතා පුවත් දෙක එම කණ්ඩායම් අතරේ බෙදන්න.
- එහි නාට්‍යමය අවස්ථා පෙළ ගස්වන්න.
- චරිත සඳහා ළමයින් තෝරා ගැනීමට සහාය වන්න.

**පියවර 02**
- ළමයින් විසින් ම සංවාද ගොඩනගමින් කතා පුවත ක්ෂණික නිරූපණයක් සේ පුහුණු කරවන්න.
- අවශ්‍ය නම් මූලික සහ සරල වේශභූෂණ යොදා ගැනීමට සලස්වන්න.
- කතා පුවත රඟ දැක්වීමට පෙර පෝස්ටර් නිර්මාණය කරවන්න.
- එළිමහනේ හෝ වේදිකාවක හෝ රඟ දැක්වීම් කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- ආගමික නාට්‍ය ප්‍රදර්ශනය කිරීමේ අරමුණ පැහැදිලි කිරීම.
- චරිතවල හා අවස්ථාවල හැඟීම් අනුව සංවාද නිර්මාණය කිරීම.
- වේශභූෂණ හා නාට්‍යෝපකරණ නිර්මාණය කිරීම
- චරිත නිරූපණය කිරීම
- ආගමික නාට්‍ය ඇසුරෙන් සමාජයට පණිවිඩයක් ඉදිරිපත් කිරීම.

පැවරුම : ආගමික නාට්‍ය සඳහා යොදාගත හැකි කතා පුවත් මාලාවක් සකස් කරන්න.

අතිරේක උදවු : • ජාතක කථා පොත, ශුද්ධ වූ බයිබලයේ කතා පුවත් අධ්‍යයනය කිරීම.

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.1** : නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින් සාමූහික රස වින්දනයෙහි යෙදේ.

**ක්‍රියාකාරකම 5.1.1** : නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි තේමාව හා කථා වස්තුව පිළිබඳ සොයා බලමු. (කදා වළලු)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :

- කදා වළලු නාට්‍යයට පසුබිම් වූ කථා වස්තුව පිළිබඳ විමසා බලයි.
- කථා වස්තුව මඟින් නාට්‍යකරුවා ඉස්මතු කරන තේමාව සොයා බලයි.
- කදා වළලු නාට්‍යයට පසුබිම් වූ ජාතක කථා වස්තුවේත් නාට්‍යයේ දැක්වෙන කථා වස්තුවේත් සමාන - අසමානතා පිළිබඳ සාකච්ඡා කරයි.
- ජාතක කථාකරුවාගේත්, නාට්‍ය රචකයාගේත් කතා තේමාවල ස්වභාවය පිළිබඳ විමසයි.
- ප්‍රධාන තේමාවට අමතර ප්‍රකට කෙරෙන අනුතේමා පෙළ ගස්වයි.
- කථා වස්තුව හා තේමාව පිළිබඳ විමසමින් කදා වළලු නාට්‍යය රස විඳියි.

**ගුණාත්මක යෙදැවුම්** :

- සේරිවාණිජ ජාතක කථාවේ ඡායා පිටපතක්
- කදා වළලු නාට්‍යයේ පිටපත් කීපයක්
- කදා වළලු නාට්‍යයේ දර්ශන ඇතුළත් පින්තූර කීපයක්
- කදා වළලු නාට්‍යයේ දෘශ්‍ය පටයක් - සීඩී/ඩීවීඩී

ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01**

පන්තියේ සිසුන් අතරින් හොඳින් කියැවීමේ හැකියාව ඇති ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක හෝ ලවා සේරිවාණිජ ජාතකයේ ඡායා පිටපත කියැවීමට සලස්වන්න

- හැකි නම් ශ්‍රැති ගෝචර රටාවෙන් කොටසක් හෝ කියවීම වුව ද වඩාත් ගැළැපේ.
- සිසුන් සියලු දෙනාට ම නිශ්ශබ්ද ව එය ශ්‍රවණය කිරීමට, උපදෙස් දෙන්න.
- ඉන් පසු එහි දැක්වෙන කථා වස්තුව පිළිබඳ සිසුන් හා සාකච්ඡාවක යෙදෙන්න.

**පියවර 02**

ඉන් පසු කදා වළලු නාට්‍යයේ පිටපත චරිත ආශ්‍රයයෙන් කියැවීමට සලස්වන්න. (එක් එක් චරිතය සඳහා සිසුන් ගේ කැමැත්ත පරිදි සිසුන් යොදාගන්න.)

- පන්තියේ සෙසු සිසුන් ගායක කණ්ඩායම ලෙස සම්බන්ධ කර ගන්න.

- ගායනය කරන කොටස්වල තාලය පිළිබඳ (ශ්‍රැතිය, ලය, රිද්මය) සුවිශේෂ ව අවධානය යොමු කිරීමට පහසුකම් තිබේ නම් සිසුන් එසේ යොමු කරන්න.
- සම්පූර්ණ නාට්‍ය පිටපත කියවා අවසන් වූ පසු ජාතක කථාවේ එන කථා වස්තුවේත් නාට්‍ය පිටපතෙහි දැක්වෙන කථා වස්තුවේත් සමාන - අසමානකම් පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න.

- ඉන් පසු නාට්‍ය පෙළෙන් ඉස්මතු ව පෙනෙන තේමාව පිළිබඳ අවධාරණය කරන්න.
- කථා වස්තුව පිළිබඳ සාකච්ඡා කිරීමේ දී පහත දැක්වෙන කරුණු ගැන අවධානය යොමු කරන්න.
- සේරිවාණිජ ජාතකයේ එන කථා වස්තුව සම්පූර්ණයෙන් ම මුල මැද අග සහිත ව සිදුවීම් පෙළක් සේ රචනා වී තිබීම.
- එහෙත් ජාතක කථාවේ දැක්වෙන සියලු ම සියුම් තැන් නාට්‍යය පෙළට ඇතුළත් කළ නොහැකි බව.
- ජාතක කථා සාහිත්‍යය මගින් බෝධිසත් චරිතයේ උත්තම ගුණාංග ප්‍රබල ලෙස මතුකොට දැක්වීමට දරන උත්සාහය ජාතක කථාව මඟින් මෙන් ම නාට්‍යයෙන් ද පෙන්වා දෙන ආකාරය.
- කච්ඡපුට වෙළෙන්දාගේ මාන ව හිතවාදී ගුණයත් අවංක භාවයත් ජාතක කථාව මඟින් මෙන් ම නාට්‍යයෙන් ද මනාව පිළිබිඹු වීම.
- සේරිවාණිජ වෙළෙන්දා රන්තලිය වංචාවෙන් ලබාගැනීමට උත්සාහ දැරීමේ දී උත්තම වූ බෝධිසත්ත්ව ගුණාංගයන් ගෙන් පරිපූර්ණ කච්ඡපුට වෙළෙන්දා දුක්පත් සිටු දියණියනටත් සිටු පවුලේ මිත්තණියනටත් සාධාරණය ඉටු කරන අයුරු
- නාට්‍යයෙන් මෙන් ම ජාතක කථාවෙන් ද අවංකත්වයේ උත්තම ස්වභාවයත් වංක බව, මුසාවාදය, දැඩි මසුරුකම ආදි දුර්ගුණයන්හි අධම බවත් ඉස්මතු වීම.
- සාහිත්‍යකරුවා සිය ගද්‍ය සාහිත්‍යය එනම් ජාතක කථා, දෘශ්‍ය කාව්‍ය (නාට්‍ය) මඟින් සමාජයේ පැවැත්ම උදෙසා වටිනා තේමාවක් ඉස්මතු වන අයුරින් සිය නිර්මාණ දායකත්වය සමාජයට දායාද කරන ආකාරය එමගින් මැනැවින් පිළිබිඹු වීම.

**පියවර 03** ඉහත කරුණු සාකච්ඡා කිරීමෙන් පසු සිසුන්ට ජාතක කථාවේත් නාට්‍යයේත් දැක්වෙන කථා වස්තුව සාරාංශ කර ලිවීමට අවස්ථාව ලබාදෙන්න.

උදා: ''බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩවසන සමයේ පසුබට වූ වීර්යය ඇති භික්ෂුවක් උදෙසා සේරිවාණිජ ජාතකය දේශනා කොට ඇත. එක්තරා භවයක සේරිව රාජ්‍යයෙහි වෙළෙඳ කුලයක උපන් බෝසතුන් කච්ඡපුට යැයි නම් ඇති ව සේරිවාණිජ නම් වෙළෙඳකු සමඟ අන්ධපුරයේ දෙමඟකින් ගොස් බඩු විකුණන අතරතුර සේරිවාණිජ එක් දුක්පත් සිටු දියණි කෙනෙකුට කදා වළලු විකිණීමට ගත් උත්සාහයේ දී දුක්පත්කම නිසා මුදල් නැති බැවින් තම පරපුරේ පළමු මහ සිටාණෝ දන් වළඳා ඉවත් කොට මලගැසී ගිය රන්තලිය දී වළලු ගැනීමට තැත් කළ අවස්ථාවේ එය ගනරන් බව දැක නොවටිනා බව කියමින් ඉවතට වීසි කොට උපායකින් එය හැරගනිමි යි සිතා ඉවත් ව ගිය අතරේ එම සිටු මාළිගයට පැමිණ බෝසත් කච්ඡපුට වෙළෙන්දා එම රන්තලියට තමා සතු සියලු කහවණු හා භාණ්ඩ ද දී එය රැගෙන ගියේ ය. නැවත ආපසු පැමිණි සේරී වෙළෙන්දා සිදු වූ දේ දැන ඔරුවෙන් ගඟෙන් එගොඩ වෙමින් සිටි කච්ඡපුට වෙළෙඳාට සාප කරමින් ළය පැළී ද්වේෂ සහගත ව මිය ගියේ ය. එතැන් පටන් සසරේ විවිධ භවවල දී රැගෙන ආ වෛරය සිද්ධාර්ථ ගෞතම බුදුන් සමය තෙක් රැගෙන ආ අයුරු ජාතක කථාව සංක්ෂිප්ත ව දක්වයි.

**පියවර 04** ජාතක කථාව හා නාට්‍යය යන සාහිත්‍යාංග දෙකෙන් ම ලබාදෙන තේමා පෙළ ගැස්වීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න. (පැවරුම සඳහා ලිඛිත අභ්‍යාසයක් ලෙස දක්වා ඇති බැවින් මෙම අවස්ථාවේ දී වාචික ව සිසුන් හා සාකච්ඡා කරන්න)

උදා: ජාතක කථාව

- සියල්ලන් නොපසුබට වීර්යයෙන් කටයුතු කළ යුතු වීම.
- අප්‍රමාද ව කටයුතු කිරීමෙන් ජීවිතයේ අභියෝග ජයගත හැකි ය.
- වඩාත් අවංකව කටයුතු කිරීමෙන් විවිධ ප්‍රතිලාභ අත්වන බව.
- ධනය හා බලය අහිමි වූ විට සිටුවරුනට පවා අනුනට අත පා ජීවත් වීමට සිදු වේ.
- අධික තෘෂ්ණාව විනාශයට හේතු වේ.
- අනුන් රැවටීමට උත්සාහ ගැනීමෙන් තමා ද රැවටීමට ලක් වේ.
- තැනට සුදුසු නුවණින් ක්‍රියා නොකළ විට පසුතැවීමට සිදු වේ.
- වෛරයෙන් වෛරය නොසංසිඳෙයි.
- ප්‍රඥාවන්තයන් ගේ උපදෙස් අනුව ක්‍රියා කිරීමෙන් ජීවිතයට සැප ළඟා කරගත හැකි වේ.

උක්ත තේමා රැසක් සේරිවාණිජ ජාතකයෙන් හෙළි වුව ද එක් ප්‍රබල තේමාවක් එමඟින් ඉස්මතු වන බව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**එනම් අධික තෘෂ්ණාවෙන් කටයුතු කිරීමත් ස්ථානෝචිත ප්‍රඥාව නොමැති වීමත් පුද්ගල විනාශයට හේතුවක් වේ.**

නාට්‍යය : ජාතක කථාවේ මෙන් සියලු සිදුවීම් නාට්‍යයට ඇතුළත් කළ නොහැකි බව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එහෙත් සේරිවාණිජ ජාතකයේ අතීත කතාවේ එන වෙළෙඳුන් දෙදෙනා හා දුක්පත් සිටු පවුල හා බැඳුණු සිදුවීම් ප්‍රබල ලෙස නාට්‍යයේ කථා වස්තුවට පාදක කොට ගෙන ඇති අයුරු විමසමින් සිසුන් සමඟ පිළිසඳරක යෙදෙන්න. එමඟින් ද ජාතක කථාවේ දැක්වෙන පරිදි උක්ත තේමාව මැනවින් ඉස්මතු වන අයුරු පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ජාතක කථාව හා නාට්‍ය පිටපත කියැවීමට පෙලඹෙයි.
- ජාතක කථාවේ එන කථා වස්තුව සාරාංශගත කර ලියයි.
- ජාතක කථාවෙන් පිළිබිඹු වන ප්‍රබල තේමාව / තේමා ලියා දක්වයි.
- නාට්‍යයේ කතා වස්තුව සාරාංශ ගත කරයි.
  එමඟින් ප්‍රකට වන තේමාව ජාතක කථාවේ තේමාව හා සසඳයි.

පැවරුම :

- සේරිවාණිජ ජාතක කතාවේ ඇතුළත් එහෙත් 'කඳා වළලු' නාට්‍යයේ ඇතුළත් නොවන අවස්ථා හා සිද්ධි පෙළගස්වන්න.
- ජාතක කථාවේත් කඳා වළලු නාට්‍යයේත් කථා වස්තු සාරාංශගත කොට ලියා දක්වන්න.
- නාට්‍යයෙන් හා ජාතක කථාවෙන් ඉස්මතු වන ප්‍රධාන තේමාව ලියා දක්වන්න.
- ප්‍රධාන තේමාවට අමතර ව නාට්‍ය පෙළෙන් හා ජාතක කථාවෙන් ඔබට ආදර්ශයට ගත හැකි අනුතේමා පෙළ ගස්වන්න.

නිපුණතාව 5.0 : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.1** : නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින් සාමූහික රසවින්දනයෙහි යෙදේ.

**ක්‍රියාකාරකම 5.1.2** : සංවාද, ශෛලිය, චරිත හා ගැටුම් අවස්ථා ඇසුරින් කදා වළලු නාට්‍යය රස විඳීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි

**ඉගැනුම් පල** :
- කදා වළලු නාට්‍යයේ ශෛලිය අධ්‍යයනය කරයි.
- එම නාට්‍යයේ සංවාද පිළිබඳ ව විමසා බලයි.
- නාට්‍යයේ චරිත හා චරිතවල ස්වභාවය විමසයි.
- කදා වළලු නාට්‍යයේ ගැටුම නාට්‍යයෙහි සමස්ත සාර්ථකත්වය කෙරෙහි කරන බලපෑම සොයා බලයි.
- උක්ත කරුණු පදනම් කොටගෙන නාට්‍යය රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- කදා වළලු නාට්‍යයේ දෘශ්‍යපට (සීඩී/ඩීවීඩී)
- කදා වළලු නාට්‍යය පෙළ

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01** සිසුන් සියලු දෙනාට ම නාට්‍යය නැරඹීමට අවස්ථාව ලබාදෙන්න. වේදිකාවක් ඉදිරිපිට සජීවව නැරඹීමට අවස්ථාවක් නො ලැබේ නම් දෘශ්‍ය පට ආධාරයෙන් හෝ නාට්‍ය නැරඹීමට අවස්ථාව සලසන්න. එසේ ම නාට්‍ය පෙළ හොඳින් කියවා ගැනීමට සලස්වන්න.

- නාට්‍ය නැරඹීමෙන් පසු එහි දක්වෙන විවිධ අවස්ථා හා සිද්ධි පාදක කරගනිමින් නාට්‍ය ශෛලීය පිළිබඳ සරල හැඳින්වීමක් කරන්න.
- ලෝකයේ පවතින යථා ස්වභාවයට අනුව නාට්‍යයේ අභිනය භාවිත කිරීම ලෝකධර්මී නාට්‍යවල ස්වභාවය බවත් ලෝකයේ ස්වභාවයට වෙනස් අයුරින් සතර අභිනය භාවිත කිරීම නාට්‍යධර්මී නාට්‍යවල ස්වභාවය බවත් පැහැදිලි කරන්න. එනම් ලෝකයේ සාමාන්‍ය ස්වභාවය නාට්‍යානුරූපී අයුරින් නිරූපණයට සතර අභිනය භාවිත කිරීම ය.
- මනමේ ආදි නාට්‍ය ද උදාහරණයට ගනිමින් එහි ඇති නාට්‍යධර්මී නාට්‍ය ලක්ෂණ පැහැදිලි කරන්න. ඒ අනුව කදා වළලු නාට්‍යයේ ඇති නාට්‍යධර්මී ලක්ෂණ මතු කොට දක්වන්න.
  උදා: අතීත කෙනෙකු මඟින් නාට්‍යයේ කථා වස්තුව ප්‍රකාශ කොට නාට්‍යයට පිවිසීම
- සේරිවාණිජ වෙළෙන්දා ගීතයක් ගයමින් වළලු කදක් ගෙන වේදිකාවට පිවිසීම ආදී අදාළ තැන් උපුටා දක්වන්න.
- එසේ ම ලෝකධර්මී නාට්‍ය ශෛලියට උදාහරණ කීපයක් දක්වා කදා වළලු නාට්‍යයේ ඇති එබඳු අවස්ථා නිදසුන් සේ දක්වන්න.
- ඇතැම් නාට්‍යවල ලෝකධර්මී හා නාට්‍යධර්මී යන ශෛලීන් දෙකෙහි ම ලක්ෂණ දක්නට ලැබෙන බව සිසුන්ට අවධාරණය කරන්න. එහෙත් ලෝකයේ ඇත්තේ ලෝකධර්මී හා නාට්‍යධර්මී යන ශෛලී දෙක පමණක් බව ද පැහැදිලි කරන්න.
- ඒ අනුව කදා වළලු නාට්‍යයේ ද ලෝකධර්මී හා නාට්‍යධර්මී යන නාට්‍ය ශෛලි දෙකෙහි ම ලක්ෂණ ඇතුළත් වන අතර මෙම නාට්‍යයේ බහුල ව දක්නට ලැබෙන්නේ නාට්‍යධර්මී ලක්ෂණ බැවින් එය නාට්‍ය ධර්මී නාට්‍යයක් ලෙස වුව ද නම් කළ හැකි ය.

- නාට්‍යයක ශෛලිය පිළිබඳ අවබෝධය ලබාගැනීම සඳහා නාට්‍ය පෙළ අධ්‍යයනයේ දී හා නාට්‍ය නැරඹීමේ දී එම නාට්‍ය සඳහා භාවිත කොට ඇති සංවාද, අංග රචනය, වේශභූෂණ, පසුතල නිර්මාණ ආදි සියලු අභිනය පිළිබඳ අවබෝධයෙන් හා අවධානයෙන් සිටිය යුතු බව සිසුන්ට අවධාරණය කරන්න.
- ඒ අනුව කදා වළලු නාට්‍යයේ පහත දක්වෙන ලක්ෂණ දක්නට ලැබෙන බව එක් එක් උදාහරණ ගෙන පැහැදිලි කරන්න.
    1. සංවාද භාවිතය නාට්‍ය ශෛලි දෙකටම අනුව යොදාගෙන තිබීම.
    2. රංග භූමි අලංකරණ භාවිත නොකිරීම
    3. අංග රචනා, නාට්‍යධර්මී ශෛලියට ගැළැපෙන අයුරින් කර තිබීම.
    4. ජාතක කථාවක් පදනම් කොටගත් නාට්‍යයක් බැවින් ඊට අදාළ පරිදි වේෂ නිර්මාණය කර තිබීම.
    5. නාට්‍යධර්මී ලක්ෂණ හා ලෝකධර්මී ලක්ෂණ ප්‍රකට කරන සංවාද භාවිතය

**පියවර 02** නාට්‍යයේ සංවාද භාවිතය පිළිබඳ ව සිසුන් හා සාකච්ඡාවක යෙදෙන්න.

- ඕනෑ ම සාහිත්‍ය නිර්මාණයක් සාර්ථක වීම සඳහා එයට යොදාගන්නා භාෂාව ප්‍රබල දායකත්වයක් ලබදෙන බවත් භාෂාව මඟින් පාඨක හා ප්‍රේක්ෂක සිත් තුළ ප්‍රබල සංකල්පය රූප මැවිය හැකි බවත් පෙන්වා දෙන්න.
- කදා වළලු නාට්‍ය පෙළ කියවීමේ දීත්, නාට්‍ය සජීවව රසවිඳීමේ දී ත් එබඳු අවස්ථා දැකිය හැකි බව උදාහරණ මගින් පෙන්වා දෙන්න.

  උදා: කච්ඡපුට ගඟින් එතෙර වීමේ දී ප්‍රේක්ෂක මනස තුළ ගඟක් නිර්මාණය වීම.

  නාට්‍ය ආරම්භයේ සේරිවාණිජ වෙළෙඳා ගයන සින්දුව

  ''අතට වළලු ද පයට ගිගිරි ද ලා ගනී
  කිඳුරඟන සොබනා
  වනේ සිඳුඹුවො කඩා මල් පෙති
  වරල සරසා ගනිති නිතිනා
  සඳුන් කුංකුම ගතේ තවරා සුවඳ වේ අබිසාරිකාගනා
  පියවි සුන්දර රූ සපුව වුව ලකළ වේ ලූ සඳ පලඳනා .........''

  මෙම ගීතය ගයන විට සුන්දර ළඳකගේ රූ සපුව ප්‍රේක්ෂක මනසේ චිත්‍රණය කරවීම මෙම ගීතයේ යොදාගත් වචන මඟින්, එනම් භාෂාව මඟින් ගම්‍යමාන කරවීමට රචකයා සමත් වී ඇත. නව යොවුන් වියේ පසු වන දූරියක් සුන්දර ඇඳුම් ආයිත්තම් පැලැඳීමට දක්වන රුචිය , නාට්‍යකරුවා යොදාගත් සංවාද මඟින් මැනවින් ප්‍රකට කරයි.

උදා: සේරිවාණිජ වළලු පෙන්නූ අවස්ථාවේ වළලු දාගෙන සිටු දුව සින්දුව කියමින් නටන අයුරු

සිටුදුව : මගේ අත් දෙකේ පාළුවට මොනව හරි දාගත්තොත් හොඳ යි අත්තම්මේ. මට මේ රතු වළලු කුට්ටම ඇත් නම් කියලා හිතෙනවා.

- සේරිවාණිජ වෙළෙඳා සිටුදුව හා මිත්තණියන් රවටා රන්තලිය ගැනීමට යටි සිතින් ආසා කොට එය නොවටිනා බව පවසන අවස්ථාවේ දී නාට්‍යකරුවා යොදාගත් සංවාද එම චරිතයේ කපටි ස්වභාවය මනා ව ප්‍රකට කරයි.

සේරිවාණිජ : කෝ බලන්න, පොඩ්ඩක් (තලිය දෙස හොඳින් බලා එය රත්තරන් බව දැන මඳක් සිනාසී, නැවත දේවිය දෙස බලා) අපෝ ...... අතේ දූලිත් ගෑවුණා. එහෙම පිටින් ම කළු ගැහිලා (තලියට අත ගසා) අනික, පුපුරලා නේ මැද්දෙන් ම.

සේරිවාණිජ : කවුරු කෑවත් මට නං වැඩක් නෑ සිටු දේවිය. (තලියට ගසා තද කොට ) කවුද මේක රත්තරන් කිව්වේ. මේක මහ බාල ලෝහ වර්ගයක් නෙ.)

- දෙවන වර පැමිණි කච්ඡපුට වෙළෙන්දා හා සිටු දියණියන් අතර කෙරෙන කතාබහ සඳහා නාට්‍යකරුවා යොදාගත් සංවාද. එම චරිතයේ, බෝසත් ගුණ ප්‍රකට කරන බව සිසුන්ට පෙන්වා දෙන්න. සිටු දියණියනුත්, මිත්තණියනුත් සේරිවාණිජ වෙළෙඳුට මෙන් ම කච්ඡපුට වෙළෙඳුට ද රන්තලිය පෙන්නවූ අවස්ථාව

කච්ඡපුට : මං කියන්න ද ඇත්ත ? මේ තලිය මම ගෙනයන එක යුතු නෑ. මේක සිටු ගෙයට ම අයිති පුරාණ බඩුවක්. මෙහේ ම තියෙන්න අරින එක තමයි හොඳ.

මිත්තණිය : (සිනාසී) පොඩි ළමයින්ට තේරෙන්නේ නැනේ. හුඟක් වටිනව කියලයි එයාගෙ කල්පනාව

කච්ඡපුට මම කියපු එක තේරිලා නෑ මගේ හිතේ. මේක හැබෑ ම වටිනා තලියක්. මේ කළු ගැහිලා තිබුණට කළවම් නොකරපු හොඳ ම රත්තරං මේකට ගෙවන්න මා ගාව සල්ලි නැති නිසයි ගෙනියන එක යුතු නෑ කිව්වේ.

- නාට්‍යයේ එන පරිදි එක හා සමාන චරිත දෙකක් එහෙත් ප්‍රතිවිරුද්ධ චරිත ලක්ෂණ පෙන්වන අයුරින් නිර්මාණය කිරීම සඳහා ඒ ඒ චරිතයට ගැළපෙන අයුරින් සංවාද යොදා නාට්‍ය රචනා කොට තිබීම නාට්‍යයේ නිර්මාණශීලී ගුණය ප්‍රකට කරන බව සිසුන්ට පෙන්වා දෙන්න
- නාට්‍යයේ එබඳු සංවාද යෙදූ අවස්ථා බහුල බැවින් ඒවා උදාහරණයට ගෙන සාකච්ඡා කරන්න.

**පියවර 03** කදා වළලු නාට්‍යයේ සමස්ත සාර්ථකත්වය කෙරේ එහි යොදාගත් චරිත සියල්ල එක සේ දායකත්වයක් සපයන අයුරින් නිර්මාණය වී ඇති අයුරු ඒ ඒ චරිත උදාහරණයට ගනිමින් පෙන්වා දෙන්න.

- අතීත වක්තෘගේ ගායනයෙන් ආරම්භ වන නාට්‍යය අවසන් වන්නේ ද ඔහුගේ ගායනයෙනි.
- ධනයෙන් පිරිහුණු සිටු පවුලක අසරණ වූ මිත්තණි කෙනෙකු හා මිනිබිරියක වන සිටු දුව යන චරිත.
- තත්කාලීන වාණිජ අර්ථක්‍රමය සංකේතවත් කරමින් ගෙන් ගෙට ගොස් විසිතුරු බඩු විකුණන වළලු වෙළෙඳුන් දෙදෙනාගේ චරිත
- ජාතක කථාවක කථා වස්තුවක් නාට්‍යයට නැඟීමේ දී එහි එන සියලු සිදුවීම් හා අවස්ථා ඇතුළත් කිරීමට නොහැකි බැවින් අතීත ජාතක කථාව සූචය කොට දක්වීමටත් ජාතක කතාවේ පූර්වාපර සන්ධි ගැළැපීමටත් (අතීත අනාගත චරිත ගැළපීම) අතීත වක්තෘගේ චරිතයෙන් ප්‍රබල දායකත්වයක් ඉටු වන පරිදි නාට්‍යයට එම චරිතය ගළපා තිබීම පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න.

- ධනයෙන් පිරිහුණු කල්හි රජවරුන්ට, සිටුවරුන්ට පවා අන්‍යයන්ට අතපෑමට සිදු වේ ය යන ධර්මතාව ප්‍රකට කරවමින් සිටු පවුලේ ඉතිරි ව ඇති සාමාජිකයන් දෙදෙනාගේ චරිත නාට්‍යයේ විකාශයට ප්‍රබල දායකත්වයක් දරන අයුරින් සමස්ත නාට්‍ය පුරා ම විකාශනය කර තිබීම නාට්‍යයේ සාර්ථකත්වයට හේතුවක් වී ඇත.

උදා: සිටුදුව : (දුක්මුසු ස්වරයකින්) අපි සිටු කුලේ ඇත්තෝ වුණාට දැන් නම් හොඳට ම දුප්පත්. ගිය අවුරුද්දේ නීලවාහිනී ගඟ ගලලා තාත්තයි, අම්මයි සහෝදරයෝ තුන්දෙනයි ඔක්කොම මළා. තාත්තා රැස් කරපු දනේත් එහෙම පිටින් ම නැතිවුණා. මම අහල පහල ගෙවල්වල මෙහෙ කරලා හම්බ කරන එකකින් තමයි අපි දෙන්නා යන්තම් ජීවත් වෙලා ඉන්නේ.

- රූසපුව අලංකාර කර ගැනීම කෙරේ අවධානය යොමු කරන නව යොවුන් වියට එළඹෙන දුවක ගේ අපේක්ෂාවන් කදා වළලු නාට්‍යයේ නාට්‍ය වින්‍යාසයට මනා පිටිවහලක් වේ.
- සිටු දුව කෙසේ හෝ වළලු ලබා ගන්නට දරන උත්සාහය නිසා නාට්‍ය ඉදිරියට ගලායාමට සලස්වන නාට්‍යකරුවා එම චරිතය නාට්‍යයේ සාර්ථකත්වය කෙරෙහි ප්‍රබල දායකත්වයක් ලබාදෙන චරිතයක් ලෙස නිර්මාණය කර ඇත.
- නාට්‍යයේ ආරම්භයේ සිටු දුව සේරිවාණිජ වෙළෙඳුගේ ගීතයට සවන් දීම, ඉන් පසු ඔහුගෙන් වළලු ලබාගැනීමට තැත් කිරීම රන්තලිය ලබා දී හෝ වළලු ලබා ගැනීමට ගත් උත්සහය ව්‍යර්ථ වීම. දෙවනුව පැමිණි කච්ඡපුට වෙළෙන්දාට රන් තලිය දී වළලු ලබාගැනීම, ඉන් ලැබූ වළලු අතේ දමා අහිංසක යුවතියක මෙන් සතුටු වීම, නාට්‍යයේ විකාශයට දායක වූ චරිත දෙකක් අතර ප්‍රබල ගැටුමක් ඇති වන අවස්ථාවේ දී තම බලාපොරොත්තු සඵල වීමෙන් සිටු දුව හා මිත්තණිය චිත්ත සන්තුෂ්ටියට පත් ව ඔවුන්ට තිබුණු ප්‍රබල ගැටලුව නිරාකරණය වීම ආදි අවස්ථා සියල්ල ඉතා සාර්ථක ව නාට්‍ය කරුවා කදා වළලු නාට්‍ය මඟින් පෙන්වා දෙයි. ඒ අවස්ථාවලට අදාළ කරගත් චරිත වඩාත් සාර්ථක ව එම අවස්ථාවට ප්‍රේක්ෂකයා හමුවට ගෙන ඒම චරිත නිරූපණයේ විශිෂ්ට අවස්ථාවක් වේ.
- අවස්ථාවට උචිත නුවණ භාවිත නොකළ කූට වෙළෙන්දකු වූ සේරිවාණිජ ද්වේෂයෙන් ක්‍රියා කරන ආකාරයත් ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා අවංක බවිනුත් කටයුතු කළ කච්ඡපුට වෙළෙන්දාට ධනවතකු වීමට මඟපෑදීමත් (කඩයක් දමා ගැනීමට මඟ පෑදීම) නාට්‍යයේ සමාප්තිය සමඟම නාට්‍යකරුවා ප්‍රේක්ෂකයාට දැනවීමට ගත් උත්සාහය සාර්ථක ය.
- ඒ ඒ චරිතවලට ගැළපෙන අයුරින් නිර්මාණය කරන ලද වේෂභූෂණ හා නාට්‍යෝපකරණ පිළිබඳ ව ද සිසුන් හා සාකච්ඡා කරන්න.
- එසේ ම නාට්‍යයේ එන ගීත හා සංවාද ආදිය නාට්‍යයේ සාර්ථකත්වයට බලපෑ අයුරු සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කදා වළලු නාට්‍යයේ සංවාද, නාට්‍යයේ සාර්ථකත්වයට බලපෑ අයුරු සාකච්ඡා කරයි.
- නාට්‍යයේ සාර්ථකත්වය සඳහා නාට්‍යකරුවා යොදාගත් රංග ශෛලිය විමසා බලයි.
- නාට්‍යයේ එන ගැටුම් අවස්ථා නම් කරයි.
- නාට්‍ය වස්තුව ප්‍රේක්ෂකයා හමුවට ගෙන ඒමට දායකත්වයක් දැක්වූ චරිතවල ලක්ෂණ විමසයි.
- නාට්‍ය පෙළ කියවීමෙන් හා නැරඹීමෙන් එම නාට්‍යයේ සමස්ත සාර්ථකත්වය පිළිබඳ ව සාකච්ඡා කරයි.

පැවරුම :

- කදා වළලු නාට්‍යයට දායක වූ චරිත නම් කරන්න.
- නාට්‍යයේ එක් එක් චරිත ඇසුරින් නාට්‍ය පෙළ කියවන්න.
- කදා වළලු නාට්‍යයේ ගැටුම් අවස්ථා නම් කරන්න.
- නාට්‍යයට අදාළ ඒ ඒ චරිතයේ චරිත ලක්ෂණ පෙළ ගස්වන්න.
- නාට්‍යයට අදාළ කරගත් රංග උපකරණ නම් කරන්න.

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2** : නිර්දිෂ්ට පෙළ හෝ වෙනත් සුදුසු පෙළක් හෝ නිෂ්පාදනයක් ලෙස රස විඳියි.

**ක්‍රියාකාරකම 5.2.1** : කදා වළලු නාට්‍යය නරඹමු. (වේදිකාවේ හෝ සංයුක්ත තැටි මඟින් හෝ )

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගැනුම් පල** :
- නාට්‍යය රසවින්දනය සඳහා එය නැරැඹීම අත්‍යවශ්‍ය කරුණක් බැවින් ඒ සඳහා උපක්‍රම සැලසුම් කරයි.
- සජීව ව නාට්‍ය දර්ශනයක් සඳහා සූදනම් වන රංග ශාලාවක් පිළිබඳ තොරතුරු ගවේෂණයක යෙදෙයි.
- නේපථ්‍යාගාරය, වේදිකාව, ප්‍රේක්ෂකාගාරය, වේදිකා තිර, වේදිකා ආලෝකකරණය ආදි අංග පරිහරණය පිළිබඳ අත්දැකීම් ලබයි.
- නාට්‍ය නැරැඹීම සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රයක ස්වභාවය පිළිබඳ විමසා බලයි.
- ප්‍රේක්ෂාගාරයේ නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයා පිළිබඳ අධ්‍යයනය කරයි.
- ප්‍රේක්ෂාගාරයක, නාට්‍ය වේදිකාවක, ප්‍රේක්ෂකයා තුළ පැවතිය යුතු විනය හා සංවරය ආදිය පිළිබඳ අත්දැකීම් ලබයි.
- සජීවනාට්‍ය දර්ශනයක් නැරැඹීමෙන් ලැබිය හැකි ආස්වාදය ප්‍රගුණ කරයි.

**ගුණාත්මක යෙදැවුම්** :
- සජීව ව නාට්‍යයක් නැරැඹීම සඳහා අවස්ථාවක් නොමැති නම් පමණක් භාවිත කිරීම සඳහා දෘශ්‍ය පටයක් (CD/DVD )

**ක්‍රියාකාරකම සැලැසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- කදා වළලු නාට්‍ය දර්ශනයක් නරඹීම සඳහා පහසුවෙන් යා හැකි රඟහලක් පිළිබඳ සොයා බලන ලෙස ළමයින්ට උපදෙස් දෙන්න.
- ඒ සඳහා පුවත් පත් /අන්තර්ජාලය/මිතුරන්/ නාට්‍ය නිෂ්පාදකයින් ආදීන්ගෙන් තොරතුරු ලබාගත හැකි බව සිසුන්ට දන්වන්න.
- ඔවුන් තොරතුරු සොයාගෙන පැමිණි පසු කණ්ඩායම් නායකයකු පත් කර නාට්‍ය නැරඹීමට යාමේ චාරිකාව සංවිධානය කිරීමට සිසුන්ට භාර දෙන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් කීපයකට වෙන් කර පහත දැක්වෙන කාර්යයන් ඔවුන් අතර බෙදා දෙන්න. (ගුරුවරයාගේ පූර්ණ අධීක්ෂණය මත)

1. නැරඹීමේ කාර්යය සඳහා යාමට විදුහල්පතිගෙන් අවසර ගැනීම, දෙමාපියන් ගෙන් අවසර ලිපි ගෙන්වා ගැනීම.
2. ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම/ ගමනාගමන පහසුකම් සලසා ගැනීම.
3. සිසු විනය පවත්වා ගැනීම හා කණ්ඩායම් සකස් කර ගැනීම.
4. නාට්‍ය නරඹා වාර්තා සකස් කිරීම.
5. රංග ශාලා පහසුකම් පාසලින් දුරබැහැර ඇති විට ආහාර ආදි පහසුකම් සලසා ගැනීම.

එමඟින් නාට්‍ය රසවින්දනයට අමතර ව සිසුන්ට නායකත්වය ගෙන කටයුතු කිරීමට ද ගුරුවරයාට අවස්ථාවක් සලසා දිය හැකි ය. නාට්‍යය නැරඹීමට යාමට පෙර සිසුන්ට පහත දැක්වෙන උපදෙස් ලබාදෙන්න.

1. නාට්‍ය වේදිකාවක අංග පිළිබඳ නිරීක්ෂණය කර වාර්තා තබාගන්න.
2. රංගාලෝකය පිළිබඳ විමසිලිමත් වන්න.
3. නාට්‍ය ආරම්භ කරන අවස්ථාව අවසන් වන අවස්ථාව ආදිය පිළිබඳ අවධානය යොමු කරන්න. (ආරම්භය හා අවසානය සටහන් කරන අන්දම)
4. නාට්‍යයේ පාත්‍රවර්ගයා ගේ වේශභූෂණ පිළිබඳ අවධානය යොමු කරන්න.
5. නළු - නිළියන්ගේ රූපණය, සංවාද භාවිතය සංගීතය ආදි අංග පිළිබඳ අවධාරණය කරන්න.

6. ප්‍රේක්ෂාගාරයේ ස්වරූපය පිළිබඳ අධ්‍යයනය කරන්න.
7. ප්‍රේක්ෂක ප්‍රතිචාර පිළිබඳ විමසා බලන්න.
8. නේපථ්‍යාගාරයේ කාර්යභාරය අධ්‍යයනය කරන්න. (ගුරුවරයා මේ සඳහා නාට්‍ය නිෂ්පාදකයා සමග එකඟතාවක් ඇති ව කළ යුතු ය)
9. එහි දී නළු - නිළියන් ගේ අංග රචනා ආදිය පිළිබඳ නිරීක්ෂණය කරන්න.
10. ප්‍රේක්ෂාගාරයේ පිහිටීම පිළිබඳ නිරීක්ෂණයක යෙදෙන්න.
11. වේදිකාවේ (ඉදිරි/පැති/පසු) තිර හා රංගාලෝකය සඳහා භාවිත කරන ලාම්පු ආදිය නිරීක්ෂණය කරන්න.
12. නාට්‍ය ප්‍රවේශ පත්‍රයේ ස්වභාවය නිරීක්ෂණය කරන්න.
    - නාට්‍ය නැරඹීමට යාමට පෙර සිසුන්ට ඒ පිළිබඳ ව උපදෙස් දීම ගුරුවරයා විසින් කළ යුතු ය.
    - විශේෂයෙන් ම නාට්‍යයක් නැරඹීමේ දී ප්‍රේක්ෂකයකු ලෙස කටයුතු කළ යුතු අයුරු පැහැදිලි කළ යුතු ය.
    - ප්‍රේක්ෂකාගාරය තුළ නාට්‍යයක රසය නිසි ලෙස විඳිය හැකි සහෘද ප්‍රේක්ෂකයකු වීම සඳහා අවශ්‍ය විනය පවත්වාගෙන යාම පිළිබඳ ව ගුරුවරයා ලබාදෙන මූලික උපදෙස් සාර්ථක ප්‍රේක්ෂකයකු වීමට සිසුන්ට මඟ පෙන්වනවා ඇත.
    - නාට්‍යය නැරඹීමෙන් පසු සිසුන් ලැබූ අත්දැකීම් පිළිබඳ ව නිර්මාණාත්මක ලේඛනයක් සැකසීමට උපදෙස් ලබාදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යයක් නැරැඹීමට යාමට පෙර ඒ සඳහා සූදානම් විය යුතු අයුරු අත්දැකීමට හසු කරගනී.
- යම් කාර්යයක් සැලසුම් කිරීමට ඉගෙන ගනියි.
- නාට්‍යයක් නරඹන අයුරු අත්දැකීමට හසු කරගනියි.
- නාට්‍ය ප්‍රවේශ පත්‍රයක තිබිය යුතු මූල්‍යමය හා නිර්මාණාත්මක වටිනාකම් පිළිබඳ ව සොයා බලයි.
- සාමූහික කාර්යයන් සඳහා ජීවිත අත්දැකීම් ප්‍රගුණ කරයි.

පැවරුම :

- කදාවළලු නාට්‍යය නැරඹීමේ දී ලද අත්දැකීම් පිළිබඳ ව නිර්මාණාත්මක රචනයක් ලියන්න.
- කදා වළලු නාට්‍යය නරඹා රංග භූමිය, ආලෝකකරණය, වේශභූෂණ, අංග රචනය, රංග වස්ත්‍ර, සංගීතය, ප්‍රේක්ෂකයා, ප්‍රේක්ෂකාගාරය යන අංග පිළිබඳ කෙටි සටහන් ලියන්න.
- විවේකය අර්ථවත් ව ගත කිරීම සඳහා වෙනත් නාට්‍ය නැරඹීම විනෝදාංශයක් ලෙස යොදාගන්න.
- දෘශ්‍ය පටයක් මඟින් නාට්‍ය නැරඹීමේ දී ද පාඩමේ දැක්වෙන කරුණු පිළිබඳ අධ්‍යයනය කිරීමට පහසු වන පරිදි තාක්ෂණික මෙවලම් සූදානම් කරගන්න.

| | | |
|---|---|---|
| නිපුණතාව 5.0 | : | නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියා ප්‍රදර්ශනය කරයි. |
| **නිපුණතා මට්ටම 5.3** | : | නාට්‍ය නිර්මාණය සමස්තයක් වශයෙන් ඇගැයීමට ලක් කරයි. |
| **ක්‍රියාකාරකම** | : | නිර්දිෂ්ට පෙළ (කදා වළලු) රස විඳිමු. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 03 |

**ඉගැනුම් පල** :

- නාට්‍ය පෙළ ඉතා සියුම් ආකාරයෙන් අධ්‍යයනය කරයි.
- නාට්‍යෝචිත අවස්ථා සහිත ජාතක කථා එක්රැස් කරයි.
- ළමා චින්තනය අවදි වන ආකාරය විමසා බලයි.
- ළමා නාට්‍ය පෙළ රචනය කරයි.
- නාට්‍යය නැරඹීමෙන් ජීවිත පරිඥානය ලබයි.

**ගුණාත්මක යෙදැවුම්** :

- නිර්දිෂ්ට නාට්‍යයේ ඡායාරූප
- 'කදා වළලු' නාට්‍ය පිටපතක්

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

**පියවර 01**

- 'කදා වළලු' නාට්‍යයේ ඡායාරූප පෙන්වමින් හා එම නාට්‍යයේ ජනප්‍රිය ගීතය වන ''අතට සමඟ ගායනය කරමින් පාඩමට ප්‍රවේශ වීම උචිත ය.

**පියවර 02**

- නාට්‍යයේ වස්තුව, නාට්‍ය පෙළ හා පසුබිම් වූ තොරතුරු දැනගැනීම පිණිස පහත දැක්වෙන කරුණු ද ඇතුළත් වන සේ සාකච්ඡාවක් මෙහෙයවමින් අදාළ සටහන් ලියා ගැනීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- මෙම නාට්‍යය මුලින් රචනය කර ඇත්තේ ගුවන් විදුලිය නාට්‍යයක් වශයෙනි.

  - 1958.09.06 දින බොරැල්ලේ තරුණ බෞද්ධ සමිති ශාලාවේ දී මුල් වරට කදා වළලු නාට්‍යය රඟ දක්වන ලදි.
  - නාට්‍යයට පාදක ව ඇත්තේ, සේරිවාණිජ '' ජාතකය ය.
  - ජාතකයේ සඳහන් කතා පුවත එලෙසින් ම මුල, මැද, අග සහිත ව 'කදා වළලු' නමින් නාට්‍යයක් ලෙස රචනා වී ඇත.
  - ජාතක කථාවට අදාළ පුවත සියුම් ලෙස අර්ථ විවරණය කිරීම නාට්‍යයෙන් සිදු ව ඇත.
  - බෝධිසත්ත්වයන් ගේ චරිත නාමයෙන් ජාතක කථාව නම් කිරීම බොහෝ විට සිදු වුව ද, මෙම ජාතක කථාව නම් කර ඇත්තේ දුෂ්ට ගති ඇති 'සේරි' නම් වූ වෙළෙන්දා ගේ නාමයෙනි.
  - ''කදා වළලු'' නාට්‍යයෙහි සේරිරිවාණිජ වෙළෙන්දා ගේ චරිතය වඩා ඉස්මතු කර ඇත.
  - ''කදා වළලු'' නිෂ්පාදනයේ දී සේරිගේ චරිතය සඳහා දීප්තිමත් ඇඳුම් යොදාගෙන ඇති අතර, ඔහුගේ ගායනය පවා ඉතා කන්කලු නාද රටාවලින් යුක්ත ව ඇත.
  - නාට්‍යයේ ප්‍රධාන චරිතය හිමි වන්නේ 'කච්ඡපුට' නම් වූ බෝසත් චරිතයට ය.
  - කච්ඡපුට යනු (කක්ෂා + පුට) කිහිල්ලේ පසුම්බිය ගසාගෙන යන අරුතින් යොදාගත් පටබැඳි නාමයකි.

- දුෂ්ට පැවතුම් ඇති පුද්ගලයකු ගේ චරිතය හා ක්‍රියා ඉස්මතු කිරීමෙන්, එවන් චර්යා ප්‍රතික්ෂේප කර, මිනිසුන් යහමඟට යොමු කිරීම නාට්‍යකරු ගේ පරමාර්ථය වන්නට ඇත.

**පියවර 03**

- පාදක සිද්ධි මඟින් ජීවිත පරිඥානය ලැබීමට හැකි පරිදි නාට්‍යය, පෙළ ගස්වා ඇත.
- හදිසි ආපදාහේතුවෙන් තමා සතු ධනය, පවුලේ සාමාජිකයන් අහිමි ව ඉතා දුඃඛිත ලෙස ජීවත් වන මිනිස්සු අද සමාජයේ ද දක්නට ලැබෙති. සුනාමි ව්‍යසනයට ගොදුරු වූ ඇතැමුන් ගේ ජීවිත ඛේදජනක වී ඇති ආකාරය නිදසුන් වේ.
- දුප්පත්, පොහොසත්, ජාතිභේද, කුලභේද වැනි බෙදීම් නොසලකා ළමයින් තුළ බල පවත්නා ආශා අතීතයේ

  මෙන් ම වර්තමානයේ ද නොවෙනස් ව දක්නට ලැබේ.
- කොතෙක් දිළිඳු වුව ද මිනිබිරිය ගේ ආශාව ඉටු කර දීමට මිත්තණියන් ගන්නා උත්සාහ වර්තමාන සමාජයේ දී ද දැකිය හැකි ය.
- වැඩිහිටියන්, සමාජය හා එහි වසන්නන් පිළිබඳ ව දැඩි අවධානයකින් යුක්ත ව සිටින බව මිත්තණියන් ගේ චරිතයෙන් ප්‍රකට කෙරේ.
- කූට වෙළෙන්දකුගේ ගති ලක්ෂණ වන පෙලඹවීම, පරිභව කිරීම, තණ්හාව, වෛරය වැනි ලක්ෂණ 'සේරි' නම් වෙළෙන්දා ගේ චරිතයෙන් මනා කොට ඉස්මතු කර දැක්වෙයි.
- පරමාදර්ශී වෙළෙන්දකුගේ චර්යාව කච්ඡපුට වෙළෙන්දා ගේ හැසිරීම් රටාව මඟින් පිළිබිඹු කරයි.
- අවස්ථා සම්බන්ධයෙහි මනා ගැළපීමක් නාට්‍යයෙහි දක්නට ඇත.
    - අතීත තොරතුරු හෙළිදරවු කරන්නේ අතීත වක්තෘ මඟිනි.
    - කන්කලු ගීත ගායනයක් සමඟින් සේරිවාණිජ වෙළෙන්දා ගේ රංගාවතීර්ණ වීම.
    - ගීතය ඇසී සිටු දියණියන් එතැනට පිවිසීම.
    - වෙළෙන්දා විසින් වළලු මිල දී ගැනීමට දියණියන් පෙලඹවීම.
    - මිනිබිරිය සෙවීම සඳහා මිත්තණියන් ගේ පැමිණීම.
    - තලිය පෙන්වීම හා ප්‍රතික්ෂේප වීම.
    - සිටු දියණියන් අධික චිත්ත සන්තාපයට පත්වීම.
    - කච්ඡපුටගේ පැමිණීම, තලිය හුවමාරු වීම, වළලු සමඟ කහවණු දහසක් ලැබීම. දෑතේ ම වළලු පැළඳගත් සිටු දියණියන් ගායනය සමඟ රංගනය කිරීම.

- සේරිවාණිජ සිටු දියණියන් ගේ ගායනයට එක් වෙමින් එතැනට පිවිසීම.
- සේරිවාණිජ, කච්ඡපුට හඹායාම.

- නාට්‍යය තුළ සැබෑ මිනිස් චර්යා ප්‍රකට කිරීම දක්නට ලැබේ.
    - ළඳුරියක සතු ගති ලක්ෂණ
    - කූට සහ අවංක වෙළෙඳුන් ගේ හැසිරීම් රටා
    - කරුණාවන්ත මිත්තණියන් ගේ චරිත ස්වභාවය
- වළලු සහ තලිය ප්‍රබල නාට්‍යෝපකරණයන් ව ඇත. වළලු රැඳවූ පලම් දණ්ඩ අවසානයේ දී ආයුධයක් ලෙස භාවිත කර ඇත.
- මුල් නිෂ්පාදනයේ දී ප්‍රධාන වේදිකාවේ සිට ප්‍රේක්ෂකාගාරයට පිවිසෙන දොර දෙසට නෙරා යන සේ අතිරේක වේදිකාවක් යොදා ගන්නා ලදි.
- අවසාන ජවනිකාවේ දී ප්‍රේක්ෂකාගාරයට ම දිව එන සේරිවාණිජ ගේ විලාසය වඩා ප්‍රබල ව නිරූපණය වේ.
- අසත්පුරුෂ චේතනා තමන් ගේ විනාශයට ම හේතු වන ආකාරය නාට්‍ය දෘෂ්ටියෙන් ප්‍රකට කෙරේ.

**පියවර 04**

- පාඩමට අදාළ ව කෙටි, වාචික ප්‍රශ්න ඇසීමෙන් පිළිතුරු ලබාගනිමින් සිසුන් අගය කරන්න.

නිදසුන්:

- සිටු දියණියන් ගේ චරිතය ඔබ දකින්නේ කෙසේ ද?
- මිත්තණියන්, මිණිබිරිය ගේ ඕනෑ එපකම් උදෙසා කටයුතු කරන ආකාරය කෙබඳු ද?
- ඔබේ මිත්තණිය හා මුත්තණුවන් සමඟ ඔබේ සම්බන්ධතාව කෙසේ වේ ද ?
- සේරිවාණිජ ජාතක කථාව නාට්‍යය සඳහා පෙළ ගස්වා ඇත්තේ කෙසේ ද?
- ඔබට හමු වී ඇති වෙළෙඳුන්ගේ විශේෂ ලක්ෂණ විස්තර කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යයේ කථා වස්තුව හා තේමාව ප්‍රකාශ කිරීම
- නාට්‍යයේ දක්නට ලැබෙන චරිතවල ලක්ෂණ විස්තර කිරීම.
- නාට්‍ය වස්තුව, නාට්‍යය සඳහා පෙළ ගස්වා ඇති ආකාරය දැක්වීම.
- නාට්‍යයේ සාර්ථකත්වය සඳහා නාට්‍යෝපක්‍රම භාවිත කොට ඇති අයුරු විස්තර කිරීම.
- නාට්‍යයෙන් මතු කෙරෙන ජීවන දෘෂ්ටීන් හඳුනා ගැනීම.
- එම දෘෂ්ටීන් කාලීන අත්දැකීම් ඇසුරෙන් පැහැදිලි කිරීම.

**පැවරුම** : • කදාවළලු නාට්‍යය (පන්ති කාමර නාට්‍යයක් සේ) නිෂ්පාදනය කිරීම.

**අතිරේක උදව්** : • ජාතක කථා පොත

: • ජාතක කථා ඇසුරු කොට නිෂ්පාදිත නාට්‍ය පෙළ (මනමේ, වෙස්සන්තර, ලෝමහංස, පබාවතී)

## විවිධ සහාය

**වරුණ අලහකෝන්**
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
සෞන්දර්ය අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය - බත්තරමුල්ල

**වයි. එම්. එම් කේ. යාපා**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන කාර්යාලය - මහනුවර

**ජගත් පද්මසිරි**
කථිකාචාර්ය
සෞන්දර්ය විශ්ව විද්‍යාලය

**චාමික හත්ලහවත්ත**
ගුරු උපදේශක
පිළියන්දල කලාපය

**ජනකා භද්‍රාංගනී**
ගුරු සේවය
නිවන්තකචේතිය විද්‍යාලය,
අනුරාධපුර

**කුමාරි එදිරිසිංහ**
ගුරු සේවය
ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, කුරුණෑගල

**රත්නා ලාලනී ජයකොඩි**
ගුරු සේවය
රාජකීය විද්‍යාලය,
කොළඹ

**පරිගණක මෙහෙයුම්** : **ඊ.එල්. පෙරේරා**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සහාය** : **දීපා ශිරෝමනී**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**කේ. පී. පෙරේරා**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය